ISSN 2357-2973

# ජාතික පුස්තකාල විමර්ශන
# தேசிய நூலக நோக்கு
# NATIONAL LIBRARY REVIEW

වෙළුම-01/කලාපය 01 ජනවාරි ජූනි 2014
தொகுதி 01, இலக்கம் 01 ஜனவாரி-ஜூன் 2014
Vol. 01, No. 01, Jan-Jun 2014



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசீய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library and Documentation Services Board

# NATIONAL LIBRARY REVIEW

# ජාතික පුස්තකාල විමර්ශන
# தேசிய நூலக நோக்கு
# NATIONAL LIBRARY REVIEW

වෙළුම 01, කලාපය 01 ජනවාරි - ජූනි 2014

தொகுதி 01, இலக்கம் 01 ஜனவரி – ஜூன் 2014

**Vol. 01, No 01 Jan – Jun 2014**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

**தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை**

**National Library and Documentation Services Board**

# NATIONAL LIBRARY REVIEW

Vol.01, No: 01
January – June 2014

ISSN 2357 – 2973



**Advisory Committee**

Prof. Somarathna Balasooriya
Prof. Piyadasa Ranasingha
Dr. Premila Gamage
Dushyanthi Daniel

**Editors**

W. Sunil
G. D. Amarasiri

**Assistant Editor**

Priyanga Bandara



**Publisher**
Library Research Division
National Library and Documentation Services Board
No : 14, Independence Avenue
Colombo 07.
SRI LANKA

| | | |
|---|---|---|
| Telephone | : | 011- 3056388 |
| Fax | : | 011- 2685201 |
| E- mail | : | research.mail.natlib.lk |
| Web site | : | www.natlib.lk |


***Authors are responsible for the content of their articles published in this journal***

# Contents

**විදෙස් ගත අපේ වෙද පුස්කොළ පොත්** 1

වෛද්‍ය ඩැනිස්ටර් එල්. පෙරේරා

**Disaster Planning in Libraries: A neglected aspect** 25

Dr. K. D. G. Wimalaratne

**ශ්‍රී ලංකාවේ නීතිඥයින්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීමට ඇති නීති පුස්තකාල** 29

පී. එම්. අයෝමි

**ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීම** 59

ජී. ඩී. අමරසිරි

**Commercial versus Open Access: Use of E-Resources Among Engineering Academics in Sri Lanka** 71

Ananda Karunaratna and J. J. G. Arachchige

**කාර්යක්ෂම සේවා සම්පාදනයක් සඳහා විශ්වවිද්‍යාල පුස්තකාල එකතු සංවර්ධන ප්‍රතිපත්තියක වැදගත්කම** 101

ඩබ්ලිව්. එම්. ජේ. කේ. විජේකෝන්

**பேரிடர்களில் (பேரழிவுகளில்) இருந்து பாதுகாத்துக்கொள்ள நூலகங்களில் இருக்கவேண்டிய திட்டம் : கவனத்தில் காள்ளப்படாத விடயம்** 118

மொழிபெயர்ப்பு: கே. கமலாம்பிகை

**Guidelines for Contributors** 129

# Editor's note

Promotion of library and information science education in Sri Lanka is a responsibility of the National Library and Documentation Services Board. Training courses, seminars workshops and other training programmes are made used of to fulfill this responsibility and the 'National Library Review' journal is another source of improving the library science education in Sri Lanka. The Journals in library and information science in Sri Lanka is very limited. This journal includes the scholarly articles compiled by library and information science professionals in Sri Lanka. The knowledge of library and information science in rapidly growing locally and internationally and this journal is very instrumental to bring this knowledge to the library community. The number of librarians and library science students in Sri Lanka is very large. This journal is also helpful to acquire the new knowledge needed for their educational and professional needs. This 'National Library Review' new journal is compiled instead of the 'Library News' journal published by the National Library and Documentation Services Board for the last few decades.

# විදෙස් ගත අපේ වෛද පුස්කොළ පොත්


සාරාංශය

ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් අතර විවිධ විෂයන්ට අයත් ශිල්ප, ශාස්ත්‍ර, කලා දැනුම් සම්භාරයක් අන්තර්ගත පුස්කොළ සඳහා ලැබෙනුයේ ඉතා විශිෂ්ට ස්ථානයකි. එහෙත් විදෙස් ගත ව අපේ අයිතියෙන් බැහැරව ඇති ඒවා අතුරින් දේශිය වෛද්‍ය පුස්කොළ ග්‍රන්ථ බ්‍රිතාන්‍ය වැනි රටවල කෞතුකාගාර සහ පුස්තකාලවල තැන්පත් කොට ඇති බව වාර්තා වේ. මෙම පුස්කොළ පොත් සම්බන්ධයෙන් ප්‍රකාශිත නාමාවලි හා අනෙකුත් වාර්තා අනුව පෙනී යන්නේ දැනට ප්‍රකාශිත මෙන් ම අප්‍රකාශිත දේශීය වෛද්‍ය ග්‍රන්ථ විශාල සංඛ්‍යාවක් ඒ අතර තිබෙන බවයි. එසේ ම සමහර ග්‍රන්ථ කෙතරම් වටිනා අන්තර්ගතයන් සහිත ද යන්න ඒවා පරීක්ෂා නො කොට නිගමනය කළ නො හැකි අතර දුර්ලභ වෛද්‍ය ග්‍රන්ථ ද ඒ අතර තිබිය හැකිය. ශ්‍රී ලංකාවේ ඈත අතීතයේ සිට ම පැවත එන දේශීය වෛද්‍ය ක්‍රමයට අයත් රෝග පරීක්ෂණ ක්‍රම ඖෂධ වට්ටෝරු සහ ඖෂධ ගුණාගුණ ඇතුළත් නිඝණ්ඩු ග්‍රන්ථ ආදිය මෙම පුස්කොළ පොත් අතර බහුලව දක්නට ලැබේ. සමහර පුස්කොළ ග්‍රන්ථවල පිටපත් එකකට වඩා වැඩි ගණනක් ද ශ්‍රී ලංකාව තුළ වාර්තාවන

**පිටපතට වඩා පත් ඉරු සංඛ්‍යාවෙන් වැඩි පුස්කොළ පොත් ද ඒ අතර වේ. පුස්කොළ පොත්වල භෞතික පැවැත්ම සම්බන්ධයෙන් සංරක්ෂණ ක්‍රියාදාමයක් ඉතා අවශ්‍ය වන අතර ඒවා තුළ අන්තර්ගත ශාස්ත්‍ර උරුමයන් අනාගතයට දායාද කර දීම සඳහා යම් බුද්ධිමය සංරක්ෂණ වැඩසටහනක් ද කාලීන අවශ්‍යතාවක් බව අවධාරණය කෙරේ.**

***මූලික පදඃ දේශීය වෛද්‍ය ක්‍රමය , පුස්කොළ පොත් , සාම්ප්‍රදායික දැනුම , සංස්කෘතික උරුමය.***

ඕනෑම රටක දේශීය දැනුම ඒ රටට අයත් ඉතා වටිනා සංස්කෘතික උරුමයකි. ජාතික සම්පතකි. මානව වර්ගයා සතු අමිල වස්තුවකි. සාම්ප්‍රදායික දැනුම, ජනශ්‍රැතිය, දේශීය දැනුම, පාරම්පරික උරුමයන් සහ සංස්කෘතිකමය සම්පත් යන මේ සියල්ල වියුක්තව අර්ථදැක්වීමට වඩා ඒවා ප්‍රජා-පාරිසරික සහසම්බන්ධතාව සහ සමාජගත ජාල මත ගොඩනැගුණු සාමූහික මෙන් ම සංකීර්ණ දැනුම් පේසාවේ ජන උරුමයන් හි සංයුක්ත නියෝජනයකි. විශේෂයෙන් ම අද වන විට සාම්ප්‍රදායික දැනුම් සහ ජාන සම්පත් මංකොල්ලය පිළිබඳ ගැටලුව උද්ගතව ඇත්තේ ද ස්වාභාවික සම්පත්වලින් අනූන එහෙත් ආර්ථික වශයෙන් පසුගාමී රටවල් කෙරෙහි නිෂේධනාත්මකව බලපාන බුද්ධිමය දේපළ නීතිරාමුවක් හරහා වෙළඳ සාධිකාරය ව්‍යාප්ත කිරීම මඟින්ය. මේ සියලු දේ අතර තීරණාත්මක සාධකය වන්නේ දැනුමයි. අතීතයේ දී වරින් වර ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ විවිධ විදේශික හමුදා අපේ දැනුමේ මූලාශ්‍ර වූ පුස්කොළ පොත් වැනසීම හෝ ඒවා අත්පත් කරගැනීමෙන් අනතුරුව තම රටට ගෙනයාම හෝ සිදු කර තිබේ. මේ අතුරින් අප රට තුළ පොළොන්නරු යුගයේ දී මාඝ අතින් සිදු වූ ග්‍රන්ථ සංහාරයත් සීතාවක යුගයේ දී රාජසිංහ රජු සිදු කළ මහා විනාශයත් පුස්කොළ පොත් සම්භාරයේ පරිහානියට හේතු විය. 1505 න් ඇරඹි යුගයේ යුරෝපීය ජාතීන් තුන් වර්ගයක් හා කළ සන්නද්ධ අරගලය අවසන් වූයේ 1815 දී රට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක් බවට පත්වීමෙනි. ඉංග්‍රීසි හමුදා මහනුවර රාජධානිය තුළ සිදු කළ මහා විනාශය නිසා ද පුස්කොළ පොත් විශාල සංඛ්‍යාවක් ජාතියට අහිමි විය. අපේ දේශීය සාමාජික සංස්කෘතික හා ආගමික අනන්‍යතාව

ආර්ථිකය මඟින් ගිලගනු ලැබූ අතර ජන ජීවිතයේ සියලු අංශයන් පුරා ම පැතිරී ගිය බටහිර ආභාසය අපට උරුම කර දී ඇත්තේ සංස්කෘතිකමය ණයගැති භාවයකි. අපේ පුස්කොළ පොත් රාශියක් ම විදේශීය කෞතුකාගාරයන්හි හා පුස්තකාලයන්හි කෞතුක වස්තු බවට පත්ව ඇත්තේ ද එහි ම ප්‍රතිඵලයක් ලෙසිනි.

"පුස්කොළ උපත" නමින් වූ පැරණි ග්‍රන්ථයක් ගැන මහාචාර්ය පුංචිබණ්ඩාර සන්නස්ගල සූරීන් සිය සිංහල සාහිත්‍ය වංශයේ සඳහන් කරයි. (598 පිටුව) පුස්කොළ පොත් සම්ප්‍රාදාය අපේ සාහිත්‍ය වංශකථාවේ ඉතා ප්‍රබල භූමිකාවක් සහිත වන අතර එය දැනුම් සංරක්ෂණයේ ලා ඉතා වැදගත් මෙහෙවරක් ඉටු කර ඇත. අපේ රටේ විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අයත් පුස්කොළ පොත් ආරක්ෂා වී තිබුණේ බෞද්ධ සිද්ධස්ථානයන් හි ය. විශේෂයෙන් ම ධර්ම ශාස්ත්‍රීය කටයුතුවල බොහෝ සෙයින් නියැලුණේ භික්ෂූන් වහන්සේලා විමත් අපේ රටේ පැරණි අධ්‍යාපන කේන්ද්‍රය පන්සල විමත් එයට හේතු විය. 1885 දී ලූවිස් ද සොයිසා මහමුදලිතුමා පළ කළ " විහාර පොත් ගුල් නාමාවලිය " (A Catalogue of Pali, Sinhalese, Sanskrit, Manuscripts in Temple Libraries of Ceylon, Compiled by late Louis de Zoysa, Maha Mudaliyar, Colombo, George J. A. Skeen, Government printer 1885) වර්තමානයේ දුර්ලභය. මෙයට අමතරව 1938 දී ඩබ්. ඒ. ද සිල්වා මැතිතුමා විසින් පළ කරන ලද "කොළඹ කෞතුකාගාරයෙහි පුස්කොළ පොත් නාමාවලියේ පළමු වන කාණ්ඩය" (Catalogue of palm leaf manuscripts in the Library of the Colombo Museum,Volume I, by W. A. De Silva, Colombo, Ceylon Government printer 1938) ද ඉපැරණි සාහිත්‍ය මූලාශ්‍ර ගවේෂණයෙහි ලා ප්‍රයෝජනවත් ය. සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් 1959 දී ප්‍රකාශයට පත් කළ "ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය" නම් ග්‍රන්ථයේ ප්‍රථම හා ද්විතීය භාගයන්හි පුස්කොළ පොත් සහිත විහාරස්ථාන 1587 ක නාම ලේඛනයක් දැක් වේ. මෙයින් ප්‍රථම භාගයේ පමණක් ඇතුළත් වූ පුස්කොළ පොත් සංඛ්‍යාව පිටපත් 44329 ක් වේ. එහි

සංස්කාරක වූයේ එවකට ලංකා විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ උප ප්‍රධානව සිටි කේ. ඩී. සෝමදාස සූරීන් ය.

හියු නෙවිල් මහතා සතුව තිබූ පාලි සංස්කෘත සිංහල පුස්කොළ පොත්වල සවිස්තර නාමාවලිය ගද්‍ය, පද්‍ය සහ උපග්‍රන්ථ ලෙස කාණ්ඩ හතකින් පළ වී තිබේ. මෙම පුස්කොළ පොත් 3469 ක් දැනට බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට අයත් වන අතර මෙම නාමාවලිය පරිච්ඡේද නවයකට බෙදා ඇත. මෙහි හයවන පරිච්ඡේදය වෙන් වන්නේ ''වෛද්‍ය, නක්ෂත්‍ර, ගුප්ත විද්‍යා සහ බලිතොවිල්, වාසගම් පොත් (පිටු 119-148)'' සඳහා බව සෝමදාස මහතා සඳහන් කරයි. හියු නෙවිල් මහතා ශ්‍රී ලංකාවේ 1865 සිට සේවය කළ සිවිල් නිලධාරියෙකු වන අතර ඔහු සන්තකයේ තිබූ පුස්කොළ පොත් සංඛ්‍යාව 2777 ක් බව මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා පවසයි. මෙම පුස්කොළ පොත් 1907 දී පමණ බ්‍රිතාන්‍ය කෞතුකාගාරය භාරයට ගෙන පෙරදිග කියවීම් ශාලාවේ තැන්පත් කර තිබේ. 1897 වන විට හියු නෙවිල් මහතා හට සිය පුස්කොළ පොත් එකතුවේ සවිස්තර නාමාවලියක් කාණ්ඩ හතකින් නිම කළ හැකි වූ අතර එය ප්‍රකාශයට පත් වූයේ ඔහුගේ මරණින් පසුවය. ඇත්ත වශයෙන් ම එක් අතෙකින් හියු නෙවිල් මහතා මේවා එකතු නො කරන්නට ඒවා මේ වන විටත් පරිහානියට පත් ව හෝ විනාශයට පත් ව තිබෙන්නටත් හැකිය. අද අපේ පුස්කොළ පොත්වලට අත් වි ඇති ඉරණම දෙස බලන විට හියු නෙවිල් මහතා එදා යම් ජාතික මෙහෙවරකට උර දුන්නා යැයි පැවසීම නිවැරදි ය. විද්‍යෝදය සමාජීය විද්‍යා සංග්‍රහයට හියු නෙවිල්ගේ සිංහල ගද්‍ය එකතුව ගැන ලිපියක් සපයන මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාට අනුව පී.ඒ.පී. දැරණියගලයන් හියු නෙවිල් හඳුන්වනුයේ ශ්‍රී ලංකාවට පැමිණි ඉතා විශිෂ්ටතම සහ ප්‍රඥාවන්ත රාජ්‍ය නිලධාරියා ලෙසයි (1989 ජනවාරි-ජූලි කලාපය : 199-212 පිටු).

මෙකී විහාරස්ථාන නාමාවලි බොහොමයක වෛද්‍ය ශාස්ත්‍රීය පුස්කොළ පොත් වාර්තා වන අතර එය සංඛ්‍යාවෙන් 350 කට අධික ය. මෙම පුස්කොළ පොත් සිංහල අකුරුවලට අමතරව බුරුම, සියම්, දෙමළ, තෙළිඟු, මලයාලම්, නාගර,

කාම්බෝජ අකුරුවලින් ලියැවී ඇති අතර සිංහල, පාලි, සංස්කෘත භාෂාත්‍රයට අයත් පුස්කොළ පොත් බහුල ය. විෂයයන් වශයෙන් ගත් කල ත්‍රිපිටකාගත ධර්ම කරුණු, වෛද්‍ය, ජ්‍යොතිෂ, සාහිත්‍ය හා භාෂා ශාස්ත්‍රාදි විෂයයන්ට අයත් වේ. මෙම පුස්කොළ පොත් හැරුණු විට පාරම්පරික වෛද්‍යවරුන්ගේ පෞද්ගලික සන්තකයේ ඇති වෛද්‍ය ග්‍රන්ථ සංඛ්‍යාව අති විශාල ය. එහෙත් මේ දක්වා එම ග්‍රන්ථ සංරක්ෂණය කිරීමේ විධිමත් වැඩපිළිවෙළක් අරඹා නො මැතිකම ඉතා කණගාටුදායකය. මේ වන විට මෙම පෞද්ගලික අයිතියේ ඇති පුස්කොළ ග්‍රන්ථ විනාශවීමේ හෝ විදෙස් ගතවීමේ අවදානමට මුහුණ පා තිබේ. එසේ ම මේ දක්වා විනාශයට පත් වූ සහ විදෙස් ගත ව අපිට අහිමි වූ පුස්කොළ පොත් සංඛ්‍යාව කෙතෙක් දැයි ගණන් බලා නැත. 1956 දී පිහිට වූ ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ ස්වදේශීය වෛද්‍ය සංවර්ධන කොමසාරිස් ධූරයට පත් වූ ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහත්මා විසින් ඇමරිකා එක්සත් ජනපදයේ හා කැනඩාවේ විශ්වවිද්‍යාලයන්හි පුස්තකාලවල අපේ රටෙන් ගෙන ගිය වෙද පොත් 115 ක තොරතුරු සොයා ගත්තේය. ඒ මහතා මේ පිළිබඳ වාර්තාවක් රජයට ඉදිරිපත් කළ අතර 1961 අංක 31 දරන ආයුර්වේදීය පනතින් පසුව ප්‍රථම ආයුර්වේද කොමසාරිස් වරයා ලෙසින් මෙම පුස්කොළ පොත්වලින් 14 ක ඡායා පිටපත් ලබා ගැනීමට හෙතෙම සමත් විය.

ඇමරිකාවේ විශ්වවිද්‍යාල හතක තිබූ මෙම වෙද පොත් 14 හි ඡායා පිටපත් එම විශ්වවිද්‍යාල මඟින් පරිත්‍යාගයක් ලෙස ශ්‍රී ලංකා රජයට ලබා දීමේ දී එවකට ලංකාවේ පිහිටි U.S.I.S. නම් සංවිධානයේ මාර්ටින් ඩී. මිරරල් නම් මහතා උපකාර වී ඇත. මෙම පිටපත් භාණ්ඩාගාරයේ ආර්ථික අංශයේ ප්‍රධානියා වූ තිලක් ඥානරත්න මහතා විසින් 1963.10.10 වැනි දින ආයුර්වේද කොමසාරිස් ඩබ්. ජේ. ප්‍රනාන්දු මහතාට බාරදුන් බව සඳහන් ය. මෙම පිටපත් ආයුර්වේද පර්යේෂණායතනයේ තැන්පත් කරන බවත් ඉතිරි පොත්වල පිටපත් ද ලබා ගැනීමට ක්‍රියාකරන බවත් 1963 ඔක්තෝබර් මස ආයුර්වේද සඟරාවේ පළ විය. (3 වන කාණ්ඩය, 1 කලාපය, 50 පිටුව) මෙම ඉතිරි පුස්කොළ වෙද පොත් අපට ලැබුණා ද යන්න පිළිබඳ යමක් කිව

නොහේ. ලන්දේසි යුගයේ දී අප රටින් ගෙන ගිය පුස්කොළ වෙද පොත් විශාල සංඛ්‍යාවක් ඇම්ස්ට්‍රඩෑම් කෞතුකාගාරයේ ඇති බවට පුවතක් ද අපට අසන්නට ලැබිණ. ඒ පිළිබඳව නිශ්චිත තොරතුරක් දැන ගැනීමට නො හැකි වුණත් ප්‍රංශයේ ඇති වෙද පොත් 06 ක විස්තරයක් ආයුර්වේද සමීක්ෂාව සිව්වන කලාපයේ පළ වී තිබිණ. මෙම පුස්කොළ පොත්වලින් 05 ක් පැරිසියේ ජාතික පුස්තකාලයේ ද අනෙක Musee de I' Homme නම් මානව විද්‍යා කෞතුකාගාරයේ ද තැන්පත්ව ඇති බවත් පැරීසියේ ප්‍රධාන අධ්‍යාපනික හා සංස්කෘතික ආයතන 10 ක කළ සමීක්ෂණයක ප්‍රතිඵලයක් වශයෙන් මේවා සොයාගත් බව එම ලිපියේ සඳහන් ය.

1964 දී ලංකා විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති කේ. ඩී. සෝමදාස මහතා විසින් සංස්කරණය කොට සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් පළ කළ " ලංකාවේ පුස්කොළ පොත් නාමාවලියඃ තෘතිය භාගය " මඟින් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති 4000 ක් පමණ වූ අපේ පුස්කොළ පොත් නාමාවලියක් ප්‍රසිද්ධ කොට ඇත. 1900 දි ඩී. එම්. ද ඉසෙඩ් වික්‍රමසිංහ මහතා ගේ සංස්කාරකත්වයෙන් පළ වූ " Catalogue of the Sinhalese Manuscripts in the British Museum"නම් වූ නාමාවලිය මඟින් ද මෙබඳුම සේවාවක් සිදු වී ඇත. එහි 140 ක් පමණ පුස්කොළ පොත් සිංහල සාහිත්‍ය ඉතිහාසය, ක්‍රිස්තියානි සාහිත්‍යය, බෞද්ධ සාහිත්‍යය, ගුප්ත විද්‍යා හා ප්‍රාදේශීය ඇදහීම්, කලා ශිල්ප හා විද්‍යා ඉතිහාසය, තඹ සන්නස්, භාෂාව සාහිත්‍යය, සංකීර්ණ පුස්කොළ පොත්, පුස්කොළ ලියුම් ආදී වශයෙන් විෂයයන් අනුව පොත් ගෙඩි වර්ග කොට ඇත. පුස්කොළ පොත් හා අත් පිටපත් 3469 ක් පමණ වූ හියූ නෙවිල් මහතා ගේ List of Pali, Sinhalese, Sanskrit palm leaf manuscripts නම් වූ කාණ්ඩ 02 කින් යුත් නාමාවලිය ද වැදගත් ය. මෙහි විෂය ත්‍රිපිටක ග්‍රන්ථ, ත්‍රිපිටකයට අයත් නොවන සෙසු බෞද්ධ ග්‍රන්ථ, ඉතිහාසය, භූගෝල විද්‍යාව, ලෝක විස්තර හා මානව විද්‍යා ග්‍රන්ථ, ව්‍යාකරණ, ශබ්දකෝෂ, ගැටපද, ඡන්දස් අලංකාර ග්‍රන්ථ, බෞද්ධ කාව්‍යය, දෙවි දේවතා ප්‍රාදේශික ඇදහිලි සමාජ චාරිත්‍ර ගැන කවි පොත්, වෛද්‍ය නක්ෂත්‍ර, ගුප්ත විද්‍යා හා බලි තොවිල්

වාසගම් පොත්, විවිධ සංග්‍රහ, සිංහල, දෙමළ, තෙළිඟු, බුරුම පුස්කොළ පොත් සහ විවිධ සංග්‍රහ, සිංහල, පාලි, දෙමළ, ඉංග්‍රීසි කඩදාසි පොත් සංඛ්‍යා සූචිය ආදි වශයෙන් වෙන් කොට ඇත. මේවාට අමතරව බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ පෙරදිග කියවීම් ශාලාවේ ඇති භාෂා අනුව වර්ග කළ පුස්කොළ පොත් හා අත් ලිපි නාමාවලිය, එම කෞතුකාගාරයේ පෙරදිග අංශයට ලැබුණු දින පිළිවෙළට ප්‍රවේශ අංක අනුව සකස් කළ අත් ලිපි හා පුස්කොළ පොත් නාමාවලිය පෙරදිග කියවීම් ශාලාවේ ඇති පාලි පුස්කොළ පොත්වල සවිස්තර නාමාවලිය ද මේ ක්ෂේත්‍රයේ වැදගත් වේ. විශේෂයෙන් ම හියු නෙවිල් මහතා විසින් සැකසූ සවිස්තර නාමාවලී මෙම කාර්යය සඳහා අති විශාල පිටිවහලක් වී ඇත. (මෙම විස්තර ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය තෘතිය භාගයඃ හැඳින්වීම ඇසුරෙනි)

බ්‍රිතාන්‍ය ජාතික කෞතුකාගාරය හැරුණු විට තවත් විදේශ පුස්තකාල කිහිපයක ම සිංහල පුස්කොළ පොත් වාර්තා වන හෙයින් ඒවා අතර දේශීය වෛද්‍ය ග්‍රන්ථයන් ද තිබිය හැකිය. කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ දකුණු ආසියානු එකතුව තුළ සිංහල පුස්කොළ පොත් 66 ක් වාර්තා වන බව සඳහන්ය. (The Orientalist Collections of Cambridge University Library in Report of the Conference and Annual Meeting, SCONUL Advisory Committee on Orientalist Materials by W.A. Lockwood, 1982, pp. 5 - 10 and List of Special Collections relevant to South-Asia SALG Newsletter by A.K. Dalby 20 June 1982, pp.13 -14) 957 දී ජර්මානු ප්‍රාචීනවේදීන් ගේ යෝජනාවක් අනුව ආරම්භ කරන ලද ජර්මනියේ Katalogisierung der Orientalischen Handscriften in Deutschland - KOHD නමින් වූ ජර්මානු එකතුවේ අත්පිටපත්වල ඒකාබද්ධ නාමාවලිය 1990 දී පර්යේෂණ ව්‍යාපෘතියක් බවට පත් විය. එහි සිංහල අත්පිටපත් භාරව කටයුතු කරන්නේ මහාචාර්ය Heinz Bechert මහත්මාය. එම ආයතනයේ නිල වෙබ් අඩවිය වන http://www.sbb.spk-berlin.de/kohd/text.uk.htm හි පළ වූ අත්පිටපත් නාමලේඛනයෙහි විමර්ශන අංක 3-515-01167-6/3-515-02440-9/

3-515-03037-9 යටතේ සිංහල අත්පිටපත් 3 ක් සඳහන් වන නමුත් ඒවා කුමන අන්තර්ගතයක් සහිත දැයි හෙළි නො වේ. ඔක්ස්ෆර්ඩ් හි බොඩ්ලියන් පුස්තකාලයේ ඉන්දුවේදීය අත්පිටපත් අතර සිංහල අත්පිටපත් 104 ක් සම්බන්ධයෙන් 1991 දී ආචාර්ය ජිනදාස ලියනරත්න මහත්මා විසින් රචිත Sinhala palm-leaf manuscripts in the Bodleian Library Oxford නමැති ලිපියෙහි සඳහන් ය. (Bodleian Library Record XIII, pp. 514 -515)

මීට අමතරව ලන්ඩනයේ Welcome Institute for History of Medicine ආයතන පුස්තකාලයේ තිබෙන පුස්කොළ පොත්වලින් 94 ක් දේශීය වෛද්‍ය ග්‍රන්ථ ලෙස හඳුනාගත හැකිය. එසේ ම කැනඩාවේ මැක්ගිල් සරසවියට අනුබද්ධ වෛද්‍ය ඉතිහාසය පිළිබඳ ඔස්ලර් පුස්තකාලයේ ඇති පුස්කොළ පොත් එකතුවෙන් 109 ක් අපේ දේශීය වෛද්‍ය ග්‍රන්ථ වන අතර ඒවායේ ප්‍රමාණයෙන් විශාල (පත් ඉරු 100 ඉක්මවන) පුස්කොළ පොත් සැලකිය යුතු සංඛ්‍යාවක් තිබේ. මෙම පුස්කොළ පොත් කැනඩාවට ගෙන යන ලද්දේ ශ්‍රී ලංකාවේ සේවය කළ කේසි වුඩ් නමැති වෛද්‍යවරයෙකු විසිනි. මෙම පුස්කොළ ග්‍රන්ථ ඉතා සුරක්ෂිතව තැන්පත් කොට තිබීමත් ඒවා අවශ්‍ය වූ විටෙක පිටපත් කර දීමට සූදානම් බවත් යම් ආකාරයකින් සතුටට හේතුවකි. මීළඟට මෙතැන් සිට බ්‍රිතාන්‍ය කෞතුකාගාරය සතුව ඇති අපේ වෙද පුස්කොළ පොත් පිළිබඳව යම් විමසුමක් සිදු කරමු.

1983 දී භෙසජ්ජ මංජුසා සන්නය (Indien 924) යෝගරත්නාකරය (Indien 932) හා නම් රහිත ඖෂධ සංග්‍රහ දෙකක එකතුවෙන් (Indien 1059) ආචාර්ය ජිනදාස ලියනරත්න මහතා විසින් සැකසූ Cataloqus des Manusecrits Singala is Bibliothequs National Paris 1983 නම් වූ නාමාවලියේ සඳහන් බව පැවසේ. භෙසජ්ජ මංජුසාව දඹදෙණි යුගයට අයත් වන අතර යෝගරත්නාකරය කෝට්ටේ යුගයේ දී ලියැවුණු ග්‍රන්ථයෙකි. මෙයට ඇතුළත් නොවූ භෙසජ්ජ මංජුසා (Pali 560) සන්නය පත් ඉරු 377 කින් යුත් ග්‍රන්ථයකි. එය 19 වැනි

සියවසට අයත් බවත් Eugene Burnouf නම් ප්‍රංශ පඬිවරයා සතුව තිබූ බවත් සඳහන් වේ. මෙම ග්‍රන්ථයේ පිටපත් 02 ක් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ අංක 12137 සහ 6612 (2) යටතේ තැන්පත්ව ඇති අතර පිළිවෙළින් ඒවා පත් ඉරු 717 හා පත් ඉරු 433 බැගින් වේ. ඉන් පත් ඉරු 717 ක ග්‍රන්ථය භෙසජ්ජ මංජුසා සන්නය ලෙස හඳුනා ගත හැකිය. එය මහනුවර යුගයට අයත් වේ. 1734 දී වැලිවිට සරණංකර හිමියන් අතින් ලියවුණු මෙම සන්නය පිටපත් 30 ක් පමණ විවිධ විහාරස්ථාන පොත්ගුල්වල ඇත. මුල් පොත වන දඹදෙණි යුගයට අයත් භෙසජ්ජ මංජුසාව (පාලි) පිටපත් 38 ක් පමණ පන්සල් පොත්ගුල්වලින් සොයා ගෙන ඇත. 1962 දී පළ වූ කේ. ඩී. කුලතිලක සංස්කරණයට පාදක වී ඇත්තේ නයිවල විහාරයේ පිටපතයි. 1967 දී මුද්‍රණය වූ විලේගොඩ ධර්මකීර්ති ශ්‍රී ධම්මානන්ද සංස්කරණය කළුතර පුලිනතලාරාමයේ හා කහවේ සරසීහ මහින්දාරාමයේ පුස්කොළ පොත් ඇසුරෙන් බව එහි සංඥාපනයෙහි සඳහන් ය. භෙසජ්ජ මංජුසාවේ මුල් පද්ධති 18 ඩී. සී. පී. බෙණරගම මහතා විසින් 1953 දී සංස්කරණය කොට ලන්ඩන් විශ්වවිද්‍යාලයේ දර්ශනශූරී උපාධිය සඳහා ඉදිරිපත් කොට ඇති බව ජිනදාස ලියනරත්න මහතා බවසයි. තව ද W.A. De Silva the medical literature of the Sinhalese Journal of the Ceylon Branch of the Royal Asiatic Society vol. xxiii no. 66, 1913 (pp 39 - 42) යන ලිපියෙහි භෙසජ්ජ මංජුසා සන්නය පිළිබඳව තවත් විස්තර ඇතුළත් බව ඒ මහතා සඳහන් කරයි.

ලියනරත්න මහතාගේ නාමාවලියේ මීළඟට විස්තර වනුයේ ගද්‍යයෙන් හා පද්‍යයෙන් රචිත ඖෂධ සංග්‍රහයක් (Indien 1063) පිළිබඳවයි. මුල හා අග නො මැති මෙම පුස්කොළ පොතේ පත් ඉරු 73 කි. මෙය 18 හෝ 19 වැනි සියවසට අයත් යැයි සැලකේ. මෙහි විවිධ ආබාධ සඳහා කල්ක, කෂාය, කායම්, ගුලි, තැවිලි, තෙල්, නස්‍ය, බස්න, සින්දූරම් ආදිය සඳහන් ය. මීළඟ පුස්කොළ පොත ගද්‍යයෙන් හා පද්‍ය කිහිපයකින් රචිත ඖෂධ සංග්‍රහයක් (69, 14, 40) වේ. මෙය ද අග මුල අඩු අසම්පූර්ණ පොතකි. පත් ඉරු 171 කි. මෙහි ද විවිධ ඖෂධ යෝගයන් සඳහන් ය. (මෙම විස්තර ආයුර්වේද සමීක්ෂාව

1/4 , 124 - 128 පිටු ඇසුරෙනි) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල අංශයේ මහාචාර්ය විමල විජයසූරිය මහතා ලියූ ලිපියක් මඟින් මියුනික් රාජ්‍ය මහා පුස්තකාලයේ ඇති වෙදපොත් පිළිබඳව හෙළි කොට තිබිණ. මාධව නිදාන, සාරසංක්ෂේප ආදී ග්‍රන්ථයන් ද තවත් බොහෝ ඒවා ද ඇති බව ඒ මහතා සඳහන් කරයි. ශස්‍ය චිකිත්සා (singh - 46) නම් පොතක් පිළිබඳව සඳහන් වේ. එය දේශීය කෘෂිකර්මාන්තය හා සම්බන්ධ ග්‍රන්ථයක් දැයි සැක සහිතය. මේ සමඟම රහස්‍ය නාම කෝෂයක් හෙවත් නිඝණ්ඩුවක් (singh - 89) අනුරාධපුරයෙන් සොයාගත් බව කියැවෙන සටහනක් සමඟ ඇති බවත්, එය සර්ප විෂ නිඝණ්ඩුවක් බවත් ඒ මහතා සඳහන් කරයි. ලූවිස් ගුණරත්නයන් විසින් මුද්‍රිත තුන්තේරුම් සහිත පුරාණ සර්ප විෂ නිඝණ්ඩුව නම් කවි 19 ක කුඩා පොත මෙහි අනුවාදයක් බවට නිගමනය කළ හැකිය. (මෙම විස්තරය ආයුර්වේද සමීක්ෂාව 1/4 : 129 - 136 පිටු ඇසුරෙනි) රහස් ඖෂධ නාම සහිත නිඝණ්ඩු දේශීය වෛද්‍ය ක්‍රමයේ ඉතා වැදගත් තැනක් ගනී. ඒවා දැනුමේ වැදගත් හා ආරක්ෂිත කරුණු සම්බන්ධ යතුරුපද ඇතුළත් විකේත පද්ධති (decoding systems) ලෙස ගිණිය හැකිය. පාරම්පරික දැනුම අනවශ්‍ය පරිදි නුසුදුසු තැනැත්තන් වෙත සංසරණය වීම වළක්වා ලීමේ ලා එමගින් ඉතා වැදගත් මෙහෙයක් සිදුවිය.

මහාවංශයේ සඳහන් පරිදි අප රටේ ලියැවුණු මුල් ම වෛද්‍ය ග්‍රන්ථය වන්නේ අනුරාධපුර යුගයේ දී බුද්ධදාස නරපතියන් අතින් සංස්කෘත භාෂාවෙන් ලියැවුණු සාරාර්ථ සංග්‍රහයයි. සාරාර්ථ සංග්‍රහයේ පත් ඉරු 401 කින් සමන්විත සංස්කෘත සිංහල මිශ්‍ර පිටපතක් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ 6612(1) අංකය යටතේ වර්ග කොට ඇත. ''සාරාර්ථ සංග්‍රහය '' නමින් ලියැවුණු මහනුවර යුගයට අයත් බුද්ධ පද වර්ණනාවක් ද ඇත. මෙය 1718 දී වැලිවිට සරණංකර හිමියන් අතින් සිංහලෙන් ලියැවුණු කෘතියකි. අපේ රටේ පුස්කොළ පොත් නාමාවලියේ මෙය වෙන් කොට දක්වා ඇති අතර ''සාරාර්ථ සංග්‍රහය '' යටතේ පිටපත් 100 කට ආසන්න සංඛ්‍යාවක් විවිධ පළාත්වල විහාරස්ථානවලින් වාර්තා වී ඇත. (104 පිටුව) මෙම නාමාවලියේ දෙවන කාණ්ඩයේ සාරාර්ථ සංග්‍රහය යටතේ වරහන් තුළ ''වෙද පොත'' යන්න යොදා වෙසෙසින් දක්වා

ඇත. මෙම පිටපත මාරපන ශාස්ත්‍රෝදය පිරිවෙනින් හමු වී ඇත. මෙම ග්‍රන්ථයට ලියූ සන්නයක් (වරසාරාර්ථ සංග්‍රහය) මැදවල අත්තරගම රජමහා විහාරයේ (පොත්ගුල් මාලිගය) පොත්ගුලෙන් ලැබී ඇති බව පෙනේ. "සාරාර්ථ සංග්‍රහ නිඝණ්ඩුව " නමින් සිංහල කවි පොතක් ද උණවටුනේ සුනන්දාරාම විහාරයෙන් වාර්තා වන නමුත් එය වෙදපොතක් ද යන්න නො පැහැදිලිය. (78 පිටුව) වෛද්‍යක සාරාර්ථ සංග්‍රහය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් 1987 දී ප්‍රකාශයට පත් කරනු ලැබීය. එහි සිංහලානුවාදය පණ්ඩිත ආරියදාස කුමාරසිංහ සූරීන්ගේය. මීට පෙර 1922 දී වෛද්‍යාචාර්ය පී.සී. ගුණසේකර මහතා විසින් පළ කළ සාරාර්ථ සංග්‍රහයේ පිටු 288 කි. මෙවර එය පිටු 1200 කට ආසන්න ය. මෙහි මුල් පිටපත් මුළු දිවයිනේ ම ඇත්තේ ස්වල්පයක් බව කුමාරසිංහ මහතා මුල දී ම සඳහන් කරයි. එසේ නම් පුස්කොළ පොත් නාමාවලියේ දැක්වෙන පිටපත් විශාල ප්‍රමාණයට සිදුවූයේ කුමක් ද? ඒවා මෙරට තුළ තිබේ ද? යම් හොර පාරකින් පිටරට පැටවූයේ ද? යන්න සැක මුසු ය.

දඹදෙණි යුගයේ දී ලියැවුණු "යෝගාර්ණවය" මුල් ම සිංහල වෙදපොතයි. එහි පිටපත් 03 ක් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇත. මේවා පත් ඉරු 334 ක් සහිත 6612 (96) අංකය හා පත් ඉරු 196 ක් සහිත 6612 (110) අංකය යටතේ වූ පිටපත් දෙකක් හා පත් ඉරු 50 ක් සහිත 7633 අංකය යටතේ වූ අසම්පූර්ණ පිටපතක් ද වේ. අප රටේ ද පිටපත් 13 ක් හා අසම්පූර්ණ පිටපත් දෙකක් විහාර පොත්ගුල්වලින් වාර්තා වී ඇත. තව ද යෝගාර්ණාව සන්නයක් මාවනැල්ලේ සුනන්දාරාමයෙන් හමුවන අතර එබඳු සන්නයක් ගැන ඓතිහාසික සාධක නො මැති නිසා ඒ පිළිබඳව යමක් සඳහන් කළ නො හැකිය. එහෙත් මෙබඳු සන්නයක් වූයේ නම් එය දේශීය වෛද්‍ය ක්‍රමයේ විකාශය සහ භාෂාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීමේ ලා මහඟු මූලාශ්‍රයක් බව කිව මනාය. 1963 දී කිරිඇල්ලේ ඤාණවිමල හිමියන් විසින් යෝගාර්ණවය මුද්‍රණයෙන් පළ කරන ලදී. යෝගාර්ණවය දඹදෙණි යුගයේ වෙදකම පමණක් නොව සමාජය, ජීවනරටා, විශ්වාස, සිරිත් විරිත්, සංස්කෘතිය, භාෂාව, පරිසරය ආදී මානව විද්‍යාත්මක

තොරතුරු ගවේෂණය කිරීම සඳහා ඉතා හොඳ ශාස්ත්‍රීය ආලෝකයක් සපයයි. සාරාර්ථ සංග්‍රහයට සාපේක්ෂව යෝගාර්ණවය ඉතා ඉහළ දේශීය ලක්ෂණවලින් සමන්විත වැදගත් ශාස්ත්‍රීය කෘතියක් ලෙස අගය කළ හැකිය.

යෝගරත්නාකරය පත් ඉරු 221 ක් හා 457 ක් බැගින් වූ පිටපත් දෙකක් බ්‍රිතාන්‍යයේ ඇත. ඒවායේ අංක පිළිවෙළින් 1049 හා 4142 වේ. අපේ රටේ පොත්ගුල්වලින් පිටපත් 69 ක් පමණ ද අසම්පූර්ණ පිටපත් 08 ක් පමණ ද හමු වී ඇත. මෙය කෝට්ටේ යුගයට අයත් කෘතියක් වන අතර පද්‍යයෙන් ලියැවුණු කවි 4561 කින් පමණ සමන්විත කෘතියකි. ''වරයෝගරත්නාකරය'' යනු මෙම කෘතියේ ම මුල් ග්‍රන්ථයක් ද මෙයම ද යන්න පැහැදිලි නො වේ. වරයෝගරත්නාකර නමින් සිංහල පුස්කොළ පොතක පිටපත් 03 ක් මෙම කෞතුකාගාරයේ ඇත. අංක 6612 (111) , 6612 (112), 6612 (113) යටතේ පිළිවෙළින් පත් ඉරු 36, 418, 362 බැගින් වූ පිටපත් වේ. මෙබඳු පිටපත් 04 ක් හා අසම්පූර්ණ පිටපත් අප රටේ විහාරස්ථානයන්හි තිබී හමු වී ඇත. අමතරව වරයෝගරත්නාකර සන්නයක් බෙන්ගමුව චෛතියකන්දරාරාමයෙන් වාර්තා වේ. 17 වන සියවසට අයත් ශ්‍රී යෝගරත්නාකරය ද දකුණු ඉන්දීය යෝගරත්නාකරය ද සිංහල යෝගරත්නාකරය ද වෙන් වෙන් කෘතීන් ය. සිංහල යෝගරත්නාකරය 1897 දී දොන් ජෝර්ජ් සමරතුංග රත්දුනු මහතා විසින් ප්‍රථම වරට මුද්‍රණයෙන් පළ කර ඇත. වරයෝගසාරය නම් ග්‍රන්ථයේ පත් ඉරු 321 කින් යුත් පිටපතක් ද බ්‍රිතාන්‍යයේ ඇත. එහි අංකය 6612(108) වේ. මෙම කෘතියේ පිටපත් 39 ක් ද අසම්පූර්ණ පිටපත් පහක් ද පන්සල් පොත්ගුල්හි වාර්තා වේ. මෙය කිරිඇල්ලේ ඤාණවිමල හිමියන් විසින් 1966 දී පළ කරන ලදී. මීට පෙර 1944 දී කර වූ මුද්‍රණයක් පිළිබඳව සිංහල සාහිත්‍ය වංශයේ සඳහන් ය. (666 පිටුව. අධෝලිපි) වරයෝගසාරය කුමන කාලයකට අයත්දැයි නිශ්චිත ලෙස ප්‍රකාශ කිරීමට නො හැකි නමුත් එය කෝට්ටේ යුගයට ආසන්න කාලයක ලියැවෙන්නට ඇතැයි සිතීමට කරුණු තිබේ.

ශෛලේන්ද්‍රසිංහයන් ගේ වෛද්‍ය චින්තාමනී භෛෂජ්ජ සංග්‍රහයේ සන්නයක පිටපත් දෙකක් අංක 6612 (95) හා 6612

(86) යටතේ ඇත. පත් ඉරු 102 හා 96 ක් වේ. එනමුත් අප රටේ වාර්තාවන්නේ මහනුවර සිරි දේවමිත්ත පුස්තකාලයේ ඇති එක ම පිටපත පමණි. දික්වැල්ලේ වැව්රුකන්නල රජමහාවිහාරයේ ඇති බවට සඳහන් වන ''වෛද්‍ය චින්තාමණී'' ග්‍රන්ථය ද සන්නය නොවේ. එය ද එක ම පිටපතකි. මෙම කතුවරයා ම ලියූ ''වට්ටෝරු වෙද පොත '' 1950 දී ඇහැළේපොළ අත්වෙද පොත නමින් මුද්‍රණයෙන් පළවූ බව පුංචිබණ්ඩාර සන්නස්ගල සූරීන් කියයි. (සිංහල සාහිත්‍ය වංශය, 669 පිටුව : අධෝලිපිය 1) ''වට්ටෝරු වෙදපොත'' නමින් පිටපත් අටක් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇත. මේවායේ පිටපත් තුනක පත් ඉරු 102 (4999), 107 (5350) හා 135 (6612 (4) බැගින් වේ. මීට අමතරව වට්ටෝරු පොත නමින් තවත් සිංහල ග්‍රන්ථ අටක් සඳහන් වන අතර ඒවා සමහරක් පත් ඉරු 124 (6612 (89), 210 (6612 (90), 114 (6612 (91) බැගින් වන තරමක විශාල පොත් ලෙස පෙනේ. එනමුත් ''ඇහැළේපොල අදිකාරම්තුමාගේ අත් වෙදපොත'' නමින් පුස්කොළ පොතක් මාරපන ශාස්ත්‍රෝදය පිරිවෙනෙහි ඇති නිසා එය ශෛලෙන්ද්‍රසිංහයන්ගේ වට්ටෝරු වෙදපොත හා වරදවාගත යුතු නොවේ. මෙම කතුවරයා ශ්‍රී නරේන්ද්‍රසිංහ රජුගෙන් ගෞරව නාමයක් ලද බවත් රාජ වෛද්‍යවරයා ලෙස කටයුතු කළ බවත් කියැවේ. ඔහුගේ වෛද්‍ය චින්තාමනී භෛෂජ්ජ සංග්‍රහය ඉතා වටිනා අංගසම්පූර්ණ දේශීය වෛද්‍ය ග්‍රන්ථයක් වන අතර ද්‍රවිඩ බලපෑම නිසා අපට උරුම වූ ශාස්ත්‍රීය දායාදයන් එමගින් ඉස්මතු කර ගත හැකිය. විශේෂයෙන් ම රෝගාබාධ සඳහා දක්ෂිණ භාරත ආභාසය සහිත මන්ත්‍ර, පුද පූජා සහ විවිධ අභිචාර විධි සමූහයක් ද වෛද්‍යමය ජ්‍යොතිෂ කරුණු ද මෙම ග්‍රන්ථයේ ඇතුළත්ව තිබේ. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙන් ''යෝගරත්නාවලිය'' නම් වූ පත් ඉරු 102 ක වෛද්‍ය චින්තාමණී සන්නයක් අංක 6612 (85) යටතේ හමුවේ. ඊට අමතරව පත් ඉරු 96 ක තවත් පිටපතක් 6612 (86) ද වාර්තා වේ. යෝගරත්නාවලිය නමින් ග්‍රන්ථයක් පුන්ඩළුඔය බෝධිරුක්ඛාරාමයෙන් වාර්තා වන අතර මේ ග්‍රන්ථ සමාන දැයි සොයා බැලිය යුතු ය.

1798 දී ලියවුණු ''යෝගදාරණය'' නම් වෙද කවි පොත පත් ඉරු 50 හා 63 බැගින් වූ පිටපත් දෙකක් අංක 6612 (97) හා

6612 (98) යටතේ ඇත. අපේ රටේ පොත්ගුල්වල මෙම කෘතියේ පිටපත් 32 ක් හා අසම්පූර්ණ පිටපතක් ද හමු වේ. මීට අමතරව යෝගදාරණ සන්නය නම් කෘතියක් මිද්දෙණිය ජයමහබෝධි විහාරයෙන් වාර්තා වේ. මහනුවර යුගයේ දී ලියවුණු '' අරිෂ්ට ශතකය'' නම් වූ කුඩා ග්‍රන්ථය පත් ඉරු 24 හා 15 බැගින් වූ පිටපත් දෙකක් අංක 6612 (27) හා 6612 (102) යටතේ බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තැන්පත්ව ඇත. මෙම අරිෂ්ට ශතකයට සිංහල සන්නයක් මහනුවර යුගයේ දීම ලියැවුණු බව සිංහල සාහිත්‍ය වංශයේ සඳහන් ය. (498 පිටුව) 1816 දී පමණ මිදෙල්ලව කෝරාල නම් පරසිඳු කිවිඳු විසින් හෙළ ගීයට නඟන ලද අරිෂ්ට ශතකය '' අරිෂ්ට මාලාව '' නම් විය. ''අරිෂ්ට ශතක කවි පොත '' (සිංහල) නම් පත් ඉරු 25 ක කෘතියක් 6612 (46) අංකය යටතේ තැන්පත්ව ඇත. මිදෙල්ලව කෝරාල අතින් හෙළ ගීයට නැගුණු අනෙක් පොත යෝග ශතකයයි. එය හෙළයට ''යෝග මාලාව '' විය. පත් ඉරු 36 පිටපතක් 6612 (103) අංකය යටතේ දැක්වෙන අතර ''යෝගරත්න මාලාව හෙවත් යෝග මාලාව '' නම් වූ තවත් පිටපතකි. (Add. 17735 W61 (1) අප රටේ ද යෝග මාලාව පිටපත් හයකට වඩා හමු නො වේ. මෙහි මුල් පොත වන යෝගශතකය සන්න සහිතව පිටපත් හයක් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇත. මේවා පත් ඉරු 35, 29, 48, 19, 29, 42 බැගින් අංක 6612 (22), 6612 (23), 6612 (99), 6612 (100), 6612 (101), 6612 (102) යටතේ තැන්පත්ව තිබේ. අප රටේ පොත්ගුල් වලින් යෝග ශතක පිටපත් 41 ක් පමණ ද අසම්පූර්ණ පිටපතක් ද වාර්තා වේ. මීට අමතරව යෝග ශතක පදාර්ථ නම් කෘතියක් මොරටුව ලක්ෂපතියේ ක්ෂේත්‍රාරාම විහාරයෙන් ද යෝගශතක ව්‍යාඛ්‍යාන පිටපත් දෙකක් මාතර කොටිකාගොඩ රජමහා විහාරයෙන් ද බෙලිඅත්ත උණවටුන පුරාණ විහාරයෙන් ද සොයාගෙන ඇත. යෝගශතක සන්න පිටපත් 18 ක් පමණ විවිධ ප්‍රදේශ වලින් හමු වී ඇත.

''සාරසංක්ෂේප '' නමින් ප්‍රසිද්ධව ඇති කෘතියේ පත් ඉරු 184, 179, 108 බැගින් වූ පිටපත් තුනක් 6612 (106), 6612 (105), 6612 (107) අංක යටතේ තැන්පත් ව ඇත. අප රටේ විහාරස්ථාන වලින් පිටපත් 35 ක් හා අසම්පූර්ණ පිටපත් තුනක් ද වාර්තා වි ඇත. මෙය 1865 දී ඩී. එච්. එස්. කවිරත්න

වෛද්‍යරත්න තුමන් විසින් ද 1984 දී ආරියදාස කුමාරසිංහ සූරීන් විසින් ද හෙළයට පෙරළිණි. අපේ රටේ බොහෝ වෛද්‍යවරුන් අතර ප්‍රචලිත කුඩා අත්පොතකි "වෛද්‍යාලංකාරය" මෙහි සංස්කෘත සිංහල කෘතිය පත් ඉරු 29 හා 15 බැගින් වූ 6612 (26) හා 6612 (84) අංක යටතේ තැන්පත්ව ඇත. මෙම කෘතියේ පිටපත් 10 ක් හා අසම්පූර්ණ එක් පිටපතක් ද අප රට තුළ වාර්තා වී ඇති අතර මෙයට ලියූ සන්නයේ පිටපත් දෙකක් බලපිටිය අඹරුක්ඛාරාමයෙන් ද පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ ද ඇත. මෙයින් පසුව කියැවුණු පිටපත අසම්පූර්ණ ය. වෛද්‍යාලංකාර සංග්‍රහය නමින් වූ ග්‍රන්ථයක පත් ඉරු 41 හා 27 බැගින් වූ පිටපත් දෙකකින් ද බ්‍රිතාන්‍යයේ ඇත. අපේ රටේ ඉතා ම බහුලව භාවිත වූ නිඝණ්ඩුවකි සරස්වතී නිඝණ්ඩුව. සංස්කෘත, සිංහල, දෙමළ භාෂාවලින් යුත් සරස්වතී නිඝණ්ඩු පිටපත් හතරක් බ්‍රිතාන්‍යයේ ඇත. මේවා පත් ඉරු 35, 23, 22, 24 බැගින් අංක 6612 (18), 6612 (67), 6612 (68), 6612 (69) යටතේ වාර්තා වේ. අපේ රටේ මෙබඳු පිටපත් 32 ක් ද තවත් අසම්පූර්ණ පිටපත් තුනක් ද හමු වේ. සරස්වතී නිඝණ්ඩුව ගැන සංඝරාජ ලේකම් මිටියේ ද සඳහන් බව සිංහල සාහිත්‍ය වංශය සඳහන් කරයි. (499 පිටුව : අධෝලිපිය 4) ඩී. බී. එස් කවිරත්න වෙදදුරන් විසින් මෙම කෘතිය පළමුවරට මුද්‍රණය කළ අතර ගේබ්‍රියල් ගුණවර්ධනයන් විසින් කළ සංස්කරණය වනාහි සවිස්තරය. විමසුම් සහිතය.

පත් ඉරු 24 ක් සහිත "සිද්ධෞෂධ නිඝණ්ඩු" පිටපතක් ද බ්‍රිතාන්‍යයේ කෞතුකාගාරයේ 6612 (63) අංකය යටතේ වාර්තා වේ. සිද්ධෞෂධ නිඝණ්ඩුව හා සරස්වතී නිඝණ්ඩුව එක්ව ඇති පත් ඉරු 47 ක පිටපතක් ද අංක 6612 (18) යටතේ ඇත. අපේ රටෙන් මෙම සිද්ධෞෂධ නිඝණ්ඩුවට සැපයූ සන්න පිටපත් දෙකක් මාතර වීරබා පිරිවෙන හා වීරකැටිය මුල්කිරිගල රජමහා විහාරයෙන් ද හමු වේ. සිද්ධෞෂධ නිඝණ්ඩු ව්‍යාඛ්‍යාවක් වැවුරුකන්නල රජමහා විහාරයෙන් හමු වේ. මෙය 1932 දී ඒ. ඩී. එස්. ගුණතිලක මහතා විසින් මුද්‍රණය කොට ඇත. පුංචිබණ්ඩාර සන්නස්ගල සූරීන් හට බඹරගල විහාරයෙන් මෙම නිඝණ්ඩුවේ පිටපතක් හමු වූ බව සඳහන් ය. (සිංහල සාහිත්‍ය වංශය 499 පිටුව: අධෝ ලිපිය 6) ශ්‍රී වාසුදේව නිඝණ්ඩුව ද එකල

වෛද්‍යවරුන් අතර භාවිත විය. මෙහි පත් ඉරු 101 කින් යුත් පිටපතක් 6612 (109) අංකය යටතේ වාර්තා වේ. මෙහි පිටපත් 25 ක් පමණ අප රටේ පොත්ගුල්වලින් සොයා ගෙන ඇත. සිංහල සාහිත්‍ය වංශය කුණ්ඩසාලේ රජමහා විහාරයේ තිබූ පිටපතක් ගැන සඳහන් කරයි. (499 පිටුව : අධෝලිපිය 5) මෙම නිඝණ්ඩුව මුද්‍රණය වූ බවක් නො දනිමු. තවත් ප්‍රකට නිඝණ්ඩුවක් වන වරරුචි නිඝණ්ඩුව පිළිබඳව බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙන් වාර්තා නො වේ. ඉන්දියානු කෘතියක් වන ''වරරුචි කෝෂ '' හෙවත් වරරුචි නිඝණ්ඩුවේ පිටපත් 10 ක් පමණ අප රටෙන් හමු වේ. භෙසජ්ජ මංජුසාවේ ''වරරුචි සංහිතාව '' නමින් සඳහන් වන ග්‍රන්ථය 10 වැනි සියවසට අයත් කෘතියක් බව පෙනේ. මේවා එකිනෙකින් වෙනස් ග්‍රන්ථ දෙකක් විය යුතු ය.

අපේ රටේ සාහිත්‍යයේ හෙළබසින් ලියැවුණු වනවාස නිඝණ්ඩුව හා සිරිමල් නිඝණ්ඩුව අති ප්‍රසිද්ධය. මේ පිළිබඳව පුංචි බංඩාර සන්නස්ගල සූරීන් මෙසේ සඳහන් කරයි. ''විල්ගම්මුල පරපුරේ භික්ෂූහු සෙන්කඩගල යුගයේ වැඩ විසූහ. සාහිත්‍යයේ පිරිහීම් ලකුණු කියා පා ඇති සිරිමල් නිඝණ්ඩුව හා වනවාස නිඝණ්ඩුව මේ පරපුරේ සීප්පුකුලමේ හිමියන් විසින් පසු කලෙක කළ අතික් පොත් දෙකකි. '' (සිංහල සාහිත්‍ය වංශය; 323 පිටුව) මෙම නිඝණ්ඩු දෙක මහනුවර යුගයට අයත් බව කියැවේ. (එම 578 පිටුව) පත් ඉරු 28 කින් යුත් සිරිමල් නිඝණ්ඩුවේ පිටපතක් 6612 (80) යටතේ ද පත් ඉරු 43 හා 27 බැගින් වූ සරස්වතී නිඝණ්ඩුවේ පිටපත් දෙකක් 6612 (75) හා 6612 (76) අංක යටතේ ද වේ. මෙහි වැදගත් ම කාරණය සිරිමල් නිඝණ්ඩුවේ මුල් පිටපත් එකක් හෝ අප රටෙන් වාර්තා නො වීමයි. අපේ රටේ භාවිත වනවාස නිඝණ්ඩුවේ සිංහල හා සංස්කෘත මුසු භාෂා ශෛලියක් දක්නට ඇත. මෙම කෘති දෙක ම සිප්පුකුලමේ දීපංකර හිමියන්ගේ බව පිළිගැනේ. වනවාස නිඝණ්ඩුව පත් ඉරු 43 (6612 (75) සහ 27 (6612 (76) බැගින් වූ පිටත් දෙකක් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙන් හමුවන ඉන් පළමුවැන්න සංස්කෘත, පාලි, සිංහල, දෙමළ යන භාෂාවලින් යුක්ත බව කියැවේ. වනවාස නිඝණ්ඩු පිටපත් හතක් අප රටේ පොත්ගුල්වල වාර්තා වී ඇති අතර එයින් ද තුනක් අසම්පූර්ණය.

ශතශ්ලෝක නමැති ග්‍රන්ථයේ පත් ඉරු 49 ක පිටපතක් අංක 6612 (61) යටතේ වාර්තා වන අතර එහි සන්නයක් ද අංක 6612 (60) යටතේ සඳහන් ය.

බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ අංක 6612 (70), 6612 (71), 6612 (31) යටතේ පිටපත්වල පත් ඉරු 29, 28, 16 බැගින් වන ''සාර නිඝණ්ඩු '' නම් ග්‍රන්ථයක පිටපත් තුනක් හමුවේ. එනමුත් අප රටේ වාර්තා වන්නේ යටවත්තේ උරුළුවත්තේ පුරාණ විහාරයෙන් හමු වන මෙම කෘතියේ එක ම පිටපතක් පමණි. මෙය වෛද්‍ය නිඝණ්ඩුවක් දැයි නො දනිමු. එනමුත් ''සාරසංග්‍රහ'' නම් සිංහල වෙදපොතක පත් ඉරු 160 ක පිටපතක් 6612 (72) අංකය යටතේ ද පත් ඉරු 24 ක පිටපතක් Egerton 1113 W 58 (111) අංකය යටතේ ද තැන්පත්ව ඇත. වික්‍රමසිංහ මහතාගේ නාමාවලිය අනුව දෙවැන්නේ පත් ඉරු 83 කි. එහි සඳහන් කරුණු අනුව එය රෝග චිකිත්සා ග්‍රන්ථයක් වන අතර කෝට්ටේ යුගයෙන් මෙපිට ලියැවුණු කෘතියක් බව හැඟේ.

මෙම කෘතියේ සම්පූර්ණ පිටපත් දෙකක් හා අසම්පූර්ණ පිටපතක් මෙරට විහාරස්ථානවලින් හමු වී ඇත. ''සාරසංග්‍රහ'' නාම සම්බන්ධය ඇති ග්‍රන්ථ කීපයක් ම වේ. 13 වැනි සියවසේ ශ්‍රී ගෝපාල කෘෂ්ණ අතින් ලියැවුණු ''රසේන්ද්‍ර සාර සංග්‍රහ'' වංගසේන සංහිතාව හෙවත් චිකිත්සාගාර සංග්‍රහ, (මෙය ද්‍රවිඩ භාෂාමය අගස්ත්‍ය සංහිතාවේ සංස්කෘත අනුවාදයැකැයි කිය වේ. 15 වැනි සියවසේ වංග දේශයේ විසූ වංගසේන නම් වෛද්‍යවරයා විසින් කරන ලද්දක් යැයි කියයි.) 19 වැනි සියවසේ දී රඝුනාථජී ඉන්ද්‍රජී ආචාර්ය තුමන් අතින් ලියැවුණු ''නිඝණ්ඩු සාරසංග්‍රහ'' 20 වැනි සියවසට අයත් රඝුනාථ ශාස්ත්‍රී ගේ ''වෛද්‍යක සාරසංග්‍රහය '' වැනි කෘති ඒ අතර වේ. මේ කියන සාර සංග්‍රහ 17 වැනි සියවසට අයත් ජෛන හර්ෂ කීර්ති අතින් සැකසුණු යෝග චින්තාමණී හෙවත් ''සාරසංග්‍රහ'' නම් කෘතිය විය යුතුය. ''යෝග චින්තාමණී'' නම් වෛද්‍ය ග්‍රන්ථයක පිටපතක් වටද්දර ඥානෝදය පිරිවෙනින් වාර්තා වේ. මෙය 11 - 14 සියවස් අතර වූ හර්ෂගේ කෘතිය දැයි විමසිය යුතුය.

මේ අතර ''අභිනව මාධව'' නමින් මාධව නිදානයේ පිටපත් දෙකක් අංක 6612 (15) හා 6612 (16) යටතේ වාර්තා වේ. ඒවා පත් ඉරු 69 හා 78 බැගින් වේ. මෙම නව මාධවය හෙවත් රාජගුරු කවිචන්ද්‍රයන්ගේ සංස්කරණය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයෙන් ද අඹකඳපොල ගණේකන්ද රජමහා විහාරස්ථානයෙන් ද යනුවෙන් පිටපත් තුනක් හමු වී ඇත. භෛෂජ්ජ කල්පය නමින් එන කෘතියක පත් ඉරු 200 ක පිටපත් අංක 6612 (3) යටතේ වාර්තා වේ. මෙම කෘතියේ පිටපත් 24 ක් අප රටෙන් හමු වී ඇති අතර එයින් එකක් අසම්පූර්ණය. මේ පත් ඉරු සංඛ්‍යාව දෙස බලන විට එය තරමක් විශාල ග්‍රන්ථයක් වන බව නිගමනය කළ හැකිය. එය අප රටේ ලියැවී ඇති ප්‍රධාන වෛද්‍ය ග්‍රන්ථවලට නො දෙවෙනි කෘතියක් බව වටහා ගැනීමට එහි විශාලත්වය එක් සාක්ෂියකි. එහි නාමය අනුව එම ග්‍රන්ථය බොහෝ සෙයින් රෝගාබාධ සඳහා විවිධ ප්‍රතිකාර ක්‍රම ඇතුළත් කළ වෛද්‍ය ග්‍රන්ථයක් බවට අනුමාන කළ හැකිය. මෙම කෘතියට ලියූ සන්නයක් ගෘන්ඩ්පාස් හි ජයතිලකාරාමයෙන් හමු වී ඇත. තව ද ''භෛෂජ්ජමාලා'' නම් ග්‍රන්ථයක පත් ඉරු 70 ක පිටපත් අංක 6612 (17) යටතේ බ්‍රිතාන්‍ය කෞතුකාගාරය සතුව ඇත. අප රටෙන් වාර්තා වන්නේ ද වැල්ලවත්ත සුවිශුද්ධාරාමයේ ඇති එක ම පිටපත පමණි.

''වෛද්‍යයන්ත්‍ර'' නම් ග්‍රන්ථයක් අංක 6612 (456) යටතේ වර්ග කොට ඇත. මෙහි පත් ඉරු 79 කි. මෙම ග්‍රන්ථයෙහි එක ද පිටපතක් හෝ අප රටෙන් හමු වී නැත. මෙහි නම දෙස බලන කල්හි මෙය ශල්‍ය ශාස්ත්‍රයට අයත් පොතක් දැයි සැක සහිතය. මේ පිළිබඳව සොයා බැලිය යුතුය. ශල්‍යකර්මය නමින් පුස්කොළ පොත් දෙකක් පල්ලෙබෝවල රජමහා විහාරයෙන් සහ වලස්ගල ජයවර්ධන මුදලින්දාරාමයෙන් වාර්තා වන අතර එබඳු නම් සහිත දේශීය වෛද්‍ය ග්‍රන්ථ විරලය. ''රස සංහිතා'' නම් වූ මහා ග්‍රන්ථයක පත් ඉරු 550 කින් යුත් පිටපතක් 6612 (58) අංකය යටතේ දැක්වේ. මෙම ග්‍රන්ථයේ එක ම පිටපතක් අප රටෙන් වාර්තා වන්නේ මාතර නාඳුගල සුධර්මාරාම පුරාණ පිරිවෙන් පොත්ගුල් විහාරයෙනි. මෙම ග්‍රන්ථයේ පත් ඉරු සංඛ්‍යාව දෙස බලන විට එය ඉතා විශාල ප්‍රමාණයේ වෛද්‍ය කෘතියක් වන අතර එහි අඩංගු කරුණු සම්භාරය ද එලෙසින් ම සුවිසල් බව

වටහා ගත හැකිය. මෙය අප රට තුළ පැවති රස වෙදකම සම්බන්ධයෙන් යම් අදහසක් ලබා ගැනීම සඳහා ඉතා වටිනා මූලාශ්‍රයක් වනු නො අනුමානය. සිද්ධිසාරය නම් වූ සිංහල වෙද පොතක් පත් ඉරු 76 කින් යුත් අංක 6612 (65) යටතේ පිටපතක් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇත. මෙහි පිටපත් අකුරැස්ස නන්දනාරාමයේ එකක් ද වලස්ගල ජයවර්ධන මුදලින්දාරාමයේ දෙකක් ද වශයෙන් පිටපත් තුනක් අප රටෙන් වාර්තා වේ. මෙය ශිරෝරෝග චිකිත්සා ග්‍රන්ථයක් බව සඳහන් ය. වරයෝගසාර 1944 මුද්‍රණයේ මෙම ග්‍රන්ථයේ නම පෙනෙන බව පුංචිබණ්ඩාර සන්නස්ගල සූරීන් කියයි. (සිංහල සාහිත්‍ය වංශය 666 පිටුව : අධෝලිපිය)

අප්‍රකට ඖෂධ නිඝණ්ඩු හෝ ඖෂධ නාම අකාරාදි වශයෙන් ගිණිය හැකි පොත් කීපයක් ද බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙන් වාර්තා වේ. ඖෂධ නිඝණ්ඩු පත් ඉරු 61 කින් යුත් පිටපතක් අංක 6612 (56) යටතේ ද ඖෂධ ගණ විධිය පත් ඉරු 19 කින් යුත් පිටපතක් අංක 6612 (57) යටතේ ද ඇත. මෙම ඖෂධ ගණ විධිය අපේ රට තුළ දේශීය ඖෂධ වර්ගීකරණය පිළිබඳ වටිනා මූලාශ්‍රයක් ලෙස අනුමාන කළ හැකිය. අංක 6612 (33) යටතේ පත් ඉරු 9 කින් යුත් '' බෙහෙත් නම් '' නමින් කුඩා අත් පොතක් ද දක්නට ලැබේ. පත් ඉරු 17 ක් වන ද්‍රව්‍ය ගුණ නමින් සංස්කෘත සිංහල පොතක් අංක 6612 (45) යටතේ ඇත. ශාස්වත නිඝණ්ඩුව නමින් පත් ඉරු 43 ක පොතක් 6612 (66) යටතේ දැක්වේ. මෙය පුරාණ නිඝණ්ඩුවක් ද යන්න විමසිය යුතුය. මෙබඳු පොතක් අප රටේ පුස්කොළ පොත් නාමාවලියේ වාර්තා වී නැත. අංක 6612 (48) ගුණපාඨය යනු පත් ඉරු 19 ක සිංහල වෙද කවි පොතකි. සර්වනාම නිඝණ්ඩු යනුවෙන් අප පත් ඉරු 85 - 101 ක පොතක් 6612 (11) යටතේ දැක්වේ. මෙය අප රටේ පොත්ගුල් කිහිපයක සොයා ගත හැක. බණ්ඩාරවෙල, සුදර්ශන මෙත්තාරාමය, පින්වත්තේ සද්ධර්මාකර පිරිවෙන, මාතර වැලිවේරිය පුෂ්පාරාමය, තංගල්ල වනවාස කුඩා විහාරය ඒවා අතර වේ. මෙය ඖෂධ නාම ඇතුළත් නිඝණ්ඩුවක් දැයි සොයා බැලිය යුතු ය. '' නවජාතිය නිඝණ්ඩුව'' නමින් පත් ඉරු 60 ක පිටපත් අංක 6612 (93) යටතේ ඇත. මෙය ද නිඝණ්ඩුවක් දැයි විමසිය යුතු ය.

මීට අමතරව වෙදපොත් නමින් පිටපත් 11 ක් ද එම කෞතුකාගාරයේ තැන්පත්ව ඇත. ගුලි, කල්ක, වට්ටෝරු නමින් කවිපොත, ගුණපාඨය නම් කවි පොත, බෙහෙත් ගුලි පොත, බෙහෙත් තෙල් වට්ටෝරු පොත, සර්වාංග වෙද පොත ආදී වෙද පොත් සමුහයක් ද මෙහි ඇත. අංක 6612 (104) යටතේ ඇති ගුලි, කල්ක වට්ටෝරු කවිපොත පත් ඉරු 37 ක ග්‍රන්ථයකි. ''රෝග ලක්ෂණ හා බෙහෙත් '' නමින් ද පත් ඉරු 27 ක පොතක් දක්නට ලැබේ. බෙහෙත් තෙල් වට්ටෝරු පොත පත් ඉරු 81 ක ග්‍රන්ථයකි. (6612 (21). එසේ ම සංස්කෘත සිංහල මිශ්‍රව ලියැවුණු පත් ඉරු 17 ක ගෙඩි වෙද පොතක් අංක 6612 (25) යටතේ වාර්තා වේ. අංක 7671 යටතේ පත් ඉරු 8 ක වණ වෙද පොතක් ද 7638 යටතේ පත් ඉරු 11 ක මාන්දම් සහ ග්‍රහණි වෙද පොතක් ද හමුවේ. වෛද්‍යාලංකාරය නමැති සංස්කෘත-සිංහල මිශ්‍ර ග්‍රන්ථයේ පත් ඉරු 29 ක පිටපතක් අංක 6612 (26) සහ පත් ඉරු 25 ක පිටපතක් 6612 (84) යටතේ ද වාර්තා වේ. මීට අමතරව වෛද්‍යාලංකාර සංග්‍රහය නමැති පත් ඉරු 41 ක සහ 27 ක ග්‍රන්ථ දෙකක් අංක 6612 (82) සහ 6612 (83) යටතේ තිබේ. එසේ ම පත් ඉරු 289 සහ 106 බැගින් වූ වෛද්‍යාලංකාර නමින් සිංහල වට්ටෝරු වෙදපොත් දෙකක් අංක 6612 (87) යටතේ ඇති අතර ඒවා තරමක් විශාල ග්‍රන්ථ බව පෙනේ.

රෝග පරීක්ෂාව නම් සිංහල කවි පොත, අෂ්ට පරීක්ෂාව නම් සංස්කෘත - සිංහල පොත, දූත ලක්ෂණ නම් පොත, නාඩි ශාස්ත්‍ර නම් කවි පොත එක ම අංශයක ලා සැලකිය හැකි පොත් පත් වේ. අංක 6615 (55) යටතේ දැක්වෙන නාඩි ශාස්ත්‍ර නමැති ග්‍රන්ථය පත් ඉරු 13 ක කුඩා සිංහල කවි පොතකි. රෝග අරිෂ්ටය නමැති සංස්කෘත - සිංහල පත් ඉරු 13 ක කුඩා ග්‍රන්ථයක් අංක 6612 (24) යටතේ පෙනේ. ''ත්‍රිංශද්භිෂජාංගය '' නමින් පත් ඉරු 40 ක පොතක් 6612 (62) අංකය යටතේ ද දැක් වේ. මෙය සංස්කෘත සිංහල මිශ්‍ර ග්‍රන්ථයක් වන අතර දේශීය වෛද්‍ය ග්‍රන්ථයක මුල් පරිච්ඡේදයක් මේ සඳහා වෙන් කර තිබේ. රෝග ලක්ෂණ සහ බෙහෙත් පොත නමින් පත් ඉරු 27 ක ග්‍රන්ථයක් අංක 6612 (32) යටතේ සඳහන්ය. සන්නිපාත වෙදකමට අයත් කෝල විධිය කවි පොත, කෝල විධියේ වෙද පොත, කෝලසන්නිවිධිය කවි පොත, කෝලසන්නි වෙදපොත,

සන්නි චිකිත්සාව, සන්නි වෙදපොත (කවි) ආදී පොත් කීපයක් මෙම කෞතුකාගාරයේ ඇත. විදුම් පිළිස්සුම් වෙදකම අයත් සල්ලවිධිය, සල්ලවිධි, සැර විධිය, අසුර විධිය, පූඩාවිධිය, විදුන් ශාස්ත්‍රය ආදී පොත් ඉතා ම වටිනා වෙදකම් සහිත ඒවා වේ. මේ අංශයේ පොත් පත් ඉතා ම සුළු ප්‍රමාණයකි අප රටෙන් වාර්තා වනුයේ. මාතර වැලිවේරිය පුෂ්පාරාමයේ විදිනවිධි (කවි) නම් පොත, මී ඇල්ල ගනේගොඩ පුරාණ විහාරයේ විදුම් ක්‍රම, සැර විධිය නම් පොත, අංගොඩ ගල්වානේ පුරාණ විහාරයේ ශාස්ත්‍ර කර්ම විධි නම් පොත ආදී කීපයක් ඒ අතර වේ. පැල්මඩුල්ල පුරාණ විහාරයේ ඇති ''නහර විදුම්'' ශාස්ත්‍රය නම් පිටපත් හතර ද ශිරාවේධයට අයත්විය යුතු ය.

විෂ වෙදකමට අයත් සර්ප වෙදපොත, සර්පදූතය, පිස්සු බලු විෂට බේත්, උන්නමතකශ්වාන විශෞෂධ, වියරු ලක්ෂණ, වියරු උපත, වියරු විෂ බෙහෙත්, විෂ විධිය, විෂාහාකරය, විෂ භෙසජ්ජය ආදී පොත් සමූහයක් ද බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ වේ. අංක 6612 (80) යටතේ වන විෂ භෙසජ්ජයේ පත් ඉරු 19 කි. විෂ විධිය (6612 (77) පත් ඉරු 47 ක් වන අතර විෂභාකරය (6612 (78) පත් ඉරු 49 ක ග්‍රන්ථයකි. සර්ප වෙදපොත් කීපයක් අප රටෙන් වාර්තා වුවත් පිස්සු බලු විෂට ප්‍රතිකාර ඇතුළත් පොත්පත් ස්වල්පයකි. මහරගම පඤ්ඤාලංකාරාමය, උණවටුන සුනන්දාරාමය විහාරය, උඩගම ජයවර්ධනාරාමය, මාවනැල්ල පදිදොර රජමහා විහාරය යන ස්ථානවල ඇති පිස්සු බලු විෂ වෙදපොත් හෙවත් ජලභීතිකා රෝග චිකිත්සා ග්‍රන්ථ කීපයක් අත්තරගම රජමහා විහාරයේ හා පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලයේ වියරු බලු විෂට බේත් පොත් දෙකක් වාර්තා වේ.

ජ්වර විධිය, උණ විධිය (කවි), උණශාන්තිය (කවි) ගඩු විධිය, ගැබ සලකුණු, ගර්බ චිකිත්සාව, ගෙඩි වෙද පොත, කුෂ්ඨ චිකිත්සා, ඇස් වෙද පොත ආදී පොත් කීපයක් ද මෙම කෞතුකාගාරයේ ඇත. මේ අතරින් උණ ශාන්තිය නමින් පත් ඉරු හයක් (6615346) සහ පත් ඉරු තුනක් (6615 (420) බැගින් වූ පොත් දෙකක් වාර්තා වේ. උණ විධිය පත් ඉරු 14 ක පොතකි (6615 (338). ගර්භ චිකිත්සාව පත් ඉරු 56 කින් ද ඇස්

වෙදපොත පත් ඉරු 54 කින් ද ගඩුවිදිය පත් ඉරු 67 කින් ද යුක්ත වේ. ගඩුවිදිය නමින් කවි පොතක් හමුවන්නේ බෙලිඅත්ත ශ්‍රී සුමංගලාරාමයෙන් පමණි. මෙම ගර්භණී චිකිත්සාවට අයත් පොත් කඹුරුපිටිය ශ්‍රී නිවාසාරාමයේ (ගර්භණී චිකිත්සාව) මීඇල්ල ගණේගොඩ පුරාණ විහාරය (ප්‍රතිසන්ධි චිකිත්සාවලිය) පල්ලේබෝවල ජයවර්ධනාරාමය (ගර්භණී චිකිත්සාව) ආදී ස්ථාන කීපයක දක්නට ලැබේ. කෝල (වලිප්පු) විධිය නමින් සිංහල පුස්කොළ පොත් දෙකක් සහ කෝල විධිය නමැති පත් ඉරු 15ක සිංහල කවි වෙදපොතක් ද වාර්තාවේ. ඊට අමතරව කෝලවිධියේ වෙදපොත (6612 (53), කෝල සන්නි විධිය (6612 (53), කෝල සන්නි වෙදපොත (6612 (38) යන ඉතා වැදගත් වෙදපොත් මෙම කෞතුකාගාරයේ තිබේ. මේ අතුරින් කෝලවිධියේ වෙදපොත පත් ඉරු 62 කින් ද කෝලසන්නි විධිය පත් ඉරු 53 කින් ද යුක්ත ය.

පශු වෙදකම ද අප රටේ දියුණුව තිබූ වෛද්‍ය ක්‍රමයකි. මේ පිළිබඳව ලියැවුණු පොත් වන ගව පිළියම, ගව රත්නය, හරක් වෙදපොත, ඇත් රත්නය, හස්ති සංග්‍රහ යන පොත් බ්‍රිතාන්‍යයන් සතු වී ඇත. මෙයින් ගවරත්නය නම් පොතේ පිටපත් අප රටට ඇත්තේ ද දෙකකි. මෙය පත් ඉරු 100 ක මහ වෙදපොතකි. එහි ප්‍රමාණය දෙස බලන විට එය සැලකිය යුතු තරමේ කරුණු සම්භාරයක් සහිත වන බව නිගමනය කළ හැකිය. තවලන්තැන්නේ සිද්ධාර්ථලෝක මහා විහාරය හා මහනුවර හයගිරි විජයසුන්දරාම පුරාණ විහාරය යන පන්සල් පොත්ගුල්හි පමණක් මෙම කෘති වාර්තා වී ඇත. ගව පිළියම නමින් පත් ඉරු 24 ක (6612 (49) සහ පත් ඉරු 18 ක (6612 (49) පොත් දෙකක් ද මෙහි තැන්පත්ව තිබේ.

1912 දී පමණ මුද්‍රණය වූ බව සිංහල සාහිත්‍ය වංශයේ (674 පිටුව) සඳහන් ගවරත්නය මෙය දැයි අපි නො දනිමු. අලි ඇතුන්ට කරන වෙදකම් දැක්වෙන පත් ඉරු 48 කින් යුත් සංස්කෘත-සිංහල බසින් ලියැවුණු ඇත් රත්නය ද ඉතාම දුර්ලභ ග්‍රන්ථයකි. (6612 (41). මෙම ග්‍රන්ථයේ ම පත් ඉරු 41 ක පොතක් 6612 (42) යටතේ සඳහන් ය. එසේ ම ඇතුන් විභාග නමින් පත් ඉරු 4 ක කුඩා සිංහල කවි පොතක් ද 6614 (12) යටතේ සඳහන්

වන අතර එය හියු නෙවිල් එකතුවේ විස්තර වේ. අද වන විට අප රටේ අලි ඇතුන් සඳහා කරන වෙදකම් සහිත පශු වෙදකම අභාවයට යමින් පවතින අතර ඒ සඳහා යම් විධිමත් සංරක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දී නැත. කෘෂි ආර්ථිකයක් සහිත ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය බවට පත් වීමේ ලා ඉවහල් වූ එක් හේතුවක් වූයේ අප රට තුළ පැවති දියුණු ගව වෙදකම බව කිව යුතු නො වේ. මෙ බඳු ග්‍රන්ථ නැවත අප රටට ගෙන්වා ගෙන ඒවායේ කරුණු පර්යේෂණයට ලක් කිරීම දේශීය ආර්ථිකයට මෙන් ම වෛද්‍යවිද්‍යාවට ද මහත් පිටිවහලක් වනු නිසැක ය.

6612 (10) යටතේ " ශාන්ති කුමාර ගුලිය " නමින් පත් ඉරු තුනක් හා "ජම්බිර කල්කය" නමින් පත් ඉරු 3 ක් 6612 (12) යටතේ වර්ග කොට ඇත. මෙය සමහර වෙද පරපුරුවල ප්‍රසිද්ධ ජම්බිර කල්කය ( දොඩම් බේත ) දැයි විමසිය යුතුය. තව ද අංක 6612 (74) යටතේ "වසූරි සංග්‍රහ රත්නය " නමින් පත් ඉරු 27 ක පොතක් දැක් වේ. අප රටේ වසූරිය පිළිබඳ ව ඇති ඉතිහාසයෙන් වාර්තා නො ලැබුණත් සමහර කාලවල වසංගතාකාරයෙන් පැතිරුණු බවට සාක්ෂි ලැබේ. රොබට් නොක්ස් සිය අත් දැකීම් විස්තර කරනුයේ වසූරියෙන් යමෙක් මිය ගියහොත් ඔහුගේ තත්වය කොතරම් උසස් වුවත් වහා වළලා දමනු ලැබේ යනුවෙනි. (An historial relation of Ceylon, pp 107 - 108 ). වසූරි රෝගය ගැන දේශීය වෛද්‍ය විද්‍යාත්මක කරුණු අධ්‍යයනය කරන අයෙකුට මෙය ඉතා වටිනා කෘතියකි. "විසපු උපත" නමින් කවි තුනක් 6615 (6) යටතේ ද "විලි රුජාව" නමින් පත් ඉරු 11 ක් 6615 (238) යටතේ ද වර්ග කොට ඇත. මේවා වෙදපොත් දැයි සැක සහිතය.

අපේ උරුමය විදේශීය කෞතුකාගාරයන්හි ප්‍රදර්ශනය වන්නේ ඔවුන්ගේ ශ්‍රී විභූතිය සරසන්නටය. අපි අපේ රටේ ම ඇති පුස්කොළ පොත් අව්වට, වැස්සට, පින්නට, දූවිල්ලට හා කාවුන්ට ගොදුරු වන්නට හැර නිහඬව සිටින්නේ ඇයි? පැරණි පොත පත හෙළි කරන්නේ අපේම අතීත ඥාන සම්භාරය බුද්ධි ප්‍රභාවයේ තරම නොවේ ද? අද අප සතුව නො මැති ශාස්ත්‍රීය පොත පත විදේශයන්හි කෞතුකාගාරවල හා පෞද්ගලික පුස්තකාලයන්හි අලංකාරය පිණිස තැන්පත්ව තිබෙනවා විය

හැකිය. ඒවා ගැන ක්‍රියාත්මක නො විමෙන් අප කරන්නේ අනාගත පරපුරේ බුද්ධිමය අයිතිවාසිකම් පැහැර ගැනීමක් විය හැකිය. ඒවා ගැන ක්‍රියාත්මක නො වීමෙන් අප කරන්නේ අනාගත පරපුරේ බුද්ධිමය අයිතිවාසිකම් පැහැර ගැනීමක් වැනිය. ඒ නිසා අපේ පුස්කොළ වෙදපොත් ඇතුළු අන් සියලු ශාස්ත්‍රීය ග්‍රන්ථයන්හි මුල් පිටපත් හෝ අනු පිටපත් හෝ ඡායා පිටපත් අප රටට ලබා ගැනීමට උත්සුක විම අත්‍යවශ්‍යය. මේ වන විට ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව යම් පමණකට මෙම කරුණ සම්බන්ධයෙන් කැපවී ඇති බවත් මෙම පුරාණ පිටපත් සංරක්ෂණයේ ලා කටයුතු කරන බවත් අසන්නට ලැබේ. ඒ සඳහා සියලු අංශයන්හි මෙන් ම උනන්දු විද්වත් පාර්ශවයන්හි සහාය ද ලැබිය යුතු ම ය. මෙබඳු සංරක්ෂණ කාර්යයක දී විවිධ ආයතන තනි තනි ව හුදකලා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක නො කර පොදු එකඟතාවකින් යුත් සමස්ත ජාතික වැඩ සටහනකට දායක විම ඉතා වැදගත්ය. යුනේස්කෝ මගින් ක්‍රියාත්මක වන අස්පර්ශනීය සංස්කෘතික උරුම (Intengible Cultural Heritage) වැඩ පිළිවෙළ සහ ලෝක මතක වැඩසටහන (Memory of the World) වැනි දීර්ඝකාලීන ව්‍යාපෘති හරහා අපේ බුද්ධිමය සම්පත් සංරක්ෂණය සඳහා ප්‍රයත්නයක් යෙදීම වහා කළ යුත්තේ එ නිසාය. නවීන තාක්ෂණය සහ විද්‍යාත්මක දැනුම ඔස්සේ මෙබඳු ව්‍යාපෘතියක් සඳහා යොදා ගත හැකි සම්පත් සහ පහසුකම් ද වර්තමානයේ සුලබ ය. බහුල ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

සෝමදාස, කේ. ඩී. (1959), **ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය,** ප්‍රථම භාගය, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, කොළඹ.

සෝමදාස, කේ. ඩී. (1964), **ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය,** ද්විතීය භාගය, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, කොළඹ.

සෝමදාස, කේ. ඩී. (1964), **ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය,** තෘතීය භාගය, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, කොළඹ.

Coomaraswamy, A. K.(1956), **Mediaeval Sinhalese Art: a monograph on mediaeval Sinhalese arts and crafts mainly as surviving in the eighteenth century with an account of the structure of society and the status of the craftsmen,** 2nd ed., Pantheon Book Inc.., New York.

De Alwis, J. (1870), **A descriptive catalogue of Sanskrit, Pali and Sinhalese literary works of Ceylon,** William Skeen (Govt. Printer), Colombo.

De Silva, P.H.D.H., (1975), **A catalogue of antiquities and other culutral objects from Sri Lanka (Ceylon) abroad,** National Museum of Sri Lanka, Colombo.

De Silva, W.A. (1938), **Catalogue of palm leaf manuscripts in the library of the Colombo Museum**, Colombo Museum, Colombo.

De Zoysa, L. (1882), **Catalogue of Pali, Sinhalese and Sanskrit manuscripts in the Ceylon Oriental Library,** George J. A. Skeen (Govt. Printer), Colombo.

De Zoysa, L. (1885), **Catalogue of Pali, Sinhalese and Sanskrit manuscripts in the temple libraries of Ceylon,** George J. A. Skeen (Govt. Printer), Colombo.

Godakumbura, C.E. (1980), **A catalogue of the Ceylonese manuscripts in Danish collections,** The Royal Library, Copenhagen.

Goonetileke, H.A.I. (1970), **A bibliography of Ceylon: a systematic guide to the literature on the land, people, history and culture published in Western languages from sixteenth Century to present day,** Inter Documentation Company, Switzerland.

Gunasekara, H.M. (1901), **List of ola manuscripts in the Museum library, Colombo, 1892 – Catalogue of Pali, Sinhalese and Sanskrit manuscripts in the Colombo Museum library,** Colombo Museum, Colombo.

Gunawardhana, S. (1997), **Palm leaf manuscripts of Sri Lanka,** Sarvodaya Vishva Lekha, Ratmalana.

Joseph, G.A. (1895), **Ola manuscripts and Government Oriental Library of Ceylon,** Museum Library, Colombo.

Reynolds, C.H.B, Wijayaratne, K.A.S., and Kulasuriya, A.S. (1981), **A catalogue of the Sinhalese manuscripts in the India office Library,** India Office Library, London.

Somadasa, K.D. (1996), **Catalogue of the Sinhalese manuscripts in the library** Fund, London.

Wickremasinghe, D.M.D.Z. (1900), **Catalogue of the Sinhalese manuscripts in the British Museum**, Longman and Company, London.

Liyanaratne, J. (1992), **Sri Lankan medical manuscripts in Bodleian Library**, *Journal of European Ayurvedic Society*,Vol. 2, p. 36-53

Liyanaratne, J. (2003), **Some Sri Lankan medical manuscripts of importance for the history of South Asian traditional medicine**, *Ayuveda Samiksha,* 1(12), p.376-384

**වෛද්‍ය ඩැනිස්ටර් එල්. පෙරේරා**



දර්ශනපති ( සමාජ විද්‍යාව ), බාහිර කථිකාචාර්ය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, දර්ශන විශාරද උපාධි අපේක්ෂක (සංස්කෘතික මානව විද්‍යාව) කැලණිය විශ්වවිද්‍යාලය, සභාපති පාරම්පරික දැනුම පිළිබඳ විද්වත් කමිටුව, සාමාජික ජාතික කමිටුව යුනෙස්කෝ ලෝකයේ මතක වැඩසටහන, සම්පත්දායක යුනෙස්කෝ අස්පර්ශනීය සංස්කෘතික උරුමය වැඩසටහන, සම්පත් දායක පාරම්පරික වෛද්‍ය දැනුම් සංරක්ෂණ ව්‍යාපෘතිය දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

# Disaster Planning in Libraries: A neglected aspect


It is now accepted that a disaster planning is a part of the preservation programme in a library. "Disaster planning" is a set of rehearsed actions which will minimize the effect of a disaster. This will also assist in restoring the library and its collections to a usable condition in as short a time as possible. The term "Disaster" covers a wide range of events, from minor incidents to full – scale emergencies. Disasters in libraries have been frequent.

*Keywords: Disaster, Disaster Planing, Document Conservation, Libraries.*

**History of library Disasters.**

In the 3rd century A.D. the renowned library of Alexandria was demolished by a fire. Now research has shown it was an act of arson. Spectacular library disaster occurred in Florence, Italy in 1966 when the Arno River destroyed the Abessarian's library. This flood was a major impetus for the development of disaster planning. Many floods and fires, specially arson occurred in U.S.A., Russia, Switzerland to name a few. On 1st July 1981, the Jaffna Library was destroyed by a fire, was a major lesson in disaster management.





**Fire damaged central library in Los Angelis library –1986**

A disaster plan is an essential element of "preservation" or prevention. The best protection against disasters is to minimize the likelihood of them happening. Disaster plans require that housekeeping is regularly carried out, that library buildings are appropritately constructed fitted out and regularly maintained and the library staff is well trained. A written plan is an essential first step in preparing for disasters.

## Developing a Disaster Plan

The main ingredients of disaster planning are preventive – preventing disasters by planning, reducing hazards, establishing procedures to cope with disasters and reactive, coping with disaster by putting into practice procedures which have been established and rehearsed many times.

General guidelines for developing a disaster plan are to accept responsibility for planning, plan in advance, use common sense, educate yourself and others about disaster planning, adapt advice to local situations and react to a disaster quickly and in accordance with a plan. The plan should if possible, be developed cooperatively by library staff. This has the added benefit of increasing the general preservation of all library staff.

## Preventive Action? What It Means?

Preventive includes actions taken to minimize the risks posed by unauthorized access, fire, flood and to minimize the damage a disaster will cause. The use of appropriate storage equipment, materials special protection to items, making security copies of important materials and also the special arrangements to ensure the safety of the library and its collections during unusual periods of increased risks such as building operations or exhibitions. A check on electricity, the roof, windows, fire

protection equipment will have to be properly carried out through professionals.

Housekeeping and building maintenance play a vital role in preventing library disasters. Regular instructions to staff in preventing fire prevention procedures, combined with regular maintenance of fire extinguishing equipments, lessens the possibility of a fire.

**The Response: The second Phase**

The response phase is concerned with producing and documenting the disaster plan and keeping that plan up-to-date.

The first steps are to form a disaster response team whose members are likely to be available at the time of an emergency, to train these people and to institute procedures to notify and assemble them rapidly when a disaster strikes. Material for priority salvage needs to be identified and marked. Documentation need to be assembled. Building floor plans and lists of people and their addresses and telephone numbers, lists of equipment and of suppliers of items needed during an emergency, such as crates, generators, contacts should be established with conservaters, and facilities in the region who can offer support in a disaster, equipments required in a disaster needs to be assembled and maintained, arrangements should be made for access to freezer capacity and a

mechanism for payment. The disaster response plan needs to be tested and updated regularly.

**Reaction Phase : - Third Phase**

The third phase is concerned with the procedures which should be followed when a disaster strikes. First steps are to raise the alarm and to assemble personnel, the next step is to ensure that the disaster site is safe to enter. Once there has been a preliminary assessment of the damage is made by the leader of the disaster response team. It is essential to estimate the extent of damage and the equipment and supplies required.

As the damage is assessed, damaged material needs to be removed. It should be racked for transporting to a safer place and recorded to be located later, a treatment area to be setup, close to the disaster site. The wet material could be dried if dryers are available.

**Recovery – The Final Phase**


The final phase is that of establishing and carrying out a program to restore to a stable and usable condition, both the disaster site and the damage of materials. It includes establishing a conservation and restoration program to recover damaged material. Decisions are required about which material needs to be restored to

usable condition first. And what the best techniques of restoring them. Advice of conservators and restorers are necessary.

**Salvage Techniques**

If the library materials are water damaged, freeze drying technique is being used since 1972, introduced by Peter Waters, where "sublimation" technique by freezing the books and paper in a commercial blast freezer at a temperature of $- 21^{\circ c}$ or lower. They can be kept in the freezer for long periods, until such time as resources are available for drying them. Frozen books are dried by placing them in a vacuum chamber where reduced pressure lowers the boiling point of water and causes the ice to evaporate without going through the liquid state.

Mould growth is found in water damaged books and records. Mould in its earlier stage could be cleaned off. The vacuum chamber could be flooded with $co_2$ (carbon dioxide) gas which removes the oxygen necessary for mould growth. Gamma radiation is also used to kill mould. Thymol fumigation is also recommended.



**Water damaged books in the Stamford Library - 1976**

Fire damage is irreparable, it is a disaster difficult to counter and salvage the material damaged badly, and the National Library should put its disaster plan in the optimum, and supervise and advise other libraries in the task of prevention, response, reaction and salvage of affected library material.

Fire, earth quakes cyclones are disaster difficult to counter and salvage the material damadge badly the national library should put its disaster plan in the optimum and supervise and advise other libraries in the tasil of prevention, respose, reaction and salvage of affected library material.

The state should provide financial assistance to the libraries, specially for meeting the disasters faced by the libraries where the intellectual heritage to be safeguarded to our future generations.

**For Further Reading**


Buchanan, Sally A. (1988), **Disaster planning, preparedness and recorvory for libraries and achives – A Ramp Study with Guidelines**, UNESCO, Paris

Fortson, Judith (1991), **Disaster planning and recovery,** Neal – Schuman, New York

Bellardo, Lewis. J. (1993), **Disaster prevention, preparedness and recovery,** paper presented at the Shanghi International Symposium, China, (1993), p. 167 -189.


## K. D. G. Wimalaratne




B. A. (Hons) Ceylon, Postgraduate Diploma, University of Padua, Italy, Ph. D Academy of Sciences, Philadelphia, Visiting Lecturer, University of Kelaniya, Former Director, Department of National Archives, Sri Lanka.

# ශ්‍රී ලංකාවේ නීතිඥයින්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීමට ඇති නීති පුස්තකාල

---

සාරාංශය

ශ්‍රී ලංකාවේ පවත්නා පුස්තකාල වර්ග අතරින් නීතිය නමැති විෂය පදනම් කොට ගත් පුස්තකාල වර්ගයක් ලෙස නීති පුස්තකාල හැඳින්විය හැක. නීතිය හා නීතිඥයා යන වචන අතර ඇත්තේ සමීප සබඳතාවකි. රටක වෙසෙන සෑම පුද්ගලයෙකුට ම රටේ ක්‍රියාත්මක නීති පද්ධතිය පිළිබඳ සාමාන්‍ය දැනුමක් හෝ තිබිය යුතුය. සමාජයේ සෑම කාර්යයක් ම නීතිමය රාමුවක් තුළ නිර්මාණය වේ. එසේ නො වුවහොත් සමාජීය ගැටුම් පැන නගියි. සමාජීය ගැටුම්වලට මූලික පදනම වී ඇත්තේ නීතිය පිළිබඳ අනවබෝධය, නීතියට ගරු නො කිරීම, නීතිය නිසිලෙස ක්‍රියාත්මක නො වීම, දඬුවම්වල ලිහිල් බව, නීතියට පිටු පෑම, පාලකයන් නීතිය අතටගෙන කටයුතු කිරීම ආදියයි. රටක් සංවර්ධනය කරා යෑමේ දී ඇතිවන ගැටලුවලට පිළියම් සපයන නීති පුස්තකාලවලින් විශාල මෙහෙයක් බලාපොරොත්තු වේ. ශ්‍රී ලංකාවේ නීති පුස්තකාල, පුස්තකාල වල

**තත්වය, නීතියේ ස්වභාවය, නීතිමය තොරතුරු මූලාශ්‍ර, පාඨක තොරතුරු අවශ්‍යතා, නීති පුස්තකාල මුහුණපාන ගැටලු, පාඨකයන් මුහුණපාන ගැටලු මෙහි දී සාකච්ඡාවට භාජනය කර තිබේ. දත්ත ගවේෂණයේ දී පුස්තකාල නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් දත්ත ලබා ගෙන තිබෙන අතර නීති පුස්තකාල ක්ෂේත්‍රයේ ගැටලු හඳුනා ගෙන ඒවාට පිළියම් යෙදීමේ වර්තමාන අවශ්‍යතාව මෙ මඟින් ඉදිරිපත් කෙරේ.**

***මූලික පද: තොරතුරු අවශ්‍යතා, නීතිමය තොරතුරු , නීති පුස්තකාල , නීතිඥයින්.***

නීතිය සහ නීතිඥයා යන වචන අතර ඇත්තේ සමීප සබඳතාවකි. නීතිය යනු පනත, ව්‍යවස්ථාව, ධර්මය, දේව ධර්මය, සූත්‍රය, නියමය, රෙගුලාසි, නියමයන් පැනවීම හෝ සමාජගත පුරුදු, ප්‍රයෝජනවත් දේ හඳුනා ගැනීම හෝ සමහර ක්‍රියාවන් තහනම් කිරීම සහ මවිත කරන දඬුවම් වලංගු කිරීම, මිනිස් ක්‍රියාකාරකම් සහ විධිමත් භාවිතයන් අතර සම්බන්ධතාව, සංවිධානගත දේශපාලන සංගම්වල බලය, සමාජයේ බලපෑම්, සංවිධානාත්මක සමාජයේ පරිපාලන ක්‍රියාවන් පිහිටුවීම, නියමිත ස්ථානයේ විරුද්ධවාදීන්ට අදාළ කරුණු දැන්වීම, යම් දෙයක් පුළුල් කිරීම හා තවත් දෙයක් සාමාන්‍ය කරලීම යනාදී වශයෙන් අර්ථ රාශියක් දැක්විය හැක. නීතිඥයා යනු නඩුවක් විරුද්ධව හසුරුවන්නා, නීතිඥවරයෙකු වශයෙන් පුරුදුවන්නා, විනිශ්චය පිළිබඳ හොඳ අවබෝධයකින් යුතුව භාජනයට පාත්‍ර වූ ප්‍රධාන ප්‍රශ්නය හොඳින් සොයා ගැනීමට හා යමක් කියා පෑමට හැකි පුද්ගලයා යනුවෙන් ද අර්ථ දැක්විය හැකි ය. නීතිඥකම මහජන වෘත්තියක් ලෙසද සැලකෙයි.

සමාජයේ සෑම පුද්ගලයෙකු ට ම නීතියෙන් තොර ව ජීවත්විය නො හැක. රටක නීති තිබූ පමණින් සමාජයට යහපතක් සිදු නො වේ. යහපත් සමාජයක් බිහිවීමට නම් රටේ පවතින නීති පද්ධතිය පිළිබඳ අවබෝධය සමාජයේ පුද්ගලයන්ට

ලබා දිය යුතු ය. සමාජගත පුද්ගලයන් මුහුණ දෙන විශාල අභියෝගය වනුයේ නීතිය පිළිබඳ දැනුවත් වීමට ඇති මාර්ග හා සන්නිවේදන පහසුකම් නො මැති වීමයි. ඇතැම් විට එම පහසුකම් තිබුණ ද නීතිමය තොරතුරු ව්‍යාප්ත වනුයේ ඉතා පසුගාමී තත්වයකිනි. සමාජගත ජනතාවගේ නීතිමය ගැටලුවලට පිළියම් යෙදීමට මූලිකත්වය ගෙන කටයුතු කරන්නේ වෘත්තීයමය වශයෙන් කටයුතු කරන නීතිඥවරුන් ය. මේ නිසා සමාජයේ සිදුවන විපර්යාසයන් පිළිබඳ ප්‍රථමයෙන් දැනුවත් විය යුත්තේ නීතිඥවරුන් ය. ඔවුන්ට සමාජ, දේශපාලනික, ආර්ථික යන සෑම විෂය ක්ෂේත්‍රය ක ම සිදුවන වෙනස්වීම් හා විපර්යාසයන් පිළිබඳ පුළුල් අවබෝධයක් අවශ්‍ය වේ. සෑම කාර්යයක් කිරීමේ දීම එය කිරීමේ සීමා හා හැකියාවන් නීතිමය තත්වයන් යටතට අයත් වේ. පුද්ගලයන් අතරත්, ආයතන අතරත් සංවිධානය වීමේ දී විවිධ මත ගැටීම් ඇති වේ. ඒවාට පිළියම් යෙදිය හැක්කේ නීතිය ඇසුරෙනි.

ලෝකයේ සෑම රටක ම පාලනය හා පැවැත්ම රඳා පවතින්නේ එම රටවල ක්‍රියාකාරිත්වයෙන් යුතු නීතියේ ආධිපත්‍ය මත ය. එක් රටක සමාජ, දේශපාලනික, ආර්ථික, සංස්කෘතික, තාක්ෂණික තත්වයන් මත ඒ ඒ රටවල විවිධ වූ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සකස් වී ඇති නීති පද්ධති එකිනෙකට වෙනස් ය. සෑම රටක ම නීති පද්ධති නිරන්තරයෙන් වෙනස්වීම්වලට භාජනය වේ. ඇතැම් රටවල නීති ඉතා දැඩිව ක්‍රියාත්මක වන අතර ඇතැම් රටවල නීති ලිහිල් ය. දිගුකාලයක සිට පැවත එන යම් නීතියක් එක් තත්පරයකින් වෙනස් විය හැක. අන් කවර පුද්ගලයෙකුට වඩා එය වැදගත් වන්නේ නීතිය හදාරන්නන්ට හා නීතිඥ වෘත්තියෙහි නියැලෙන්නන්ට ය. නීති පද්ධතිය තුළ වූ චංචල ස්වභාවය පිළිබඳ හසළ දැනුමක් ඔවුන්ට අත්‍යවශ්‍යය. නීතිඥවරුන්ගේ අභිප්‍රාය වනුයේ තමන් සතු නීතිමය අවබෝධය සහ දැනුම් සම්භාරය තුළින් අදාළ තොරතුරු නියමිත ස්ථානයේ දී ප්‍රදර්ශනය කර තම ප්‍රතිවාදී පිල පරාජය කරලීමයි. මෙහි දී ඔවුන් මුහුණ දෙන විශාල අභියෝගය වනුයේ යම් නඩුවක් එක

ම කරුණක් සඳහා තම පාක්ෂිකයන් ජයග්‍රහණය කරවීමට අවශ්‍ය සියලු තොරතුරු කිසිඳු අඩුවකින් හා ප්‍රමාදයකින් තොරව තැනට උචිත අයුරින් ප්‍රදර්ශනය කරලීමයි. මෙහි දී මෙම පක්ෂ දෙක ම එක ම ආකාරයෙන් තම අරමුණු මුදුන්පත් කර ගැනිමට විශාල සටනක යෙදෙයි. මෙහිදී ප්‍රතිවාදියා පරාජය කරවිමට නම් ඔහු සතු තොරතුරුවලට වඩා අනෙක් පුද්ගලයා තොරතුරු ඉදිරිපත් කරමින් තම කරුණු සනාථ කළ යුතුය. ඔවුන්ගේ මෙම අභිප්‍රායයන් මුදුන්පමුණුවා ගැනීම සඳහා පිහිටුවා ඇති පුස්තකාල හා තොරතුරු තැන්පත් ආයතනවලින් පූර්ණ සහායක් බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වී ඇති පුස්තකාල පද්ධතියට අනුව විශේෂ / පර්යේෂණ පුස්තකාල ගණයට ඇතුළත් කළ හැකි නීතිය නමැති පුළුල් විෂය පදනම් කරගෙන නීතිමය මූලාශ්‍ර තැන්පත් කර තොරතුරු බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් ලෙස නීති පුස්තකාල හැඳින්විය හැකිය. රාජ්‍ය හා පෞද්ගලික අංශය මඟින් ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ නීති පුස්තකාල වන්නේ නීතිපති දෙපාර්තමේන්තු පුස්තකාලය, ශ්‍රේෂ්ඨාධිකරණ පුස්තකාලය, නීති විද්‍යාල පුස්තකාලය, නීති පුස්තකාලය, නීතිඥ සංගමයේ පුස්තකාලය, නීති කෙටුම්පත් පුස්තකාලය, නීති පීඨය (කොළඹ විශ්වවිද්‍යාලය), නවෝෂන් මධ්‍යස්ථාන පුස්තකාලය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තු පුස්තකාලය, බන්ධනාගාර නීති පුස්තකාලය, මානව හිමිකම් කොමිෂන් සභා පුස්තකාලය, නීතිය හා සමාජභාරය පුස්තකාලය (Law & Society Trust), සේවා නියුක්තිකයන්ගේ සන්ධාන පුස්තකාලය (Employee Federation), මානව හිමිකම් පදනම (Human Rights Foundation) යන පුස්තකාලයි. මෙම පුස්තකාල අතරින් බොහොමයක් පුස්තකාල සංවර්ධිත මට්ටමක නො මැති අතර ඉතා කුඩා කාමරවල සුළු වශයෙන් වෘත්තීය සුදුසුකම් නො ලත් අය විසින් පවත්වාගෙන යනු ලැබේ. ඇතැම් පුස්තකාල රාජ්‍ය අනුග්‍රහය සහිතව තාක්ෂණික පහසුකම් වලින් සමන්විතව වෘත්තීය ම ය පුහුණුව ලත් පුස්තකාලයාධිපතිවරුන් විසින් පවත්වාගෙන යනු ලැබේ.

පුස්තකාලය යනු වැඩෙන ආයතනයක් ලෙස දක්වා ඇති රංගනාදන් ගේ මූලධර්මයට අනුව නීතිමය තොරතුරු රැගත් නීති පුස්තකාල ද වැඩෙන ආයතනයක් විය යුතු වේ. එක ම අරමුණු සඳහා පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා විවිධ විය හැක. නීතිය හදාරන්නන්, නීතීඥවරු, ආචාර්යවරු, නඩුකාරවරු, මෙම පාඨක සමාජයේ කොටස්කරුවෝ වෙති. පාඨක ස්වරූප විවිධ වුව ද පුස්තකාල එකතුව සංවිධානය වී ඇත්තේ සමාන තොරතුරු මූලාශ්‍රයන්ගෙනි. විශේෂයෙන් ම පනත්, හැන්සාඩ්, විවිධ නීති වාර්තා, ගැසට්, කොමිෂන් සභා වාර්තා, වාර ප්‍රකාශන සහ නීතිමය පතපොතට ප්‍රධාන තැනක් ලැබේ. පුස්තකාලවල සංවිධානය කර ඇති තොරතුරු සම්භාරයෙන් ඇතැම් විට එම තොරතුරු දේශීය නොව විදේශීය තොරතුරු ද විය හැකිය. දෙපිරිසක් අතර කරුණු දැක්වීම සමථයකට හෝ අවසාන විනිශ්චයකට එළඹෙනුයේ විනිසුරුවරුන්ගේ විනිශ්චය පදනම් කරගෙන ය. දෙපක්ෂයකින් හෙළිවන කරුණු පදනම් කරගෙන ඒවා ඔප්පු කිරීමට ඉදිරිපත් කරනු ලබන සාධක මත යම් නඩුවක අවසාන තීන්දුව ලබා දීම සිදුවන බැවින් විනිසුරුවරුන්ගේ දැනුම නීතිඥවරුන්ට වඩා ඉහළ මට්ටමක තිබිය යුතු ය. මේ සඳහා ඔවුන් දැනුම පෝෂණය කර ගනු ලබන්නේ පුස්තකාල ආශ්‍රයෙනි. නීතිඥ වෘත්තියට පිවිසීමට පෙර වෘත්තීයමය අධ්‍යාපනයක් ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාවේ දී යම් නඩුවක් එක් දිනයක දී අවසන් වීමේ දුලබතාවය සහ දිගුකලක් පුරා එය සිදුවීමේ සුලබතාවය මත පවතින නඩුවක තත්වය වෙනස් දිශාවකට යොමු කර ලීමේ හැකියාව නීතියට ඇත. නීතියට ගරු නො කිරීම, නීතියට අවනත නො වීම, නීතියට පිටුපෑමට පාලකයන්ගෙන් ලැබෙන සහාය, පාලකයන් නීතිය අතට ගෙන කටයුතු කිරීම නිසා සමාජයේ අපරාධ වැඩිවීමට මෙන් ම නඩු ගොඩ ගැසීම ද සිදු වේ. යම් වරදක් සඳහා ලැබෙන දඬුවම් දඩ අය කිරීම වර්තමාන සමාජ රටාවට නො ගැළපීම නිසා රටක් වශයෙන් සංවර්ධනය කරා යාමේ දී නීති පුස්තකාලවලට විශේෂ වගකීමක් පැවරේ.

ශ්‍රී ලංකාවේ ඇති නීති පුස්තකාල අතරින් රාජ්‍ය හා පෞද්ගලික අංශය නියෝජනය වන කොළඹ අධිකරණ සංකීර්ණයේ පිහිටි නීති පුස්තකාල වන නීතිපති දෙපාර්තමේන්තු පුස්තකාලය, ශ්‍රේෂ්ඨාධිකරණ පුස්තකාලය, නීති පුස්තකාලය හා නීති විද්‍යාල පුස්තකාලය පිළිබඳ මෙහි දී විග්‍රහ කර ඇත.

නීතිය උගන්වන ආයතන අතරින් නීති විද්‍යාලය මුල් ම ආයතනය වේ. නීති විද්‍යාල පුස්තකාලයේ ඉතිහාසය 1874 දක්වා විහිදී යන අතර නීති විද්‍යාලය සඳහා මුල්ගල තබා ඇත්තේ 1911.02.11 දින ජෝසප් හජින්සන් විසින් ය. නීති විද්‍යාලයේ ඉගෙන ගත් අය පිටවූයේ පෙරකදෝරු හෝ අධිනීතිඥවරු වශයෙනි. 1889 අංක 1 දරන ආඥා පනත යටතේ මෙම අය පුහුණු විම ආරම්භ කරන ලදී. කීර්තිමත් මනා දැනීමක් හා දක්ෂතාවක් ඇති පුද්ගලයන් නීතිඥයන් වශයෙන් පිළිගැනීමත් එලෙස බඳවා ගැනීමක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කළ හැකි බව 1913 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත මඟින් දක්වා ඇත. නීති විද්‍යාල පුස්තකාල ඉතිහාසය ද නීති විද්‍යාලය ආරම්භ වූ 1911 වර්ෂයේ දී සිදු වි ඇත. නීති විද්‍යාලයේ විදුහල්පති විසින් පත් කරන ලද පුස්තකාලයාධිපති මඟින් පුස්තකාලය පාලනය වේ. කොළඹ විශ්වවිද්‍යාලයේ හෝ විවෘත විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධිය ලබා ඇති අය ද නීති විද්‍යාලයේ අවසන් වසර සමත් විය යුතු ය. ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු යටතේ මාස 06 ක ප්‍රායෝගික පුහුණු පාඨමාලාවකින් පසු නීතිඥවරයෙකු ලෙස ඇතුළත් කර ගනු ලැබේ. රජයේ නියෝජනයක් සිදු නො වන නිසා රජයේ මූල්‍යමය ආධාර පුස්තකාලයට නො ලැබේ. නීති විද්‍යාලය මඟින් ලබා දෙන නීතිමය අධ්‍යාපනය උසාවියට සරිලන වෘත්තීයමය අධ්‍යාපනයයි. නීති විද්‍යාලයට ඇතුළත් වන සෑම ශිෂ්‍යයෙකුටම පුස්තකාල සාමාජිකත්වය හිමි වේ. පුස්තකාල සාමාජිකත්වය සඳහා මුදල් ගෙවීමට සිදු වේ. පුස්තකාලය සතියේ දිනවල සහ සෙනසුරාදා විවෘත ව තිබේ. පොත් නිකුත් කිරීම එක් දිනකට පමණක් සීමා වන අතර වැඩි වන සෑම

දිනයකටම දඩ අය කරනු ලැබේ. විද්‍යාලයේ විදුහල්පති සහ දේශකවරුන්ට මාසයක පමණ කාලයක් සඳහා පොත් නිකුත් කෙරේ. එම කාලසීමාවෙන් පසු සිහි කැඳවීම් යවනු ලැබේ. පුස්තකාලයේ බැහැරදීම්, විමර්ශන, සඟරා හා ඡායා පිටපත් යන අංශයන් තිබේ. පාඨකයන් ඡායා පිටපත් ලබා ගැනීමට වඩාත් පෙළඹේ. පුස්තකාලය සඳහා වාර්ෂිකව මුදල් වෙන් කෙරේ. නීති විද්‍යාලයේ විදුහල්පති සහ ආචාර්යවරුන්ගේ අනුමැතිය යටතේ පොත් මිල දී ගැනීම සිදුවේ. දේශීය මෙන්ම විදේශීය පොත් සමාගම්වලින් පොත් මිල දී ගනු ලැබේ. ඊට අමතර ව විවිධ දානපතියන්ගෙන් හා නීති විශාරදයන්ගෙන් ලැබෙන පරිත්‍යාගවලින් පොත් එකතුව සමන්විත වේ.

නීතිඥ වෘත්තියෙහි නියැළී සිටින සෑම නීතිවේදීයෙකුගේ ම විඥාපන අවශ්‍යතා සපුරාලීමට ස්වේච්ඡා සංගමයක් ලෙස බිහි වී ඇති ආයතනයක් ලෙස නීති පුස්තකාලය හැඳින්විය හැක. මෙම පුස්තකාලය මුල් කාලීනව හඳුන්වා ඇත්තේ කොළඹ පුස්තකාලය ලෙස ය. ඒ බව 77 නව නීති වාර්තා Read Vs. Sumsudin නඩු වාර්තාවේ සඳහන් වේ. මෙම පුස්තකාලය ආරම්භයේ සිට ම පාලනය කර ඇත්තේ ලේකම්වරයෙකු විසිනි. පුස්තකාලයේ සාමාජිකත්වය දරන නීතිඥවරුන්ගෙන් සැදුම් ලත් නීතිඥ සංගමය මඟින් පත් කරන එක් සාමාජිකයෙකු පුස්තකාලයේ ලේකම් වශයෙන් පත්වේ. ලේකම්ගේ සේවා ධූර කාලය වසරකට සීමා වේ. මෙම පුස්තකාලය රජයට සම්බන්ධයක් නො මැති පෞද්ගලික ආයතනයක් ලෙස ආරම්භ වුව ද සංවර්ධනය පසුගාමී මට්ටමක පවතී. නීතිඥ වෘත්තියෙහි යෙදී සිටින ඕනෑම පුද්ගලයෙකුට මෙම පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගත හැකි ය. පෞද්ගලික අංශයේ පුස්තකාලයක් නිසා සාමාජික මුදල් ගෙවිය යුතු වේ. සතියේ දිනවල විවෘතව පවතින අතර, පොත් නිකුත් කරන්නේ සතියක කාලයක් සඳහා යි. බැහැර හා විමර්ශන වශයෙන් වෙන වෙනම අංශ දෙකක් තිබුණ ද සෑම පොතක් ම බැහැර දෙනු ලැබේ. පොත්, සඟරා, පුවත්පත් මිල දී ගැනීම

සඳහා වෙන් කරනු ලබන මුදල් ප්‍රමාණය වර්ෂයෙන් වර්ෂයට වෙනස් වන්නේ පාඨක අරමුදල අනුව ය.

අධිකරණ අමාත්‍යාංශය යටතේ රජයේ ආයතනයක් ලෙස පාලනය වන පුස්තකාලයක් ලෙස ශ්‍රේෂ්ඨාධිකරණ පුස්තකාලය හැඳින්විය හැකිය. 1801.04.18 දින ශ්‍රේෂ්ඨාධිකරණය ආරම්භ වීමත් සමගම පුස්තකාලය ආරම්භ වී ඇත. මෙම පුස්තකාලය පරිහරණය කරන්නේ විනිසුරුවරුන් නිසා විනිසුරු පුස්තකාලය ලෙස ද හැඳින් වේ. ශ්‍රේෂ්ඨාධිකරණ /අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ තොරතුරු අවශ්‍යතා. වෘත්තීමය කටයුතුවලට මෙහෙයක් සැලසීම සඳහා මෙම පුස්තකාලය පිහිටුවා ඇත. ආරම්භයේ දී වෘත්තීමය පුස්තකාලයාධිපතිවරයෙක් නො සිටිය ද 1989 දී වෘත්තීමය පුස්තකාලයාධිපතිවරයෙක් පත් වී ඇත. සතියේ දිනවල විවෘත ව තබන අතර විනිසුරුවරුන්ගේ තොරතුරු අවශ්‍යතා අසීමිත නිසා බැහැර දෙන පොත් ප්‍රමාණයේ සීමාවක් හා නිශ්චිත කාල සීමාවක් ද නො මැත. අග්‍රවිනිශ්චයකාරතුමන් ගේ සිට සෑම විනිසුරුවරයෙක් ම මෙම පුස්තකාලයේ පාඨකයෝ වෙති.

1884.01.01 දින නීතිපති දෙපාර්තමේන්තුව ආරම්භ වී ඇතත් පුස්තකාලයේ ආරම්භය 1900 වසර දක්වා දිව යයි. විධිමත් පුස්තකාලයක් බවට පත් වී ඇත්තේ 1950 වර්ෂයේ දී ය. 1970 මුල් භාගයේ දී වෘත්තීය ම ය පුස්තකාලයාධිපතිවරයෙකු පත් වී ඇත. නීතිපති දෙපාර්තමේන්තුවේ සේවය කරන නීතිපති, සොලිසිටර් ජෙනරාල්, අතිරේක සොලිසිටර් ජෙනරාල්, නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්, ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ, රජයේ අධිනීතිඥ, රාජ නීතිඥ, ජ්‍යෙෂ්ඨ සහකාර රජයේ නීතිඥයන් සහ රජයේ සහකාර නීතිඥයන් මෙම පුස්තකාලයේ පාඨකයෝ වෙති. පොත් නිකුත් කිරීම සති දෙකක් සඳහා වුව ද නිකුත් කරන පොත් ප්‍රමාණයේ සීමාවක් නො මැත. පොත් සඳහා දඩ අය නො කරයි. බැහැර දෙන අංශය, සඟරා, විමර්ශන යනුවෙන් වෙන ම අංශ තිබුණ ද සෑම පොතක් ම නිකුත් කරයි. සතියේ දිනවල විවෘත ව තබනු ලැබේ.

නීතිමය තොරතුරු අඩංගු පොත්, දේශීය නීති වාර්තා, විදේශීය නීති වාර්තා, සඟරා, පනත්, පනත් කෙටුම්පත්, කොමිෂන් සභා වාර්තා, හැන්සාඩ්, ගැසට්, රජයේ ප්‍රකාශන වාර්තා, පුවත්පත් යනාදී මූලාශ්‍රයන්ගෙන් පුස්තකාල එකතුව සමන්විත වේ.

සෑම නීති පුස්තකාලයක ම දැකිය හැකි නීති මූලාශ්‍ර :-

දේශීය:-

පනත්, පනත් කෙටුම්පත්, හැන්සාඩ් (පාර්ලිමේන්තු විවාද) ගැසට්, සැසි වාර්තා, ශ්‍රී ලංකා නීති වාර්තා, නව නීති වාර්තා, අභියාචනා නීති වාර්තා, නඩු තීන්දු, Colombo Applete Law Reports, Sriskantha Law Reports, Legislative Enactments of Ceylon, Decisions of the Supreme Court on Parliamentary Bills, Bar Association Law Journals, Law College Law Review, Supreme Court Rules, Sri Lanka Journals of International Law, Bar Association Law Journal, Law College Law Review, Attonery Generals Law Review, Law & Society Trust Review.

විදේශීය:-

All England Law Reports , All England Legal Opinion, All Indian Law Reports, Appeal Case Law Reports, Australian Law Journals,

British Tax Review, Cambridge Law Journals, Chancary Division,

Commonwealth Law Bulletin, Commonwealth Law Reports, Criminal Appeal Reports, Criminal Law

Journal of India, Criminal Law Review, Forms & Procedents.

ශ්‍රී ලංකාව වැනි රටක බලය පවතින පක්ෂය විසින් ගෙන එන විවිධ නීති හේතුවෙන් නීති පද්ධතිය ශක්තිමත් වේ. මෙම නීති ගෙන එන්නේ පනත් වලිනි. එම පනත් පාර්ලිමේන්තුවේ සම්මත විය යුතු ය. මෙසේ සම්මත කර ගන්නා පනත්වලට පසු කාලීනව සංශෝධන එක් කරනු ලැබේ. කලින් තිබූ පනතේ වගන්තියක් හෝ වගන්ති කිහිපයක් මෙසේ සංශෝධනවලට ලක් විය හැකි ය. පනත මුළුමනින් ම අහෝසි වී ඒ වෙනුවට අලුත් පනතක් ගෙන ආ හැකිය. කලින් තිබූ පනතේ නම නොව වෙනත් නමකින් අලුත් පනත බිහිවිය හැකිය. උදාහරණ වශයෙන් 1938 අංක 51 දරන සමාගම් පනත ගත් වීට පසුකාලීන වර්ෂවල දී සංශෝධන එක් වි ඇත. නමුත් 1982 වර්ෂය වන විට 17/1982 යනුවෙන් අලුතින් සමාගම් පනතක් බිහි විය. එම පනත මඟින් කලින් තිබු සමාගම් පනත හා එහි සංශෝධන අවලංගු විය. 17/1982 යන නව පනතට 33/1991 යනුවෙන් නැවතත් සංශෝධනයක් එක් විය. මෙයින් පැහැදිලි වනුයේ වලංගුව පවතින නීතියක් සංශෝධනය විම සහ අවලංගු විම නිතර ම සිදු විය හැකි බවයි. යම් පනතකට සංශෝධන වැඩි ප්‍රමාණයක් බිහි වීම තුළින් පැහැදිලි වනුයේ එම පනත සමාජයේ ගැටලුවලට කොතරම් දුරට භාජනය වී තිබේද යන්න හා කලින් තිබූ පනතේ දුර්වලතාවන් ය.

ඇතැම් පනත් බිහි වු දින සිට කිසිඳු සංශෝධනයකට ලක් වී නොමැත. උදාහරණ ලෙස ගුවන් යානාවලට එරෙහි වූ වැරදි 24/1982 පනත සංශෝධනයට ලක් වී නො මැත. ඇතැම් උසාවි නියෝග නිසා ද නීතිමය පසුබිම තුළ සමාජයේ අවධානය නීතිය කෙරෙහි යොමු වේ. සමාජය නීතියක් දැන ගන්නේ උසාවි තීන්දු තුළිනි. නඩුවක් අවසන් විමේ කාල පරාසය තුළ දී නඩුවක පවතින තත්වය බිහිවන විවිධ පනත් වලින් නො සිතු විරූ දිසාවකට ගමන් කළ හැකිය.

රටකට ඉතා ම වැදගත් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගත් විට එයට සංශෝධන දෙකක් එම කාලයේ දී එක් වී තිබේ. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ වන විට සංශෝධන 18 ක් සිදු වී තිබේ. ඉදිරියේ දී මේ සඳහා සංශෝධන එක්වීම, නො වීම හෝ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් විය හැකිය. එය ස්ථිර ව ම පැවසීම කිසිවෙකුටත් නිගමනය කළ නො හැකි කරුණකි.

නීතිමය තොරතුරු බිහිවන තවත් මාධ්‍යයක් වන්නේ ගැසට් නිවේදනයි. ගැසට් නිවේදන මඟින් නීතිමය තොරතුරු වෙනස් වන අතර නඩුවල දී අවශ්‍ය විය හැක්කේ එම ගැසට් නිවේදනයන් ය. යම් ගැසට් පත්‍රයක පළ කරන නිවේදනයක් තවත් ගැසට් පත්‍රයකින් අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම සිදු කළ හැකිය.

හැන්සාඩ් (පාර්ලිමේන්තු විවාද) ද නීතිමය තොරතුරු මූලාශ්‍රයකි. පාර්ලිමේන්තුවේ කටයුතු වාර්තා ගත වන නිල වාර්තාව ලෙස හැන්සාඩ් වාර්තා හැඳින්විය හැකිය. මෙහි නිවේදන / ප්‍රශ්නවලට වාචික පිළිතුරු, වරප්‍රසාද, විවිධ පනත්, පනත් කෙටුම්පත් යනාදි පාර්ලිමේන්තුවේ සාකච්ඡා වන සියල්ල වාර්තාගත වේ.

උසාවියේ විභාග වන නඩුවල අවසාන තීන්දු මඟින් නීතිය විදහා දක්වේ. අවසාන තීන්දු මඟින් නීතිය කිසියම් සිද්ධියක දී හසුරුවා ඇති ආකාරය විදහා දක්වේ. මෙම නඩු තීන්දු පවත්නා නඩු සඳහා මෙන් ම අනාගත නඩු සඳහා ද වැදගත් වේ. බොහෝ නඩු ඉතා ප්‍රසිද්ධ වී ඇත්තේ එම නඩුවට පෙනී සිටි නීතිඥයා නඩුව හසුරුවා ඇති ආකාරය මෙන් ම නඩුවේ අවසාන තීන්දුව හේතුවෙනි. මෙම නඩු පසුකාලීනව නීති වාර්තාවල වාර්තාගත වේ.

නීතිමය තොරතුරු අඩංගු පෙළ පොත්වල ද විශේෂත්වය වන්නේ ඒවා නිතරම සංස්කරණවලට ලක් වීමයි. එයින් පැහැදිලි වන්නේ ද නීතිමය තොරතුරු නිතර වෙනස් වන බවයි.

බොහෝ නීති පොත්වල සිටින්නේ සංස්කාරකවරුයි. මෙසේ සංස්කරණවලට ලක්වීම නිසා පැරණි සංස්කරණ පාඨක පරිහරණයෙන් ඉවත් වේ. නමුත් එම පොත් පුස්තකාලවලින් ඉවත් කළ නො හැක්කේ ඇතැම් නඩු සඳහා පැරණි සංස්කරණ ඉවහල් වන බැවිනි.

Wod :- The principle and proceedents of the art of cross examination / Aiyar & Aiyar 10th ed. / B.K. Somasekara

Guide to the companies act / Ramaiya, A; 16th ed. / Chandachud, and Dugar.

Code of Criminal Procedure / Sohoni, 20th ed. / Gopal, R.

Principal of Mohaomeda Law / Mull, D.F; 19th ed. / Hidayatullah, M.

නීතිඥයින්ට වැදගත් වන තවත් මූලාශ්‍රයක් වන්නේ ශබ්ද කෝෂයි. ශබ්ද කෝෂවල වචන කෙරෙහි ඔවුහු වැඩි අවධානයක් යොමු කරති. සෑම උසාවියක් ම පිළිගන්නේ ශබ්ද කෝෂවල ඇති නිර්වචනයන් ය. මේ නිසා සෑම නීති පුස්තකාලයක ම විවිධ වර්ගයේ ශබ්ද කෝෂ තිබිය යුතු ය. පාරිභාෂික ශබ්ද මාලාවේ ද යම්කිසි විෂයක භාවිත තාක්ෂණික වචනයක අදහස දැක්වීමට හෝ එම වචනයට වෙනත් භාෂාවකින් ඇති තාක්ෂණික වචනය ඉදිරිපත් කෙරෙයි.

නීතිය විෂය ආශ්‍රයෙන් ඇති අනුක්‍රමණිකා ඔස්සේ තොරතුරු සෙවීමට නීතිඥයන් පෙළඹෙන්නේ නඩුවලට අවශ්‍ය තොරතුරු වෙත පහසුවෙන් යොමු වීමට හැකි වීමයි.

නීතිඥයන්ට දේශීය මෙන් ම විදේශීය නීති තොරතුරු මූලාශ්‍ර ද එක හා සමාන ලෙස වැදගත් ය. ශ්‍රී ලංකාවේ ඇති

නීති පුස්තකාලවලට ලෝකයේ බිහිවන සෑම නීති මූලාශ්‍රයක් ම අත්පත් කර ගැනීමට හැකියාවක් නො මැත.

## පුස්තකාල මුහුණපාන ගැටලු

- සීමිත මුදල් ප්‍රතිපාදන

නීති පුස්තකාල පරිහරණය කරන පාඨක සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යාමේ ප්‍රවණතාව මත පාඨක අවශ්‍යතා වැඩි විය යුතු වුව ද නීති පුස්තකාල සඳහා ලැබෙන සීමිත මුදල් ප්‍රතිපාදන හමුවේ එය සිදු කළ නො හැක. පුස්තකාල සඳහා වෙන් කරන ප්‍රතිපාදන කපා හැරීම පුස්තකාල මුහුණ දෙන විශාල අභියෝගයකි. නීති පොත්වල මිල අනෙකුත් විෂය පොත් වල මිලට වඩා අධික ය. පොත් ප්‍රකාශන සමාගම් අතර ඇති තරඟකාරිත්වය නිසා හෝ ප්‍රකාශන සුලභ ව සිදු වුව ද පොත්වල මිල පහළ යාමක් දැකිය නො හැක. පුස්තකාල සඳහා වාර්ෂික ව වෙන් කරන මුදල් ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක් වෙන් කළ යුත්තේ වාර සඟරා සඳහාය. වාර සඟරා දායක මුදල් කාලයෙන් කාලයට වෙනස් වේ. සඟරා දායක මුදල් වෙනස් වීම නිසා පොත් සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය තවත් අඩු වේ. වාර සඟරා මිල ඉහළ යාම නිසා ඇතැම් නීති වාර්තා හා සඟරා මිල දී ගැනීම නතර කිරීමට පවා නීති පුස්තකාල පෙළඹී තිබේ. කාලීන සඟරා කලාප වශයෙන් මිල දී ගැනීමේ දී වෙන් කළ යුතු මුදල් ප්‍රමාණය විශාල ය. මෙම සඟරා කලාප වශයෙන් වසරක් අවසානයේ බැඳුම් පොතක් වශයෙන් ලබාගන්නේ නම් වෙන් කළ යුතු මුදල් ප්‍රමාණය අවම මට්ටමක පවතින බැවින් කාලීන සඟරා පුස්තකාලවලට ලබා ගැනීමට නො හැකි වී තිබේ.

- කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නො වීම

පුස්තකාලය පරිහරණය කරන පාඨකයින් ප්‍රමාණය අනුව පුස්තකාල කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නො වේ. පාඨකයින්ගේ අවශ්‍යතා විවිධ නිසා ඒ සෑම පාඨකයෙකුගේ ම අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පුස්තකාලයක සිටිය යුතු ය. නමුත් ඇතැම් පුස්තකාලවල වෘත්තීය පුස්තකාලයාධිපතිවරු නො මැති නිසා පුස්තකාල කටයුතු ද ක්‍රමවත් නො වේ.

- උපකරණ හා පහසුකම් නො මැති වීම

බොහෝ පුස්තකාලවල ප්‍රමාණවත් රාක්ක, කැබිනෙට්ටු, පරිගණක, දුරකථන, ඡායා පිටපත් යන්ත්‍ර, විද්‍යුත් තැපෑල, ෆැක්ස් පහසුකම් නො මැති අතර ඡායා පිටපත් යන්ත්‍ර තිබුණ ද ඒ සඳහා ගාස්තු අය කරන පුස්තකාල ද හඳුනාගත හැකිය.

**තාක්ෂණික සේවා ගැටලු**

- පුස්තකාල සඳහා සීමිත ඉඩකඩ පහසුකම්

පුස්තකාල පොත් එකතුව දිනෙන් දින සංවිධානය කිරීමේ දී ඒවා තැන්පත් කරන, රාක්ක, කබඩ්, අල්මාරි යනාදිය පුස්තකාලයට අත්පත් කර ගැනීමට ක්‍රියා නො කරයි. මේ නිසා පොත් තැන්පත් කිරීමට ඇති ඉඩකඩ ඇහිරී යයි. බොහෝ පුස්තකාල වල පොත් ගොඩ ගසා තිබෙන අතර පොත් සොයා ගැනීම ද අසීරු වේ. පොත් රාක්කවල පොත් තද බද වන ලෙස තැන්පත් කර තැබීමෙන් පොත්වලට හානි සිදු වීමට ඇති අවස්ථා ද සුලබය. මෙම පුස්තකාලවල අපහරණය සිදු නො වන නිසා පොත් තැන්පත් කිරීමේ දුෂ්කරතා මතු වේ. නීති පොත්වල විශේෂත්වය වන්නේ නිතර ම අලුත් සංස්කරණ බිහිවීමයි. ඇතැම් නඩු සඳහා අවශ්‍ය වන්නේ පැරණි සංස්කරණයි.

එමෙන් ම පැරණි සංස්කරණ හා අලුත් සංස්කරණ අතර ඇති වෙනස්කම් පිළිබඳ සසඳා බලනු ලැබේ. පැරණි සංස්කරණ වලින් පොත් රාක්ක පිරී යන විට නව ප්‍රතිග්‍රහණ තැන්පත් කිරීමේ ගැටලු ඇති වේ. පුස්තකාල සඳහා වෙන ම ගොඩනැගිල්ලක් හෝ නව සැලැස්මකින් යුතු ගොඩනැගිල්ලක් ලබා දීමට පුස්තකාල අධිකාරිය ක්‍රියා නො කිරීම ද පුස්තකාල මුහුණ දෙන ප්‍රධාන අභියෝගයකි. තනි පැත්තේ රාක්ක වෙනුවට දෙපැත්ත විවෘත රාක්ක භාවිතය, පුස්තකාල ඉඩ ඇහිරී නො යන ලෙස ජංගම රාක්ක සවි කිරීම, පෙළපොත් වෙනුවට සංයුක්ත තැටි එකතුවක් සංවිධානය කිරීම තුළින් පුස්තකාල ඉඩකඩ ප්‍රශ්නයට පිළියම් යෙදිය හැකි ය. මේ සඳහා අවශ්‍ය පරිගණක පහසුකම් නො මැතිවීම පුස්තකාලවලට ගැටලුවකි.

- ප්‍රතිග්‍රහණ දුෂ්කරතා

පාඨකයාගේ විෂය (සිවිල්, අපරාධ) අනුව මෙන් ම අදහස් හා යෝජනා ද සැලකිල්ලට ගෙන පොත් තේරීම සිදු කළ යුතු ය. පාඨකයින් නිතර ම ඉල්ලන ප්‍රකාශන, නැවත භාර දීමට මැලිවන ප්‍රකාශන, වැඩි ප්‍රමාණයක් නිකුත්වන ප්‍රකාශන පිළිබඳ වාර්තා තබා ගත යුතුය. එම වාර්තා නිතර සමීක්ෂණයට ලක් කළ යුතු ය. මෙම හේතුව නිසා පොත් ප්‍රතිග්‍රහණය කිරීමේ දී සෑහෙන කාලයක් ගත වේ. දේශීය පොත් සමාගම්වලට වඩා නීති පොත් හා සඟරා ප්‍රකාශයට පත් කරන්නේ විදේශීය පොත් සමාගම් විසිනි. විදේශීය පොත් සමාගම් සමඟ කටයුතු කිරීමේ දී විවිධ ගිවිසුම්වලට එළඹීමට සිදු වේ. එයට හේතු වන්නේ විදේශීය පොත් සමාගම් සමඟ කටයුතු කිරීමේ දී කාලයක් ගත වීමයි.

- සංරක්ෂණය

පුහුණු ශ්‍රමිකයින් නො මැතිකම හේතුවෙන් පුස්තකාල සංරක්ෂණ ගැටලු මතු වී තිබේ. යම් තරමක හෝ සංරක්ෂණයක් සිදු නොවන නිසා වටිනා, දුලබ පොත් පරිහරණය කිරීමට

අපහසු තත්වයට පත් වී දිරා ගොස් තිබේ. පොත්වල මෙන් ම රාක්කවල දූවිලි පිස දැමීම, පුස්තකාල වායුසමීකරණය කිරීම, දූෂිත වාතය ඇතුල් වීම වැළැක්වීමට පියවර ගැනීම ආදී සංරක්ෂණ කටයුතු කිරීමට සෑම පුස්තකාලයක ට ම හැකියාවක් ඇත. මේ සඳහා සංරක්ෂණ කාලසටහන් පවත්වා ගෙන යා යුතු ය.

- අපහරණ ගැටලු

පොත් එකතුව කළමනාකරණය කිරීමේ දී පුස්තකාලයට පොත් අත්පත් කරගන්නා ලෙස ම අපහරණය ද සිදු විය යුතුය. පොත් අපහරණය කිරීමේ දී ඒ ඒ පුස්තකාලවලට අදාළ අපහරණ ප්‍රතිපත්තියක් සකස් කළ යුතු ය. මෙහි දී පුස්තකාලයේ ස්වභාවය හා පාඨක අවශ්‍යතා ගැන සලකා බැලිය යුතු ය. අපහරණය සඳහා ඒ ඒ විෂයේ විෂය විශේෂඥයන් සහභාගි කර ගත යුතුය. නමුත් කිසිම නීති පුස්තකාලයක් මෙතෙක් අපහරණ කටයුතු සඳහා පෙළඹී නො මැත. පොත් තැන්පත් කිරීම, රාක්ක ගත කිරීම, සංරක්ෂණය කිරීම, පාඨක පරිහරණයට ලබා දීම, ඡායා පිටපත් කිරීම, බැහැර දීම යනාදිය නිසි පරිදි පවත්වා ගෙන යාමට කටයුතු නියමිත පරිදි සිදු නො වීම බලපා තිබේ.

**කළමනාකරණ ගැටලු**

- ඉහළ අධිකාරිය සමඟ සේවය කිරීමේ දුෂ්කරතා

පුස්තකාලය මඟින් සැලසිය යුතු සේවා පිළිබඳ මනා අවබෝධයක් පුස්තකාල කමිටුව සතු නො වේ. පුස්තකාලය පාලනය වන්නේ ඉහළ අධිකාරිය මඟින් ගන්නා තීරණ මතය. පුස්තකාල සේවාව පිළිබඳ සුබවාදී ආකල්ප නො දැරීම, පුස්තකාල පිළිබඳ දරන ආකල්ප වෙනස් කළ නොහැකි වීම පුස්තකාල අවශ්‍යතා පිළිබඳ දැඩි අවධානයක් යොමු නො කිරීම නිසා පුස්තකාල සේවාව දුර්වල මට්ටමක පවතී.

පුස්තකාලයාධිපති විසින් ගන්නා තීරණවලට කමිටුවේ ඇතැම් පුද්ගලයන් එකඟ නො වන බව ද පුස්තකාලයාධිපතිවරුන්ගේ අදහස වේ.

- පාඨක සේවා ගැටලු

නීති පුස්තකාල පරිහරණය කරන පාඨකයින් නීතිවේදීන් නිසා ඔවුන් සමඟ රාජකාරි කටයුතු කිරීම තරමක අපහසු කාර්යයක් වී තිබේ. මෙම පාඨකයින් පුස්තකාල නීතිවලට අවනත කර ගැනීම අපහසුය. යම් තොරතුරු අවශ්‍යතා පුස්තකාලය වෙත දැන් වූ විට එය කෙසේ හෝ ලබා ගැනීම මෙම පාඨකයින්ගේ අපේක්ෂාව වේ. නඩුවක් එක් දිනයක දී අවසන් නො වීම නිසා නියමිත කාලයට පොත් භාර නො දීම මෙන් ම වෙනත් පාඨකයෙකුට අවශ්‍ය වූ වීට පොත් ලබා ගැනීමට නො හැකිවීම යම් තොරතුරක් මුද්‍රණය වූ සැනින් රජයේ මුද්‍රණාලය හෝ රජයේ ප්‍රකාශන කාර්යාංශය වෙත ගොස් ලබා ගැනීමට පුස්තකාල කාර්ය මණ්ඩලයට සිදු වේ.

- තොරතුරු හැසිරවීමේ දුෂ්කරතා

පනතක් පාර්ලිමේන්තුවේ සම්මත වීමෙන් පසුව මුද්‍රණය වීමට පෙර පුස්තකාලවලින් ලබා ගැනීමට උත්සාහ කරන පාඨකයින් ද මේ අතර ඇත. මෙම පනත් මුද්‍රණය වූ සැනින් පුස්තකාලයට ප්‍රතිග්‍රහණය කිරීමට රජයේ මුද්‍රණාලය වෙත යෑමට පුස්තකාලයාධිපතිවරුන්ට සිදු වේ.

- තොරතුරු ලබා දීමේ සීමාවන් දැක්වීමේ අපහසුතා

එක් තොරතුරු මූලාශ්‍රයක අඩංගු විමර්ශන ඔස්සේ තවත් තොරතුරු සොයා ගැනීමට පාඨකයන් පෙළඹෙන්නේ එම තොරතුරු ඉතා වැදගත් වීම නිසාය. දේශීය තොරතුරු මූලාශ්‍ර මෙන් ම විදේශීය තොරතුරු මූලාශ්‍ර එක වීට කිහිපයක් අවශ්‍ය විය හැක.

- පුස්තකාල ද්‍රව්‍යවලට සිදුවන හානි

පාඨකයා පුස්තකාල ද්‍රව්‍යවල කරන පිටු කැඩීම, පොත්වල පෑන්, පැන්සල්වලින් පාට කිරීම, නැමීම, ටැග් දැමීම, පාට කොල පොත් තුළ දැමීම මඟින් හානි වීම, උසාවිවල පොත් අතපසුකොට ඒම, වාහනවල නුසුදුසු ස්ථානවල තැන්පත් කිරීම, හිතවතුන්ට පොත් ලබා දීම, යනා දී නො යෙකුත් කරුණු නිසා අලාභානි සිදු වේ. නීති වාර්තාවල ඇති ඇතැම් නඩු උසාවිය සඳහා ඉදිරිපත් කිරීමේ දී අවශ්‍ය ස්ථානයට ටැග් දැමීම සිදු කරනු ලැබේ. ඡායා පිටපත් කිරීම නිසා පොත් කැඩී බිඳී යාම සිදු වේ.

- නියමිත දිනට පොත් ආපසු බාර නො දීම

දඩ අය නො කරන පුස්තකාලවල නියමිත පරිදි පොත් ආපසු භාර දීම සිදු නො වේ. ඉතා දුර්ලභ හා ඉතා ප්‍රසිද්ධ නඩු තීන්දුවක් ලැබුණු විට එම පොත් අතින් අත හුවමාරු කර ගැනීම නිසා ද නියමිත දිනට භාර නො දෙයි. එමෙන් ම යම් නඩුවක් සඳහා ඉදිරිපත් කරන නඩු වාර්තා එම නඩුව අවසන් වන තුරු පුස්තකාලයට භාර නො දෙයි. විදේශ සංචාරවලට යෑමේදී පුස්තකාල පොත් භාර නො දීම නිසා පුස්තකාල පරිහරණය කරන පාඨකයින් මෙන්ම පුස්තකාලයාධිපතිවරු ද නොයෙකුත් දුෂ්කරතාවන්ට මුහුණ දෙනු ලැබේ.

## නීති පුස්තකාලවලට ගත හැකි ක්‍රියා මාර්ග

පුස්තකාල නීති සකස් කර එහි වැදගත්කම අවබෝධ කර දී නීති කඩ කරන්නන්ට ඒ සඳහා දඬුවම් හා දඩ අයකිරීම, පුස්තකාල සේවාවේ අගය හා වටිනාකම් පිළිබඳ ඉහළ අධිකාරිය හා පාඨකයන් දැනුවත් කිරීම, පුස්තකාල සේවාව සඳහා වාර්තා පිළියෙල කිරීම, පුස්තකාලවල අඩුලුහුඬුකම් පිළිබඳ අවබෝධයක් ඉහළ අධිකාරියට ලබාදීම ආදිය සිදු කළ හැකිය.

- පාඨක අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

පාඨක අධ්‍යාපනයට පාඨකයා යොමු කරවීම, සරල හා පාඨකයාට පහසු වැඩ සටහන් සකස් කිරීම, කාලයෙන් කාලයට එම වැඩ සටහන් වෙනස් කිරීම, පුස්තකාල කමිටු හා පාඨක සංගම් ඇති කිරීම, සංවිධානාත්මක පුස්තකාල කමිටු ඇති කිරීම සිදු කළ හැකිය. කමිටුව මෙහි දී ක්‍රියාකාරිත්වයෙන් යුක්ත විය යුතුය. පාඨක සංගම් හරහා පුස්තකාලයේ අඩුපාඩු සකස් කර ගත යුතුය.

- අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

අන්තර් පුස්තකාල සහයෝගිතා ක්‍රියාත්මක නො කළ ද පුස්තකාල සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, පුස්තකාල මුහුණ දෙන විශාල ත ම අභියෝගවලට ප්‍රධාන ත ම පිළියම වන්නේ අන්තර් පුස්තකාල පිරුළු සේවාවයි. පුස්තකාල අතර සහයෝගිතාව වර්ධනය වන්නේ ද සමඟිව කටයුතු කිරීම තුළිනි.

- තොරතුරු ජාලවලට සම්බන්ධ වීම

සාම්ප්‍රදායික ක්‍රම නොව නවීන තාක්‍ෂණික ක්‍රම යොදා ගනිමින් සංයුක්ත තැටි භාවිත කිරීම, පුස්තකාල පද්ධතිවලට සම්බන්ධ වීම, පුස්තකාල කාර්ය මණ්ඩලය දිරි ගැන්වීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, පුස්තකාල කාර්ය මණ්ඩල රැස්වීම් පැවැත්වීම, සේවකයන්ගේ ගැටලු සාකච්ඡා කිරීම, සේවකයන්ව අගය කිරීම, සෑම සේවකයෙක් ම සමානත්වයෙන් සැලකීම, පුස්තකාල පිරිසිදුකම රැක ගැනීම සඳහා පියවර ගැනීම, පොත්වල දූවිලි පිස දැමීම, පාඨකයන්ගේ සිත් ඇදගන්නා ලෙස පුස්තකාලය සකස් කිරීම, පාඨකයන්ගේ අදහස් විමසීම්වලට අනුව තම පුස්තකාල සේවාවන් ක්‍රියාත්මක කරලීම, ජාතික පුස්තකාලය හා ජාතික ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණාලය, රජයේ ප්‍රකාශන කාර්යාංශය වැනි ආයතන

සමඟ සමීප සබඳතා පැවැත්වීම. පාඨක තොරතුරු අවශ්‍යතා පිළිබඳ නියමිත කාලයකට වරක් සමීක්ෂණය කිරීම, පාඨකයන් සතියකට, මාසයකට, වසරකට බැහැර ගෙන ගිය පොත් ප්‍රමාණය ආපසු බාර දීම යනාදිය පිළිබඳ සටහන් තබා ගැනීම. නව ප්‍රතිග්‍රහණ පාඨකයන්ට දැනුම්දීම, දැන්වීම් පුවරු සේවා, වර්ගීකරණ ක්‍රම, සූචිකරණ ක්‍රම, ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්ති අනුගමනය කිරීම, පුස්තකාලයේ පිරිසිදු බව, සිත් ගන්නා සුළු බව, නවීන උපකරණ භාවිතය, පුස්තකාලය තුළ නිරන්තර පරිහරණයට සුදුසු වටපිටාවක් සකස් කිරීම.

## පාඨකයන්ගේ ගැටලු

පුස්තකාලය සැකැස්ම හා නිර්මාණය ගැන සාකච්ඡා කිරීමේ දී පුස්තකාලයේ අභ්‍යන්තර මෙන් ම බාහිර පෙනුම ද හුදු පෞරාණික බවක් ගෙන දෙයි. අතීතයේ සිට ම පැවත එන ගොඩනැගිලිවල පුස්තකාල පවත්වාගෙන යනු ලැබේ. නවීන මේස, පුටු, රාක්ක කබඩ් භාවිත නො කිරීම. උපකරණවල සිත් ගන්නා සුළු බවක් නො මැති වීම ද විශේෂත්වයකි.

නීති පුස්තකාල පරිහරණය කරන පාඨකයන්ගේ විඥාපන අවශ්‍යතාවලට සරිලන ලෙස පුස්තකාල ගොඩනංවා නො මැති බව සෑම නීති පුස්තකාලයක් ම දෙස බැලීමේදී පැහැදිලි වේ. නීති පුස්තකාලවල තොරතුරු සංවිධානයේ ක්‍රමවත් බවක් නො විම, පාඨකයන් ට තමන් ම තොරතුරු ගවේෂණය කිරීමේ දී තොරතුරු ඇති ස්ථානවලින් සොයා ගැනීම දුෂ්කරය. තොරතුරු විසිරයාම, ක්ෂණික තොරතුරු සොයා ගැනීමේ දුෂ්කරතාව, තොරතුරු සංවිධානය කර ඇති ආකාරය පිළිබඳ පාඨකයා දැනුවත් නො කිරීම, පාඨක අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක නො කිරීම, පුස්තකාල වර්ගීකරණය, සූචිය පිළිබඳ අවබෝධයක් නො මැති වීම, පොත්පත් වීධිමත් ලෙස රාක්ක ගත නො කිරීම, භාවිත තාක්ෂණික ක්‍රමවලට

පුස්තකාලය සකස් කර නො තිබීම, තමන් සොයන තොරතුරු පුස්තකාලයේ නො මැති වීම වැනි ගැටලුවලට පාඨකයෝ මුහුණ දෙති. මේ නිසා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට හා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට පාඨකයෝ යොමු වෙති. නීතිඥවරු වැඩි ප්‍රමාණයක් පුස්තකාලයාධිපති මඟින් වෙනත් පුස්තකාලවලින් සේවා ලබා ගැනීම සිදුවේ. නීති පුස්තකාලවල ඇති සූචිය යාවත්කාලීන වී නො මැති නිසා පුස්තකාල සූචිය කෙරෙහි පාඨක විශ්වාසය ද බිඳ වැටී ඇත .

වර්තමාන පුස්තකාලවල අන්තර්ජාල පහසුකම් තිබීම අත්‍යවශ්‍ය සාධකයක් ලෙස සලකනු ලැබේ. නමුත් නීති පුස්තකාල අතරින් අන්තර්ජාල පහසුකම් පවතින්නේ පුස්තකාල කිහිපයක පමණි.

ඇතැම් නීති පුස්තකාලවල පොත්, සඟරා ආදිය බැහැරගෙන යාමට අවස්ථාව ලබා නො දෙයි. විමර්ශනයට පමණක් වෙන් කිරීම නිසා උසාවිය සඳහා ඉදිරිපත් කළ යුතු අත්‍යවශ්‍ය තොරතුරු මූලාශ්‍ර මඟ හැරී යයි. එවිට පාඨකයන්ට වෘත්තීය බාධා සිදු වේ. නඩුවක් එක් දිනක දී අවසන් නො වීම හේතුවෙන් පුස්තකාලයෙන් බැහැර දෙන කාල සීමාව පාඨකයන්ට ප්‍රමාණවත් නො වේ. වෘත්තීය කටයුතු සඳහා බොහෝ වේලාවක් ගත කිරීමට සිදුවන හෙයින් පුස්තකාලය පරිහරණයට ලැබෙන්නේ සීමිත කාලයකි. පාඨකයන් ට පුස්තකාලය පරිහරණය කළ හැකි වේලාව ට බොහෝවිට පුස්තකාලය වසා තිබේ.

නීති තොරතුරු මූලාශ්‍ර සංරක්ෂණය නො කිරීම නිසා අනාගතයේ දී නීතිය හදාරන සිසුන්ට විශාල අසාධාරණයක් සිදුවීමට ඉඩ තිබේ. ඔවුන්ට පරිහරණය කිරිමට ඇති නීති තොරතුරු මූලාශ්‍ර දුලභ වේ. සංරක්ෂණය නො කිරීම නිසා පොත් දිරා යාම, භාවිතයට නුසුදුසු තත්වයට පත් වීම, බැහැර ගෙන යාමට නො දීම, පොත් කැඩී යාම හා ඡායා පිටපත් ගැනීමට නො හැකි වීම සිදු වේ. ඇතැම් විට පුස්තකාලයේ

තිබිය හැක්කේ එක් පිටපතක් පමණක් විය හැකිය. එම මූලාශ්‍රය වෙනත් පුස්තකාලයක නො තිබීමට ද බොහෝ විට ඉඩ තිබේ. එවැනි ඉතා වටිනා මිල කළ නො හැකි මූලාශ්‍ර අනිවාර්යෙන් ම සංරක්ෂණය කළ යුතුවේ. නමුත් එකී නීති පුස්තකාලවල සංරක්ෂණ ක්‍රම භාවිත නො කිරිම පුස්තකාලයට මෙන් ම පාඨකයන්ට ද අභියෝගයක් වේ.

නීති තොරතුරු මූලාශ්‍ර නිතර ම සංශෝධනවලට ලක් නො වීම හේතුවෙන් පැරණි සංස්කරණ ඉවත් කිරීමට නො හැකි වීම ද පුස්තකාල ගැටලුවලට මූලික හේතුවක් වී ඇත. පැරණි පොත්වල ඇති කෘමි උවදුරු, දිලීර ආදිය අනෙකුත් පොත්වලට පැතිරී යාම ද මෙ මඟින් සිදු වේ. පුස්තකාල පොත් අපහරණය සඳහා අපහරණ ප්‍රතිපත්තියක් සකස් කළ යුතු ය. පුස්තකාලයේ පවත්නා පොත් පමණක් නොව අනෙකුත් ලේඛන ද අපහරණය කළ හැකිය.

නීති පොත් මෙන් ම සඟරා ද මිලෙන් අධිකය. පුස්තකාලය සඳහා වෙන් කරන ප්‍රතිපාදනවලින් මිලදී ගත හැක්කේ එක් ප්‍රකාශනයක් පමණි. එක් පාඨකයෙකු එම පිටපත රැගෙන ගිය විට තවත් පාඨක විශාල සංඛ්‍යාවකට අසාධාරණයක් සිදු වේ. ඇතැම් විට එම පිටපත උසාවිය සඳහා අවශ්‍ය විය හැකි ලේඛනයක් ද විය හැකිය.

නීති පුස්තකාලවල පාඨක සමීක්ෂණ ආදිය සිදු නො කිරීම ද විශේෂත්වයකි. පුස්තකාලයට පැමිණෙන පාඨකයන් පිළිබඳ හෝ පාඨකයන් වැඩිපුර ඉල්ලන ප්‍රකාශන හෝ වැඩිපුර පුස්තකාලයෙන් බැහැර ගෙන යන ප්‍රකාශන පිළිබඳ වාර්තා තබා ගෙන නො මැත. පුස්තකාලයේ සංවර්ධනය කළ යුතු අංශ පිළිබඳ ව පාඨකයන්ගේ අදහස් පිළිබඳ විමසීම් සිදු නො වීම ද ගැටලුකාරි තත්ත්වයකි.

නීති පුස්තකාලවල පවතින මෙම ගැටලුවලට පිළියම් යොදා එම පුස්තකාල සංවර්ධනය සඳහා පියවර ගැනීම තුළින් ශ්‍රී ලංකාවේ නීති පුස්තකාලවල පවතින බොහෝ අර්බුදවලට පිළියම් ලැබෙනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


මලලසේකර, ජී. (1993) **ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂය**, එම්. ඩී. ගුණසේන, කොළඹ

ශ්‍රී ලංකාව. **අපරාධ නඩු විධාන සංග්‍රහය පනත** (1979), අංක 16, රජයේ ප්‍රකාශන කාර්යාංශය, කොළඹ.

ශ්‍රී ලංකාව. **යුක්තිය පසිඳලීමේ පනත** (1973), අංක 16, රජයේ ප්‍රකාශන කාර්යාංශය, කොළඹ

Aiyar, K. J. **Judicial dictionary**, (1995) 11th ed. The law book company, Allahabad.

Allen R. E.ed. (1990), **The concise Oxford dictionary of current English,** 8th ed, Oxford University Press, Bombay.

Hussain, M. S. M. (2000), **Complete digest of case law of Sri Lanka (1820-2000),** Vol. 1. Arafa (pvt) Ltd., Kandy

Butler, A.H. (2001), **Cooperative collection development programs in law libraries : barriers and benefits,** *Legal Reference Services Quarterly,* 20 (3), p. 13-25

Dina, Y. (2002), Law **libraries in Bahamas.** *Legal Information Management*, Winter, p. 2

Haruna, I.(2001) **Information needs and seeking behavior of legal practitioners and the challenges to law libraries in Lagos,** *Nigeria International information and Library review*, 33 (1), p. 69-87

**Conference of Attorney General (Asia & Pacific Region) : To commemorate one hundred years of the Institute of Attorney General Sri Lanka**, (1984)
[ ], Colombo.

**පී. එම්. අයෝමි**



පුස්තකාල හා විඥාපන විද්‍යා විශේෂවේදී උපාධිය කැලණිය විශ්වවිද්‍යාලය, සමාජයීය විද්‍යාපති, කැලණිය විශ්වවිද්‍යාලය, සහකාර පුස්තකාලයාධිපති දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය.

# ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීම


සාරාංශය

අස්පර්ශනීය සංස්කෘතික උරුමය යනු පරම්පරාවෙන් පරම්පරාවට පැවත එන ස්පර්ශ කළ නො හැකි සංස්කෘතික උරුමයන් ය. වාචික සම්ප්‍රදාය, රංග කලාවන්, සමාජ සිරිත් විරිත් පුදපූජා, ජනශ්‍රැතිය, සංස්කෘතික උත්සව, දැනුම, හැකියාවන්, විශ්වාස ආදිය අස්පර්ශනීය සංස්කෘතික උරුමයට අයත් වේ. අස්පර්ශනීය සංස්කෘතික උරුමය නිරන්තරයෙන් ම ප්‍රතිනිර්මාණය වන නිසා එහි සමහර අංගයන් සමාජයෙන් ඉවත්වීමේ අවදානමට ලක්වී ඇත. එබැවින් මෙම උරුමය ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව මතු වී ඇත. මෙම අරමුණ ජාත්‍යන්තර වශයෙන් ඉටුකර ගැනීම සඳහා යුනෙස්කෝ සංවිධානය විශාල කාර්යභාරයක් ඉටුකරයි. 2003 වර්ෂයේ දී යුනෙස්කෝ සංවිධානය අස්පර්ශනීය සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීමට අදාළ සම්මුතියක් ඇතිකර ගන්නා ලදී. මෙම සම්මුතිය සමග ලෝකයේ විවිධ රටවලට අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් ආරක්ෂා

**කිරීම සඳහා පරිපාලන ම ය, නීති ම ය හා මූල්‍ය ම ය රාමුවක් ඇතිකර ගැනීමට හැකි විය.**

**අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීම සඳහා වන අන්තර් රාජ්‍ය කමිටුවක් යුනෙස්කෝ සංවිධානය තුළ ක්‍රියාත්මක වේ. මෙම කමිටුව රටවල් ගණනාවක සාමාජිකයන්ගෙන් සමන්විත වේ. අස්පර්ශනීය සංස්කෘතික උරුමය හඳුනා ගැනීම හා ලේඛනගත කිරීම සම්මුතියට අයත් සාමාජික රටවල වගකීමකි. සාමාජික රටවල් තම රට තුළ ඇති අස්පර්ශනීය සංස්කෘතික උරුමයට අයත් අංග හඳුනා ගෙන ඒ පිළිබඳ ලේඛන සකස් කළ යුතු ය. ශ්‍රී ලංකාව ද අස්පර්ශනීය සංස්කෘතික උරුමය අතින් සාරවත් රටකි. මෙරට තුළ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීමෙහි ලා මූලිකව කටයුතු කරනුයේ සංස්කෘතික අමාත්‍යාංශය, ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය යන ආයතනයන් ය.**

***මූලික පදඃ සංස්කෘතිය , අස්පර්ශනීය සංස්කෘතික උරුමය , ජනශ්‍රැතිය , දේශීය දැනුම***

**හැඳින්වීම**

අස්පර්ශනීය සංස්කෘතික උරුමය යනු අප ගේ මුතුන් මිත්තන්ගෙන් දීර්ඝ කාලයක් තිස්සේ උරුම වී පැවතගෙන ආ ස්පර්ශ කළ නො හැකි සංස්කෘතික සම්ප්‍රදායයන්ය. අස්පර්ශනීය සංස්කෘතික උරුමයට (Intangible Cultural Heritage) වාචික සම්ප්‍රදාය, රංග කලාවන්, සමාජ සිරිත් විරිත්, පුද පූජා, ජනශ්‍රැතිය, සංස්කෘතික උත්සව, දැනුම, හැකියාවන් විශ්වාස සාම්ප්‍රදායික ශිල්ප ආදිය අයත් වේ. මෙම අංග ස්පර්ශ කළ නො හැකි වුව ද ඒවා අපේ සංස්කෘතික උරුමයේ වැදගත් අංගයකි. අස්පර්ශනීය සංස්කෘතික උරුමය සෑම රට ක ම පවතින අතර ඒවා ඒ ඒ රටවලට අනන්‍ය වේ. මෙම උරුමය නවීකරණයත් සමඟ වෙනස්වීම්වලට භාජනය වන අතර මෙය ජනතාව අතරම පවතිමින් ජනතාව විසින් ම ඉදිරියට ගෙන යනු ලබයි. අස්පර්ශනීය සංස්කෘතික උරුමය බොහෝ විට පරිසරය හා බැඳී පවතී. මෙය සාමුහිකත්වය හා බැඳී පවතින බැවින්

ප්‍රජාව අතර අන්‍යෝන්‍ය අවබෝධය හා සමාජ ඒකාබද්ධතාව වර්ධනය කිරීමට ද ඉවහල් වේ. වෙනත් සංස්කෘතීන්වල අස්පර්ශනීය උරුමයන් ඉගෙන ගැනීම තුළින් අන්තර් සංස්කෘතික සබැඳියාවේ වර්ධනයක් සිදු වේ. එබැවින් අස්පර්ශනීය සංස්කෘතික උරුමය සංරක්ෂණය සමාජ යහපැවැත්ම සඳහා අතිශයින් වැදගත් වේ.

අස්පර්ශනීය සංස්කෘතික උරුමය නිරන්තරයෙන් ම ප්‍රතිනිර්මාණය වන නිසාත් එය පරම්පරාවෙන් පරම්පරාවට සංක්‍රමණය වන නිසාත්, මෙහි සමහර අංගයන් සමාජයෙන් ඉවත් වී යාමේ අවදානමකට ලක් වී ඇත. අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව මතු වී තිබෙන්නේ මේ නිසා ය. මෙම උරුමය ආරක්ෂා කරගත හැක්කේ ඒවා ක්‍රියාවේ යොදවන ප්‍රජාවන්ටයි. නමුත් බාහිර අංශ වලට ඒ සඳහා උදව් කළ හැකි ය. උදාහරණ වශයෙන් අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ තොරතුරු රැස්කර වාර්තාගතකර එම දැනුම ව්‍යාප්ත කිරීමටත් වීධිමත් ආකාරයෙන් අදාළ අධ්‍යාපනය ලබා දීමත් තුළින් මෙය ආරක්ෂා කර ගැනීමට පියවර ගත හැකි ය. අස්පර්ශනීය සංස්කෘතික උරුමය ආරක්ෂා කළ යුත්තේ ඒ තුළින් අපගේ අනන්‍යතාව පිළිබඳව හැඟීමක් ලබාදෙන නිසා ය. එමෙන් ම අපගේ අනාගත සංවර්ධනය සම්පූර්ණ වන්නේ අතීත උරුමයන් සමඟ එය ඒකාබද්ධ වූ විට ය. අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ සමාජීය මෙන් ම ආර්ථික වැදගත් කමක් ද තිබේ. නවීන බෙහෙත් වෙනුවට මිල අඩු පාරම්පරික වෙදකම් භාවිත කිරීම, රංගකලාවන් ප්‍රදර්ශනය කිරීමෙන් ආදායමක් ලැබීම මෙහි ඇති ආර්ථික වැදගත්කමට නිදර්ශන කිහිපයකි.

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) අධ්‍යාපනය, විද්‍යාව හා සංස්කෘතිය පිළිබඳ ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය සඳහා කැපවී ඇති ආයතනයකි. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා යුනෙස්කෝ සංවිධානය විවිධ කාර්යභාරයන් ඉටු කරයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංස්කෘතිය සම්බන්ධයෙන් වගකීම

පැවරී ඇත්තේ යුනෙස්කෝ සංවිධානයටයි. යුනෙස්කෝ සංවිධානය පසුගිය වසර හැටක පමණ කාලය තුළ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීමෙහිලා කැප වී සිටියි. 2003 වර්ෂයේ දී යුනෙස්කෝ සංවිධානය අස්පර්ශනීය සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීමට අදාළ සම්මුතියක් ද (Convention) ඇති කරන ලදී. මෙම සම්මුතිය සමඟ ලෝකයේ විවිධ රටවල අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා පරිපාලනමය, නීතිමය හා මූල්‍යමය රාමුවක් ඇතිකර ගැනීමට හැකි විය. මේ තුළින් අස්පර්ශනීය සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීමට අදාළව රටවල් අතර ජාත්‍යන්තර එකඟතාවක් ඇති විය. මෙම සම්මුතියේ ප්‍රධාන අරමුණු වන්නේ අස්පර්ශනීය සංස්කෘතික උරුමයන්ට ගරු කිරීම, ඒ පිළිබඳව අවබෝධය වර්ධනය කිරීම හා ඒ පිළිබඳ ජාත්‍යන්තර සහයෝගීතාව යන අරමුණු ආරක්ෂා කර ගැනීමයි. අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීමේ දී ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාමාර්ග ගණනාවක් මෙම සම්මුතිය මඟින් ඉදිරිපත් කර ඇත. ප්‍රජාව ගේ ද සහභාගිත්වය ඇතිව රට තුළ ඇති අස්පර්ශනීය සංස්කෘතික උරුමය හඳුනාගැනීම හා නිර්වචනය කිරීම ජාතික වශයෙන් ඉටු කළ හැකි ක්‍රියාමාර්ගයකි. රට තුළ ඇති අස්පර්ශනීය සංස්කෘතික උරුමය ලේඛනගත කිරීම හා නිශ්චිත කාල පරාසයකට අනුව යාවත්කාලීන කිරීම ඉටු කළ හැකි තවත් ක්‍රියාමාර්ගයකි. එමෙන් ම මේ පිළිබඳව දැනුවත්භාවය වර්ධනය කිරීම ද ජාතික වශයෙන් ඉටු කළ හැකි තවත් ක්‍රියාමාර්ගයකි.

අස්පර්ශනීය සංස්කෘතික උරුමය ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් සුරැකීමේ දී අදාළ සම්මුතියට අනුව සාමාජික රටවල් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කළ යුතු ය.

- අස්පර්ශනීය සංස්කෘතික උරුමය වැඩිදියුණු කිරීම සඳහා වන පිළිගැනීම හා ගෞරවය සහතික කිරීම

- මෙම උරුමය සුරැකීම සඳහා වන හැකියා වර්ධනය කිරීම (capacity building)
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය හඳුනාගැනීම හා නිර්වචනය කිරීම
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය ලේඛනගත කිරීම
- මෙම උරුමය සුරැකීමේ විශේෂිත ක්‍රියාකාරකම්වල යෙදීම හා ඒ සඳහා සහාය වීම
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ ප්‍රතිපත්ති රෙගුලාසි හා නීති රීති සම්පාදනය කිරීම
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීම සඳහා වන ආයතන පිහිටුවීම
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ තොරතුරු කළමනාකරණය කිරීමට හා ප්‍රවේශ වීම සඳහා වන ප්‍රලේඛන මධ්‍යස්ථාන පිහිටුවීම හා ශක්තිමත් කිරීම
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය හඳුනා ගැනීම, ලේඛනගත කිරීම හා ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් සඳහා උපදේශාත්මක ආයතන හෝ සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් ඇති කිරීම
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය හඳුනා ගැනීමේ දී හා නිර්වචනය කිරීමේ දී ප්‍රජාවගේ සහභාගිත්වය ලබා ගැනීම
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීම සඳහා වන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- යුනෙස්කෝ සම්මුතියේ ලැයිස්තු හා ලේඛන සඳහා අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ නාම යෝජනා සකස් කිරීම
- අදාළ ප්‍රජාවන් තුළ මෙම උරුමය සුරැකීම සඳහා වන හැකියා වර්ධනය

- රාජ්‍ය නොවන සංවිධානවල පර්යේෂකයින් හා විද්වතුන් අතර හැකියා වර්ධනය කිරීම
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීමට අදාළ පර්යේෂණ දිරි ගැන්වීම
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය කළමනාකරණය හා පුහුණු කිරීම සඳහා ආයතන පිහිටුවීම හා ශක්තිමත් කිරීම
- ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් මෙම උරුමය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම හා ඒ පිළිබඳ තොරතුරු බෙදා හැරීම

## අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ අන්තර් රාජ්‍ය කමිටුව

මෙම සම්මුතියට එකඟ වී ඇති සියලුම රටවල් වසර දෙකකට වරක් පවත්වන මහා සභා රැස්වීමේ දී හමුවේ. මෙම සම්මුතියට එකඟ වී ඇති රටවල් කිහිපයක නියෝජිතයින්ගෙන් සමන්විත අන්තර් රාජ්‍ය කමිටුවක් දනට පත්කරගෙන ඇති අතර එම කමිටුව වාර්ෂික ව රැස් වේ. එසේ රැස්වීමේ ප්‍රධාන අරමුණු වන්නේ සම්මුතියේ අරමුණු ප්‍රවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා සමාලෝචනය කිරීමයි.

අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීම සඳහා වන අන්තර් රාජ්‍ය කමිටුවක් (Intergovernmental committee) යුනෙස්කෝ සංවිධානය තුළ පිහිටුවා ඇත. මෙම කමිටුව රටවල් ගණනාවක සාමාජිකයින්ගෙන් සමන්විත වේ. මෙම කමිටුව සඳහා සාමාජිකයින් තෝරාගනු ලබන්නේ භූගෝලීය වශයෙන් නියෝජනයක් ඇතිවන ආකාරයටයි. කමිටුවට පත්වන නියෝජිතයින් අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ අවබෝධයක් ඇති අය විය යුතු ය. මෙම කමිටුවට පැවරෙන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- යුනෙස්කෝ සම්මුතියේ අරමුණු ප්‍රවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම දිරි ගැන්වීම
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීම සඳහා වන ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම හා මාර්ගෝපදේශ ලබාදීම
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ අරමුදලේ සම්පත් භාවිත කිරීම පිළිබඳ දළ සැලැස්මක් සකස් කර මහ සමුළුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම
- සම්මුතිය ක්‍රියාත්මක කිරීමට අදාළ මෙහෙයුම් මාර්ගෝපදේශ (Operational Directives) සකස් කර මහ සමුළුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම
- සාමාජික රටවල් විසින් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීම හා සමුළුව සඳහා එම වාර්තා සාරාංශගත කිරීම
- සාමාජික රටවල් විසින් ඉදිරිපත් කරන ඉල්ලීම් පරීක්ෂා කිරීම

## අස්පර්ශනීය සංස්කෘතික උරුමය ලේඛනගත කිරීම

අස්පර්ශනීය සංස්කෘතික උරුමය හඳුනා ගැනීම හා ලේඛනගත කිරීම සම්මුතියට අයත් සාමාජික රටවල වගකීමකි. සාමාජික රටවල් තම රට තුළ ඇති අස්පර්ශනීය සංස්කෘතික උරුමයට අයත් අංග හඳුනා ගෙන ඒ පිළිබඳ ලේඛන (Inventory) සකස් කළ යුතු ය. මෙසේ සකස් කරනු ලබන ලේඛන කාලානුරූපව යාවත්කාලීන කිරීම කළ යුතු ය. අස්පර්ශනීය සංස්කෘතික උරුමය ලේඛනගත කිරීමේ අරමුණ මෙම උරුමය සුරැකීමයි. ලේඛනගත කිරීම තුළින් මේ පිළිබඳ දැනුවත්භාවයක් ඇති වේ. ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය සහභාගීත්ව ක්‍රියාවලියක් විය යුතු ය. විශේෂයෙන් ප්‍රජා සහභාගිත්වය වැදගත් වන අතර අනෙකුත් අදාළ පාර්ශවයන්ගේ ද සහභාගිත්වය ලබා ගත යුතු ය. යුනෙස්කෝ සම්මුතියට අනුව රට තුළ ලේඛන කිහිපයක් සකස් කළ හැකි ය. ඒ අනුව රටේ විවිධ පළාත් සඳහා ලේඛන සකස් කළ හැකිය. අස්පර්ශනීය

සංස්කෘතික උරුමය ලේඛනගත කිරීමේ ව්‍යාපෘතියක දී ඊට අයත් වන කාර්යයන් ගණනාවක් ඇත. ඒවා පහත සඳහන් පරිදි වේ.

- අස්පර්ශනීය සංස්කෘතික අංග හඳුනාගැනීම හා අදාළ පාර්ශවයන් හා රාජ්‍ය නො වන සංවිධාන ඇතුළු අනෙකුත් පාර්ශවයන් දැනුවත් කිරීම හා සම්බන්ධ කර ගැනීම
- පාර්ශවකරුවන් අතර උපදේශාත්මක යාන්ත්‍රණයක් ඇති කිරීම හා විශ්වාසය ගොඩනැගීම
- ලේඛනවල පරමාර්ථ හා සීමාවන් තීරණය කිරීම
- ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා වන සම්පත් සොයා ගැනීම
- තොරතුරු රැස් කිරීම හා සංවිධානය කිරීමේ කටයුතු සැලසුම් කිරීම
- තොරතුරු බෙදා හැරීම, ප්‍රවේශ වීම හා යාවත්කාලීන කිරීමේ කටයුතු සැලසුම් කිරීම

## ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය

ශ්‍රී ලංකාව අස්පර්ශනීය සංස්කෘතික උරුමය අතින් සාරවත් රටකි. ශ්‍රී ලාංකීය සමාජයේ ඇදහිලි, විශ්වාස, පුද පූජා, සිරිත් විරිත් ශාන්ති කර්ම, යන්ත්‍ර මන්ත්‍ර, ජන කවි, ජන ගී, ජන කතා, ජන නාට්‍ය, ආගමික පුද පූජාවන්, වන්දනා, පෙරහැර යනාදී සංස්කෘතික අංග අතිවිශාල ප්‍රමාණයක් පවතින අතර මේ සියල්ල අස්පර්ශනීය සංස්කෘතික උරුමයට අයත් වේ. සිංහල අලුත් අවුරුද්ද හා බැඳුණු සිරිත් විරිත් හා චාරිත්‍ර රාශියක් ඇත. එමෙන් ම ශාරීරික හා මානසික රෝග සුව කිරීමට අදාළ වූ තොවිල්, සෙත් කවි, දෙහි කැපීම්, නූල් බැඳීම්, යන්ත්‍ර දැමීම් ආදී ශාන්ති කර්ම ඇත. එමෙන් ම සොකරි නාඩගම් වැනි ජන

නාට්‍යවලට සම්බන්ධ අංග නෙළුම් කවි, පැල් කවි, ගොයම් කවි වැනි ජන කවි ද අස්පර්ශනීය උරුමයට අයත් වේ.

විවිධ සංස්කෘතික උත්සවවලට අයත් සිරිත් විරිත් ද ආගමික උත්සවවලට අයත් පුද පූජාවන් ද අස්පර්ශනීය සංස්කෘතික උරුමයට අයත් වේ. සිංහල අලුත් අවුරුද්ද සෑම වර්ෂය ක ම අප්‍රේල් මාසයේ යෙදෙන අතර එම කාලය සෞභාග්‍යයෙන් හා ප්‍රීතියෙන් පිරුණු කාල පරිච්ඡේදයකි. සිංහල අලුත් අවුරුද්ද හා බැඳුණු සිරිත් විරිත් හා චාරිත්‍ර රාශියක් ඇත. හින්දු ජනතාව ද සිංහල අවුරුද්ද සමරති. නෑදෑයින් මිතුරන් බැලීමට යාම, පන්සල් යාම, ගනු දෙනු කිරීම, හිසතෙල් ගෑම, එකම වේලාවක ආහාර පිසීම, ආහාර අනුභව කිරීම, සිංහල අවුරුද්ද හා බැඳුණු සිරිත් වේ.

වෙසක් උත්සවය හා බැඳුණු පුද පූජාවන් රාශියක් ඇත. වෙසක් කූඩු හා තොරණ සෑදීම, දන්සැල් පැවැත්වීම, සිල් ගැනීම වෙසක් උත්සවය හා බැඳුණු ආගමික ක්‍රියාකාරකම් කිහිපයකි. පොසොන් උත්සවය ද බෞද්ධයින්ගේ තවත් ආගමික උත්සවයකි. පොසොන් පෝය දිනයේ ද බොහෝ බෞද්ධයෝ දන්සැල් පවත්වති. එමෙන් ම අනුරාධපුරයේ වන්දනාවේ යති.

වප් මඟුල යනු කුඹුරු සී සෑමෙන් පසු වී වැපිරීමේ කාර්යය හා සම්බන්ධ උත්සවයකි. මෙය රාජ්‍ය උත්සවයක් වශයෙන් ද පවත්වනු ලැබේ. හේන් වගාව හා සම්බන්ධ සිරිත් විරිත් රාශියක් ඇත. කෘමීන් පළවා හැරීම සඳහා වන කෙම් ක්‍රම අස්වැන්න නෙළීම හා සම්බන්ධ සිරිත් විරිත් මේ අතර ප්‍රධාන වේ.

වැඩිවිය පැමිණීම හා සම්බන්ධ වූ කොටහලු මංගල්‍යය ද සිංහල සමාජයේ පවතින තවත් චාරිත්‍රයකි. වැඩිවිය පැමිණීම ගැහැණු දරුවකුගේ ජීවිතයේ වැදගත් ම අවස්ථාවක් ලෙස සිංහල සමාජය සලකයි. විවාහය හා සම්බන්ධ සිරිත් විරිත් ද

රාශියක් ඇත. පෝරුවේ සිටවීම, අෂ්ඨක කීම, තැලිපිලි පැළඳීම, මුදු මාරු කිරීම විවාහය හා සම්බන්ධ චාරිත්‍ර කිහිපයකි.

ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීම සඳහා මූලිකව කටයුතු කරන්නේ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයයි. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ද මෙහි දී දායක වේ. මෙම ව්‍යාපෘතිය යටතේ කාර්යයන් ගණනාවක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ක්‍රියාත්මක කරයි.

ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ මූලික තොරතුරු මෙහි ඇතුළත් වේ. එමෙන් ම අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ ආසියා පැසිපික් කලාපීය මධ්‍යස්ථානය (ICHCAP) අනුග්‍රහය ඇතිව ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ පර්යේෂණ හා සමීක්ෂණ කිහිපයක් පවත්වා ඇත. මේ යටතේ ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම පිළිබඳ පර්යේෂණ වාර්තාවක් පසුගිය වසරේ සම්පාදනය කරන ලදී. මෙම වාර්තාව සම්පාදනය සඳහා අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ ආසියා පැසිපික් කලාපීය මධ්‍යස්ථානය අනුග්‍රහය දක්වන ලදී. මීට අමතරව ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ තොරතුරු එකතුවක් ද ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ස්ථාපිත කර ඇති අතර එය 2012.01.27 දින විවෘත කරන ලදී. මීට අමතර ව ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ ශ්‍රී ලාංකික ප්‍රජාව දැනුවත් කිරීමට ද කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

- අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් හා සම්බන්ධව සිටින පුද්ගලයින් (ICH Practioners) හඳුනා ගැනීම හා සුරැකීම
- අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් හා සම්බන්ධව සියලු කටයුතු සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයක් පිහිටුවීම

- අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීම සඳහා නීති රීති (Legislations) සම්පාදනය කිරීම

- අස්පර්ශනිය සංස්කෘතික උරුමය සුරැකීමට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම

- අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීමට අදාළව විදේශ ආයතනවලින් ලැබෙන ආධාර මනාව සම්බන්ධීකරණය කිරීම හා උපයෝගී කර ගැනීම

- අස්පර්ශනීය සංස්කෘතික උරුමය හඳුනා ගැනීම හා ලේඛනගත කිරීම

- අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම

- අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ පර්යේෂණ කටයුතු විශ්වවිද්‍යාල මට්ටමින් සිදු කිරීමට දිරි ගැන්වීම

- අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ කටයුතුවල යෙදී සිටින්නන් හා අදාළ ආයතනවල නිලධාරීන් සඳහා පුහුණුවීම් ලබා දීම

මෙම උරුමය රැක ගැනීමට සෑම ජන කොටසක් ම කැප විය යුතුය. අපගේ සංස්කෘතික උරුමය මඟහැර අපට ඉදිරියට යා නො හැකිය. ආසියානු රටක් වශයෙන් අප සතුව ඇති සාරවත් වූ අස්පර්ශනීය සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම අපගේ වගකීමකි.

## ආශ්‍රිත ග්‍රන්ථ


අමරසිරි, ජී. ඩී. (2013) **අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීමෙහිලා අපගේ වගකීම හා කාර්යභාරය.** ජාතික කියවීමේ මාසය 2013 සමරු කලාපය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

**Basic text to the 2003 convention for the safeguarding to the Intangible Cultural Heritage.** (2011) UNESCO

Kusumarathna, Sagara (2005) **Indigenous medicine in Sri Lanka: a sociological analysis.** Sarasavi, Nugegoda

**The field survey on the Intangible Cultural Heritage safeguarding efforts in the Asia Pacific Region.**(2001) Survey Report – Sri Lanka



## ජී. ඩී. අමරසිරි



ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය. අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

# Commercial versus Open Access: Use of E-Resources among Engineering Academics in Sri Lanka


## Abstract

Engineering Faculties in Sri Lankan Universities are somewhat adequately equipped with IT facilities and e-culture where most students and academics use the network environment for their scholarly activities. Some faculties have introduced online courses, online tutorials and online submission and evaluation of assignments. In this context the purpose of this article is to explore the information seeking behavior of the

academics of the engineering faculties in Sri Lanka towards the utilization of electronic resources for their teaching, learning and research needs. An investigation was made to identify the extent of using commercial e-resources and open-access e-resources to fulfill their information needs. The methodology occupied in this was the sample survey, where the samples were selected on a cluster basis from academics in the Engineering Faculties of the University of Ruhuna, University of Peradeniya and University of Moratuwa. A structured questionnaire was used to gather data from the sample and telephone conversations, e-mail discussions and interviews with the librarians were made in order to verify the data collected from the sample. Web pages of the selected libraries were also examined and reviewed in order to ascertain the availability of access points/links to e-resources through their homepages. The results indicate that the use of electronic resources among academics is high and engineering academics fulfill their information needs mostly through open-access e-resources than commercial e-resources because access to commercial e-resources is costly and their access facilities are complicated in the country. Academics obtain commercial e-resources mostly from personal purchasing or from other channels than from the library. Libraries have been unable to provide a satisfactory amount of e-resources due to the lack of funds. It seems that engineering academics poorly use the resources provided under programmes like INASP. The majority of engineering academics do self-searching to locate information from the internet. Yet, the use of searching mechanisms and tools has been centred upon a particular set of popular tools. The study emphasizes that libraries of Universities should encourage their patrons to use open access

**resources and should conduct programmes to develop their awareness for them.**

**Keywords**

***Commercial e-resources, open-access e-resources, information seeking behaviour, information literacy, engineering faculties of Sri Lanka***

## Introduction and background

The behavioral patterns of using e-sources among academics of universities in the modern day seem to be rather complex and diverse depending on the type of required information, nature of information seeking techniques, the availability of infrastructure facilities and the level of information literacy/skills of the user. Rapidly innovative and sophisticated information technologies have changed the nature of using information. Specially, the explosive growth of the internet, and the availability of web resources have been much more influential in the process of teaching, learning and research. The emergence of various types and modes of communication media has made education more challenging and interesting. Digital resources are comprehensively replacing the conventional print resources at the library while many libraries strive to maintain hybrid collections in both print and electronic formats. Many publishers tend to produce their

publications in both formats print and electronic simultaniously.

Electronic resources are popular among scholarly communities because of their quick accessibility, ability to multiple 'on-campus'-'off-campus' login, and the sophisticated facilities associated with them such as hypertext, multiple formats and multimedia. Electronic publications are seen in various types and formats such as CD ROM databases, DVD ROM databases, online databases, e-books, e-journals, weblogs, Wikis, and institutional e- repositories. Contents of e-databases also have shifted from bibliographic mode to full-text mode where the text, graphics, sound, and video are linked to the document online or offline.

Teaching, learning and research in the modern world become almost imperfect if they do not involve the use of e-resources influenced by the latest information of day. The internet has become the most dominant information provider today while an enormous amount of information is independently uploaded to the net every hour. The most challenging issue in this circumstance is to select and filter the relevant information in an accurate form. It is discerned that there are difficulties for students as well as staff of the faculty to select and retrieve the relevant information effectively from the net. They need the help of the library. A study conducted by Heterick Bruce (2002) in the United States reveals that 60% of academics were comfortable with electronic resources and

48% of them were very dependent on the library for their research.

Library's role also has dramatically changed due to the emergence of sophisticated methods of using information. The change of educational styles with the networked environment has provoked scholarly communities to seek for quick and instant, preferably, on-the-spot access to information. "Modern libraries have evolved from paper-based storehouses of books and journals into distributed networks of digitized information and knowledge now known as digital libraries" (Karanjkar 2010). In addition to acquiring paper-based information sources, academic libraries have to conglomerate electronic resources and facilitate users with retrieving, downloading, and accessing information quickly and easily. It is required to educate and train users to develop their information gathering skills where they are enabled to identify, select, filter, evaluate and synthesize information from the internet.

"Information is accessible from a wide variety of globally distributed commercial repositories such as electronic publishers and aggregators with access charge. However, it is also accessible from open access journals, open access archives, few websites and institutional repositories free of charge. Now libraries can enable world wide access to a never-ending supply of distributed information and knowledge in electronic form that is

constantly available, easily updated and convenient to use" (Karanjkar 2010).

Academic libraries today are using various strategies to help their clients effectively access many electronic resources for their information needs. Some of these strategies include:

a. Building digital libraries by converting print mode resources to electronic mode.

b. Purchasing access licenses to commercial databases, e- books and e- journals to the library via direct purchasing or consortia purchasing.

c. Constructing Institutional e-repositories to aggregate Digitally born knowledge resources locally by encouraging scholars/authors to self archive or deposit their knowledge products under compulsory or legal deposit policies.

d. Maintain web pages, weblogs, subject gateways, web portals or virtual libraries with creating links to open- access e-resources available online or offline.

e. Educate and train users to develop their information literacy skills in order to easily and effectively locate, filter, retrieve and synthesize information from open- access resources.

However, this should be performed in collaborative basis where librarians, IT personnel and administration work together with the consideration of information seeking behavior of users.

**Purpose**

The purpose of this study is to explore the information seeking behaviour of academics of the engineering faculties of the Sri Lankan universities toward the use of electronic resources for their teaching, learning and research needs. Here it is aimed to investigate whether the engineering academics use electronic resources and the extent of using commercial e- resources and open access e-resources to fulfill their information needs. Attempts have been made to identify what commercial e-resources they use and how they search for open-access e-resources from the library and the internet.

To achieve the above purpose following research questions were addressed.

1. Whether the academics of engineering faculties of Sri Lanka fulfill their information needs using Commercial E-resources or open access e- resources?
2. And why?
3. How can librarians support them?

## Methodology

This study occupied a sample survey using an exploratory survey method. The samples were selected on a cluster basis from academic staff members of the engineering faculties of University of Ruhuna, University of Peradeniya and University of Moratuwa. Attention was focused on engineering faculties simply because they are equipped with better IT environments compared to the other faculties and the staff and the students in them tend to use digital resources more frequently than those in others. Most engineering academics have a good knowledge of computer applications and the use of Internet as a reference tool for their professional activities. The samples were limited to three departments - Electrical Engineering, Mechanical Engineering, and Civil Engineering - to ensure the homogeneity of the sampling. These departments are commonly available in the selected universities. The Engineering Faculty of the Open University of Sri Lanka was not selected as the structure and the procedures of the instructions in that faculty are quite different from those in the other universities.

The main tool to gather data was a structured questionnaire focused on the types of e-resources, the purposes of their use, and the ways in which they are accessed. The questionnaire was posted/e-mailed directly to the respondents and telephone conversations and e-mail discussions were held with them in order to verify the data. Further, interviews were made with the librarians

of these faculties to ascertain the availability of commercial and open access e-resources through their libraries and to refine and reinforce the data gathered in that manner. Even the web pages of the selected libraries were examined and reviewed in order to ascertain the availability of access points/links to e-resources through their homepages. Finally, the data were analysed using simple methods like percentage analysis and mean analysis while graphical figures were used to visually present the findings.

**Definitions of terms:**

**E-Resources** - are the information sources available in electronic form. These resources may be published as CD ROMs, DVD ROMs, computer files, or any other digital resource accessible online or offline. E-journals, e-books, e - databases and web - blogs are some examples of e- resources. "A library web-site can function as an information gateway or an entry point to arrange online resources, with key components being the library catalogue and journal databases" (Johnson, Trabelsi and Tin 2005)

**Commercial e-resources** - are the information sources published or aggregated by a person or organization for the purposes of providing users access to the resources as an income-generating venture. Commercial publishers hold the copyright of the resources and provide access licenses through direct purchase or subscription for a period of

time. This can be "virtually any electronic product or service for which libraries spend funds" (Jewell T.D. 2001).

**Open access e-resources** - are the information sources which are available in electronic format, accessible online, free of charge and mostly free of copyright. Some e-resources require registration for licensing. "By 'open access' to this literature we mean its free availability of the public internet, permitting any user to read, download, copy, distribute, print, search or link to the full text of these articles, crawl them for indexing, pass them as data to software, or use them for any other lawful purpose, without financial, legal or technical barriers other than those inseparable from gaining access to the internet itself. The only constraint for reproduction and distribution, and the only role of copyright in this domain, should be to give authors control over the integrity of their work and the right to be properly acknowledged and cited" (Budapest Open Access Initiative, 2002).

**Use of e-resources in Sri Lanka**

The use of electronic resources has increased highly among university academics in Sri Lanka, researchers and scholars since the last decade. Most universities and academic institutions strive to develop an e-culture in their institutions by developing their infrastructure facilities as well as attitudes. Many teaching and learning modules are being converted to e-formats, and many administrative and managerial activities are being connected to an e-environment. Several Engineering Faculties have

introduced e-learning modules for undergraduates and tutorials can be accessed via the intranet. Some faculties practice online submission and evaluation of assignments in a networked environment and some conduct tests and examinations using the intranet. Some of the universities in the country have quite sufficient internet access facilities width a high band, LANs (Local Area Networks), and in some cases Wi-Fi connections to facilitate the community with a networked environment.

Many university libraries have automated their circulation, acquisition and housekeeping processes and OPACs (Online Public Access Catalogues) have been built up to facilitate the users with a bounder-less access to their holdings. Some engineering faculties have purchased access licenses to commercial e-databases related to engineering disciplines. Journal articles and other e-resources are shared among the faculties under Inter Library Loan schemes. The resources are also shared among the libraries with the help of social media such as 'Library Friends' e-mail group, and Facebook. Some faculty libraries have also joined free access programmes like INASP- PERii, SLJOL and some, have joined the programmes like consortia purchasing of commercial journals and databases.

Several university libraries have initiated Institutional Repositories (IR) so that authors and scholars of the universities can self-archive their publications on them. All the Engineering Faculties have a satisfactory

number of computer centres to accommodate the students in accessing the internet and almost all the academic staff members have been provided with a PC or Laptop computer.

As all the government universities are depending on the funds annually allocated by the government, their libraries are receiving insufficient funds to purchase access to commercially published e-resources. Therefore the librarians have to face numerous difficulties with the gradually decreasing allocations and rapidly increasing prices for books and periodicals. To face this challenge libraries have to strengthen their resource sharing and consortia programmes.

Librarians can also encourage users to seek for open access resources and make them aware of the freely available resources in their respective disciplines. Also they can empower their users in finding and using open access resources.

The University of Moratuwa has purchased limited access license for several databases such as ACM Library, Emerald, Grove Art Online, IEE Xplore, ScienceDirect and Scopus with outside funds. Articles from these databases can be shared with other libraries on request.

Covey (2003) reveals several steps that librarians should take in terms of closing the gap and removing the barriers between commercial vendors and academics, and

facilitating convenient and easy access to quality resources. Some of them are: 1. redesigning the website of the library to improve navigation; 2. endeavoring to reduce turnaround times in services; 3. empowering users with direct browsing tools and tracking mechanisms; 4. marketing the resources to target group through portals; 5. providing proxy servers or virtual private networks to intercept transactions between users and real servers to address the IP range restrictions by vendors.

**Findings**

The aim of this study was to explore the nature of using electronic resources among engineering academics of universities of Sri Lanka and to find out whether they use commercial and open access e-resources to fulfill their information needs. Proportionately, the samples from the engineering faculties of the universities of Ruhuna, Peradeniya and Moratuwa were analysed using the simple statistical methods such as percentage and mean value analysis in due circumstances. Interviews with librarians of respective faculties were made to identify the nature of subscription to e-resources, the extent of links available to open access e-resources through their web pages and the nature of awareness programmes available in their faculties. Web pages of these libraries were also examined to recognize the facilities available for users to acces e-resources. The questionnaire designed for the academics was aimed to gather data related to the types of academic activities engaged by the respondents, the places where they find information to perform their tasks, the purposes

of their information seeking, their preference mode of information sources, and the use of commercial e- resources as well as open access e-resources for their needs.

It was also examined if the respondents were satisfied with the facilities available in the library to access e-resources. Focus was also given to identifying the searching tools of respondents and whether the academics have understood the structure or organization of the categories of e-resources available on the internet. The use of e-resources provided under cooperative programmes /consortia programmes was also examined. The study attempted to identify the search engines and searching mechanisms used by engineering academics and the extent of using selected commercial e-resources and open access resources in the fields of engineering.

Information is essential for academics to perform tasks related to teaching, learning, research, writing of textbooks, and curriculum planning in their subject areas. According to this study, 100% of engineering academics engage themselves in teaching, 91% in research, and 26% in writing textbooks and curriculum designing. This means that they need a great deal of information resources related to their subject fields.

The university community is always involved in interpreting and creating new knowledge. Therefore, it is important that knowledge sources are made available for

them. This study attempted to investigate where the engineering academics locate the information they require. The results indicate that 95% of the respondents use the internet for it while 5% of them use only the library and 31% of them use personal collections. This implies that the majority of the academics use all these three channels - the library (73%), personal collection (66%), and the internet (95%) to find the information they require for their activities.

The use of information extends on various purposes: 91% of the respondents seek information for preparing teaching materials; 94% of them for their research and studies; while 17% of them for administrative purposes. The rate for recreational purposes is 20% and that for other purposes is 2%.

In relation to the preference of information sources 58% of academics prefer printed resources while 35% of respondents do e-resources. 7% of respondents had no preference and they concentrated on the context rather than the form of resources. On the other hand 50% of the academics use both printed and electronic resources depending on the availability of access. This indicates that a large number of academics still prefer print sources as they find them more comfortable with hard copies (figure1).





Figure 1 – Preference of resource formats

However, adapting to the e-culture 97% of engineering academics use e-resources. 29% of them are mostly relying on commercial e-resources while a satisfactory amount of academics (70%) seek for information from OA e- resources. This may be due to non availability of access to sufficient amount of commercial e-resources through the library. The practical trend is that the academics use both according to the level of availability of them (see figure 2).





Figure 2 – Where to find e-resources

Commercial e-resources are obtained by 29% of respondents through their personal purchasing while 23% of respondents get them through the library of the faculty and 47% of respondents find alternative ways such as personal contacts, friends groups, social media etc. This indicates that libraries have to find and develop consortia programmes, inter library loan schemes, and other resource sharing activities to cater for the users with required information. The university libraries in Sri Lanka can also launch central purchasing with the help of the UGC and provide e-access to all relevant universities.

Users should have searching abilities and skills to locate OA e-resources from the internet. Most of the librarians help users with educating them on how to find information from the net and how to identify public domain resources from the internet. According to this study 94% of academics obtain OA resources through self-searching and only 17% entertain support from the library.

The formats of e-resources might be different based on the purposes of using them and it is very important for a user to be familiar with them in order to locate the relevant OA materials. It was discovered that 94% of engineering academics search for journal articles, 64% for theses/dissertations, 64% for e-books, 55% for course materials, 20% for learning objects, 20% for data files, 8% for audio files, 8% for video files, and 29% for institutional records. These figures might be different depending on the types of the faculties, their disciplines,

their course types and the facilities available in them (table 1).

| Item type | % of users |
|---|---|
| Journal articles | 94 |
| Theses/Dissertations | 64 |
| E-books | 64 |
| Course materials | 55 |
| Learning tools | 20 |
| Data files | 20 |
| Audio files | 8 |
| video | 8 |
| Institutional records | 29 |

Table 1 – Types of OA resources seeking for by engineering academics

The librarian of the faculty should have a thorough knowledge of the processes involved in locating the relevant resources so as to support the faculty communities. They can set up resource links, subject gateways, and digital libraries and conduct awareness programmes. An investigation was made by asking respondents whether they are satisfied with the involvement of the library in their search for e-resources. The responses revealed that 80% of academics are not satisfied with the facilities available at the library, while 11% of them are satisfied. Yet 35% of the respondents had no idea about it. Their levels of satisfaction may be different depending on the capacity of the university, and

the subject coverage of the library's resource collections. For example 80% of respondents of Moratuwa University expressed that the facilities available at the library are sufficient (figure 3). These statistics imply that the librarians should take measures to increase the accessibility to e-resources and maintain a balanced collection of e-resources at the library while involving in the education of user to find free resources.





Figure 3 – Satisfaction of the support by the library

Information available in the Internet is organized under various categories with different structures and procedures. The understanding of these categories might be much helpful for users in locating and retrieving the relevant information effectively. According to this study, 41% of engineering academics access Digital Libraries constructed by various institutions, 47% access to e-databases to find their information, while 38% use institutional e-repositories to locate the information needed. The rate of using personal websites is 41% and the majority of the academics (64%) search for e-books while

20% access weblogs and 2% use 'RSS feeds' to find information but no one was found familiar with Listserv.

Wikis are the types of information sources which provide background information of a concept in a wide range. In this case, the percentage of respondents using Wikis is 47% and 29% of academics obtain their information through 'Discussion Groups' through the net.

'Subject- gateways' are a mechanism to aggregate e-resources virtually under one discipline and provide links to them on the internet. These are very important for scholars and researchers as they are often based on particular subjects. However, only 8% of engineering academics search subject gateways to locate their information. Scholars can communicate information via P2P file sharing networks and the rate for using that facility is 2% (table 2)

| | |
|---|---|
| Digital libraries | 41% |
| E-Databases | 47% |
| Institutional Repositories | 38% |
| Personal Websites | 41% |
| Discussion Groups | 29% |
| Wikis | 47% |
| Subject Gateways | 8% |
| P2P file sharing | 2% |
| Weblogs | 20% |

Table2- ~~Awareness of~~ e-information tools among academics

The above statistics imply that academics of engineering faculties are mostly depending on familiar searching tools and majority of them are not aware of various tools that can be used to vary the search and broaden the result.

INASP (International Network for the Availability of Scientific Publications) is a programme to provide access to international scholarly literature, and has been contributed by many of the librarians in Sri Lanka to provide scholarly information free of charge. This project provides access facilities to selected commercial e-resources and OA databases in order to improve the availability of information in developing countries. The majority of the university libraries have set up links with this facility. This study involves the exploration of using e-resources provided under INASP programme. According to the study 14% of respondents use this facility. Among them the database of the National Library of Sweden is used by 11% academics. Elsevier is by 47%, and Springer is used by 38% of respondents. According to these figures, resources provided through INASP are not well utilized. This may be because of lack of awareness or irrelevancy of these resources to the engineering fields.

The process of searching and retrieving of information can vary according to the type of the search engine used for navigating the internet. This study attempted to identify the search engines used by

engineering academics. Accordingly, it was found that all the respondents use Google (100%).

AltaVista' is used by 11% of them while Excite (2%) and Lycos (11%) are used by a few people (Figure 2). The results indicate that most of academics rely on popular search engines such as Google and not interested in other search engines due to lack of knowledge or unawareness of their different capacities and facilities. None of them use search engines such as HotBot, Dogpile, Metacrawler, Ixquick, Profusion, SavvySearch, Vivisimo, Mamma or any other (see figure 4).





Figure 4 – Search engines used to locate OA resources by engineering academics

Journals are very important for teachers and researchers as they communicate the newest knowledge in the field. This study examined the use of selected commercial journals in the Civil, Mechanical and Electrical engineering fields and the result shows that the use of electronic journals was very low.

An investigation was also made to measure the use of selected commercial databases and OA databases. The highest rate of respondents used 'ScienceDirect' (64%) and 'Scopus' was used by 32% of respondents. In relation to the OA databases, most academics used DOAJ and SLJO. However, the majority of them do not seem to be aware of them (see table 2).

| *Commercial* | | *Open Access* | |
|---|---|---|---|
| *Elsevier* | *47%* | *Directory of open Access* | *28%* |
| *Springer* | *38%* | *MetaPress* | *3%* |
| ScienceDirect | 64% | Official Journal of EPO | 2% |
| Scopus | 32% | Sri Lanka Journal Online | 30% |
| National Library of Sweeden | 11% | Hinary | 5% |

Table 2– Use of commercial databases and OA databases by engineering academics

The tendency among engineering academics to use OA e-resources seems to be high because of the inadequacy of the commercial e-resources purchased by the university. The study involved an effort to test the users' attitudes towards the use of OA resources. Here attention was focused on issues such as the ability to find out OA resources, relevance of OA resources to their subject

areas, accessibility and reliability of OA resources, and the facilities available at the library to locate OA e-resources. The highest opinion received in this regard was that the library is not facilitating to find open access e-resources (mean score 20.4). Some academics (20%) also believe that they have no good knowledge on finding OA resources and it is very difficult to retrieve the relevant information from OA resources. Of the respondents 19.% believe that OA resources are not reliable and most of them are not relevant to their subjects. Figure 5 presents these details.





Figure 5– Attitude of engineering academics towards the OA resources

Homepages of the respective three libraries (Ruhuna, Peradeniya, and Moratuwa) were examined in order to identify the links available to access e-resources. The homepage of the University of Ruhuna Library has setup links to electronic resources under the sub-themes of *E-journals, Databases, Current periodical contents, e-books, Newspapers, Subject gateways, CD ROMs, Online*

*Journals, Fultext Journals on CDs, and Free Online Journals*. Yet some of them were under construction and most of the free journals were not supportive to the engineering curriculum of the faculty.

The University of Peradeniya library homepage has links to 'electronic resources' under the categories of *Databases, INASP/PERii resources, free resources, other websites, and E-resources in branch libraries.* Most of these links fail to logon and the subject coverage of the linked resources were not related to the engineering curriculum.

The University of Moratuwa library homepage had links under the heading of *e-resources*. There are connections to *ACM Digital Library, Emerald, Grove Art Online, IEEE Xplore, ScienceDirect* and *Scopus*. Yet, the searches were limited to abstract and bibliographic information. Passwords are required to logon to full-text resources and therefore, access was denied. They have either obtained password protected login facility or they have not purchased the access license. According to the interviews with the librarians the Universities of Ruhuna has purchased 09 e-journals of ASCE and ACI related to engineering fields. University of Peradeniya has not purchased access license to any commercial e-resources relevant to engineering and the University of Moratuwa has purchased access license to the above mentioned e-databases. However, it provided access only to some selected e-resources.

## Conclusion

Although a considerable number of academics prefer to use printed mode information sources, there is a high tendency to use e-resources among academics of the engineering faculties of Sri Lanka. The engineering academics fulfill their information needs mostly through open access e-resources than commercial e-resources because access to commercial e-resources is much expensive in the country. The academics obtain commercial e-resources mostly from personal purchasing or from other channels than from the library as libraries have not been able to provide a satisfactory amount of e-resources due to restrictions of funds and the librarians tend to go for consortia and resource sharing programmes to face this problem. It seems that engineering academics poorly use the resources provided under programmes like INASP due to unawareness as well as irrelevancy to their needs. The librarians also attempt to encourage users to find information through open access channels by setting links on web-pages and conducting information literacy programmes to develop awareness of them. The majority of the engineering academics do self-searching to locate information from the internet, yet the use of search mechanisms and tools has been limited to a particular set of popular tools rather than seeking a variety of search facilities with different searching tools. Librarians might arrange programmes to develop their awareness on various mechanisms and their benefits. Although both commercial e-resources and OA resources are essential for

academics depending on their contents as well as the relevancy to the purpose, open access e-resources are used by academics as an alternative to commercial e-resources. The autonomy of commercial e-resources can be controlled by encouraging professionals, scholars and knowledge creators to deposit their knowledge products in OA repositories. Specially, locally-born information resources can be gathered through Institutional Repositories and combine them with each other under a common protocol of fair use. Librarians have to play a dominant role in this regard.

## References

Budapest Open Access Initiative (BOAI). (2002), **Budapest Open Access Initiative** (Frequently Asked Questions) [online] (updated September 13, 2011) Available at: http://www.earlham.edu/~peters/fos/boaifaq.htm#background [Accessed on 8 December, 2011).

Covey, T. D. (2003), **The need to improve remote access to online library resources: filling the gap between commercial vendor and academic user practice.** Melton University, Carnegie 2003. Available at http://works.bepress.com/egi/viewcontent.cgi?article=1037&context=den: [Accessed on 09 December, 2011].

Heterick, B. (2002), **Faculty attitudes toward electronic resources. Educause review** July/August. 2002. Available at http://net.educause.edulir.library/pdf/ERMO248.pdf/ [Accessed on 12 December, 2011]

Homepage of University of Moratuwa. http://www.lib.mrt.ac.lk [Accessed on 17 December, 2011]

Homepage of University of Peradeniya. http://www.lib.pdn.ac.lk[Accessed on 17 December, 2011]

Homepage of University of Ruhuna. http://www.lib.ruh.ac.lk [Accessed on 17 December, 2011]

Jewel, T. D. (2001), **Selection and presentation of commercially available electronic resources: issues and practices. Council on Library and Information Resources.** Available at http://www.clir.org/pubs/reports/pub99/contents.html Accessed on 29 November, 2011.

Johnson, K., Trabelsi, H., & Tin, T. (2005), **Library support for online learners: e-resources, e-services and human factors In: : Athabasca University. n.d.. Theory and practice of online learning** *[e-book],* Available through: Athabasca University http://cde.athabascau.ca/online book/ch14.html [Accessed on 7 December, 2011].

Karajkar, N. S. (2010), **Use of open access e-resources for management users. In: IMDR Institute of Management Development and Research.** Available at http://www.imdr.edu/Use%20of%20Open%20Access%20E%20Resources.html [accessed on 30 November, 2011]

## Ananda Karunaratna



B. Dev Special Degree with Second Class upper division in statistics from University of Colombo, and Master of Library and Information Sciences, University of Kelaniya. Librarian University of Ruhuna, Sri L anka.

## J. J. G. Arachchige



B. A special degree in Linguistics (First Class Honours), University of Kelaniya, Sri Lanka (1990) Masters in Library & Information Science (MLS), University of Colombo, Senior Assistant Librarian Faculty of Engineering, University of Ruhuna, Sri Lanka.

# කාර්යක්ෂම සේවා සම්පාදනයක් සඳහා විශ්වවිද්‍යාල පුස්තකාල එකතු සංවර්ධන ප්‍රතිපත්තියක වැදගත්කම


සාරාංශය :

විශ්වවිද්‍යාලයක මුලික අරමුණ වනුයේ ඉගෙනීම, ඉගැන්වීම සහ පර්යේෂණයයි (Learning, Teaching and Researching). අධ්‍යයන පුස්තකාලයක් ලෙස විශ්වවිද්‍යාල පුස්තකාලයක මූලික අරමුණ මව් ආයතනික අභිප්‍රාය ඉටු වන පරිදි සිය ඉලක්ක ගත පාඨක ප්‍රජාව උදෙසා කාර්යක්ෂමව කාර්යඵලදායීව සේවා සම්පාදනයයි. මෙහි දී විශ්වවිද්‍යාල පුස්තකාලයෙන් සපයනු ලබන සේවාවන්හි මූලික පදනම වනුයේ එය සතු දැනුම් මාධ්‍ය එකතුවයි. මේ අනුව ප්‍රවර්තන තොරතුරු සමාජ පරිසරය තුළ (Information Based Society) වෙනස් වන විශ්වවිද්‍යාල අරමුණු ප්‍රවණතා හා සාපේක්ෂව

**එකතුවේ ප්‍රශස්තභාවය නිර්ණයට එකතුවේ ප්‍රමාණාත්මකභාවය සහ ගුණාත්මකභාවය මූලික වේ.**

**මෙම පසුබිම මත වත්මන් විශ්වවිද්‍යාල පුස්තකාල ආශ්‍රිතව විද්‍යාමානිත මූලික ගැටලුව වනුයේ පාඨක අවශ්‍යතා සාධනයට එකතුව කොතෙක් දුරට ප්‍රමාණවත් වේ ද? සහ උපරිම උපයෝගීතාවයෙන් යෙදවීමට හැකි පරිදි එකතුව කොතෙක් දුරට ගුණාත්මකව ස්ථාපිතව පවතී ද යන්නයි. මේ අනුව පාඨක අවශ්‍යතා සාධනයට එකතුවේ ප්‍රමාණාත්මකභාවය සහ ගුණාත්මකභාවය පිළිබඳ ගැටලු සෘජුව බලපා ඇති බව පැහැදිලිය. ඒ අනුව විශ්වවිද්‍යාල පුස්තකාල එකතුව එකතු සංවර්ධන ගැටලු සහ විසඳුම් ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කාර්යක්ෂම කාර්යඵලදායී පුස්තකාල සේවා සම්පාදනයකට කාලෝචිත ප්‍රවේශයක් වනු ඇත.**

***මූලික පදඃ පුස්තකාල එකතු , පුස්තකාල එකතු සංවර්ධනය , එකතු සංවර්ධන ප්‍රතිපත්ති , විශ්වවිද්‍යාල පුස්තකාල.***

## විශ්වවිද්‍යාල පුස්තකාල එකතුව

විශ්වවිද්‍යාල පුස්තකාල එකතුව ලිඛිත, මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික, සංඛ්‍යාංක යනාදී වශයෙන් විවිධ මාධ්‍යගත වේ. මෙහි දී ඉගෙනුම, ඉගැන්වීම, පර්යේෂණය යන විශ්වවිද්‍යාල අරමුණු හා ඉලක්ක සපුරාගත හැකි පරිදි වත්මන් හා අනාගත පාඨක අවශ්‍යතා අනුගතව එකතුවේ විවිධ අංශ පිළිබඳ අවධානයෙන් සම්පත් තේරීම හා ප්‍රතිග්‍රහණය කළ යුතු වේ. එසේම මුදල් වෙන් කිරීම විවිධ පුස්තකාල මාධ්‍ය අදාළ පරිදි ගබඩාකරණය, එකතුව, නඩත්තුව, සංරක්ෂණය, පිරිසැකැසුම්කරණය, විවිධ පාඨක සේවා අංශ සම්බන්ධීකරණය පුස්තකාල ද්‍රව්‍ය ඇගයීම, අධීක්ෂණය, අපහරණය යනාදි විවිධ ක්ෂේත්‍ර පිළිබඳ අවධානයෙන් එකතුව ගොඩනැඟිය යුතු වේ. පාඨකයින්ට උපරිම උපයෝගීතාවක් ලබාගත හැකි පරිදි එකතුව ස්ථාපනය කළ යුතු වේ. මෙහි දී න්‍යායික, ප්‍රායෝගික, තාක්ෂණික කළමනාකරණ ක්‍රියාවලියක් වන එකතුව

ගොඩනැඟීම එම සාධකවල විවිධ ඌණතා මත කාර්යක්ෂම කාර්යඵලදායි පුස්තකාල සේවා සම්පාදනයකට බාධා ඇති කළ හැකිය.

මෙම පසුබිම මත විශ්වවිද්‍යාල පුස්තකාල එකතු සංවර්ධනයේ දී මූලිකව බලපාන අර්බුදකාරී අවස්ථා කිහිපයක් හඳුනා ගත හැකිය.

## 1. මූල්‍ය ප්‍රතිපාදන සීමා

විශ්වවිද්‍යාල පුස්තකාල සඳහා වෙන් කරනු ලබන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නො වීම සහ මිල උච්චාවචනය එකතු සංවර්ධනයේදී මූලිකව බලපාන ගැටලුවක් ලෙස හඳුනා ගත හැකිය. පාඨක ප්‍රජාවේ අසීමිත පුස්තකාල අවශ්‍යතා සීමිත මූල්‍ය ප්‍රතිපාදන මත විසඳීමට සිදුවීම මෙයට හේතු වී තිබේ. පාඨක සංඛ්‍යාව ඉහළ යාම, දැනුම් මාධ්‍ය වෙනස් වීම, පවත්නා දැනුම නිශේධ වීම, නව දැනුම විදාරණය (Information Explosion), කළමනාකරණය, එකතුව නඩත්තු කිරීම, සංරක්ෂණ පිරිවැය ඉහළ යාම, මූල්‍ය ප්‍රතිපාදන ගැටලු ,පාඨක අවශ්‍යතා වෙනස් වීම, නව තොරතුරු මූලාශ්‍ර සඳහා ප්‍රවේශය යනාදී විවිධ හේතු මත වත්මන් හා අනාගත පාඨක අවශ්‍යතා සාධනය ගැටලු සහගත වී තිබේ.

## 2. එකතුව සඳහා ඉඩකඩ කළමනාකරණය කිරීමේ ගැටලුව

වැඩෙන සංස්ථාවක් ලෙස පුස්තකාල එකතුවේ ප්‍රමාණාත්මක වර්ධනයට සාපේක්ෂව ඉඩකඩ වෙන් කිරීමට අපහසු වීම එකතු සංවර්ධනයේ මූලික ගැටලුවකි. එකතුවේ විවිධ අංශවල ප්‍රමාණාත්මක වර්ධනයට සාපේක්ෂව ඉඩකඩ කළමනාකරණය කළ නො හැකි වීම ඵලදායී එකතුවක් ගොඩනැඟීමට බාධකයක් වී තිබේ.

### 3. කාර්ය මණ්ඩල ගැටලු

එකතු සංවර්ධන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සඳහා විවිධ අංශ නියෝජනය වන සේ විෂය දැනුමැති පුහුණු කුසලතා සහිත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටීම අනිවාර්ය සාධකයකි. මේ අනුව කාර්ය මණ්ඩලයේ පවතින විවිධ ගැටලු සහ ඌණතා එකතු සංවර්ධන ක්‍රියාවලියට සෘජුව බලපානු ඇත.

### 4. එකතුව පවත්වාගෙන යාම

එකතුව පවත්වාගෙන යාම සහ එකතුව නඩත්තුව එම ක්‍රියාදාමය තුළ පවත්නා න්‍යායික ප්‍රායෝගික, තාක්ෂණික හා කළමනාකරණ ගැටලු නිසා එකතු සංවර්ධනයේ ගැටලු ඇති වනු ඇත. එකතුවේ ඉඩකඩ ලබා ගැනීමට අනවශ්‍ය පොත්පත් අපහරණය, එකතුවේ ආරක්ෂාව සඳහා සංරක්ෂණ විධි යෙදීම පහසු පරිහරණය සඳහා එකතුව මැනවින් සංවිධානය කිරීම සිදුවිය යුතුය.

### 5. කළමනාකරණ ගැටලු

එකතු කළමනාකරණ ක්‍රියාවලිය න්‍යායික, වාස්තවික, තාක්ෂණික සහ කළමනාකරණ පක්ෂයෙන් නිවැරැදිව මෙහෙයවීම සඳහා නිසි පාලනාධිකාරියක් තිබීම අවශ්‍ය කරුණකි. මෙහි දී කළමනාකරණ ඌණතා අවිධිමත් ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්ති, එකතු සංවර්ධන ප්‍රතිපත්ති නො මැති වීම වැනි හේතු එකතු කළමනාකරණයට බලපෑම් කරනු ලැබ ඇති බව හඳුනා ගත හැකිය.

## විශ්වවිද්‍යාල පුස්තකාල එකතු සංවර්ධන ප්‍රතිපත්තිය

විශ්වවිද්‍යාල පුස්තකාල සංවර්ධනයට අදාළ උක්ත ගැටලුකාරි අවස්ථාවලින් පැහැදිලිවනුයේ ඵලදායි එකතුවක් ගොඩනැඟීම සඳහා එකතු සංවර්ධන ප්‍රතිපත්තියක අනිවාර්ය

අවශ්‍යතාවයි. මේ අනුව ප්‍රවර්තන හා අනාගත පාඨක අවශ්‍යතා හා සාපේක්ෂව පවත්නා එකතුවේ විවිධ අංශවලට අදාළ වන පරිදි පුස්තකාල ද්‍රව්‍ය ප්‍රතිග්‍රහණයේ සිට පාඨක ප්‍රයෝජනය සඳහා එකතුව පවත්වාගෙන යාම ප්‍රමිති, මූලධර්ම සහ ප්‍රතිපත්ති මත කළ යුතු වේ.

මෙසේ සමස්ත එකතු සංවර්ධන ක්‍රියාදාමය ප්‍රතිපත්තිමය මූලධර්ම මත පවත්වාගෙන යාම කාර්යක්ෂම ඵලදායි පුස්තකාල සේවා සම්පාදනයකට ඉවහල් වන කරුණකි. මේ සඳහා විශ්වවිද්‍යාල පුස්තකාල එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් ගොඩනඟා ගත යුතු වේ. එහි දී අවධානය යොමු කළ යුතු මූලික නිර්ණායක කිහිපයකි.

## 1. පුස්තකාල ද්‍රව්‍ය තේරීම (Selection of Library Materials)

ඵලදායී සේවා සම්පාදනයක් සඳහා පාඨක අවශ්‍යතා සපුරාලිය හැකි එකතුවක් තිබිය යුතුය. මෙහි දී නියත පාඨක අවශ්‍යතා හඳුනා ගැනීමත් ඒ අනුව නිවැරදිව සම්පත් තෝරා ගැනීමත් කළ යුතු වේ. ඒ අනුව ආයතනික අරමුණු හා ඉලක්ක සාධනය වන පරිදි පවත්නා හා අනාගත විෂයමාලා අවශ්‍යතා අනුව දැනුම් මාධ්‍ය තෝරාගත යුතු වේ.

විශ්වවිද්‍යාල පාඨක ප්‍රජාවේ මට්ටම හා ස්වභාවය පිළිබඳ අවධානය යොමු කිරීම ද මෙහි දී අවශ්‍ය කරුණකි. ඒ අනුව විශ්වවිද්‍යාල පාඨක ප්‍රජාව මට්ටම් කිහිපයක් යටතේ හඳුනාගත හැකිය.

i. අභ්‍යන්තර හා බාහිර උපාධි අපේක්ෂකයන්
ii. පශ්චාත් උපාධි අපේක්ෂකයන්
iii. කථිකාචාර්ය මණ්ඩලය
iv. විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවක මණ්ඩලය

උක්ත පාඨක ප්‍රජාවේ කියවීම්, විමර්ශන, ගවේෂණ, පර්යේෂණ, ස්වයං අධ්‍යයන යනාදි සියලු අවශ්‍යතා පරිපූර්ණ වන පරිදි ද්‍රව්‍ය තේරීම කළ යුතු වේ. මෙහි දී අවශ්‍ය පාඨකයාට, අවශ්‍ය ද්‍රව්‍ය, අවශ්‍ය අවස්ථාවේ, අවශ්‍ය පරිදි පරිහරණයට ඉඩකඩ ලැබෙන පරිදි ද්‍රව්‍ය තේරීමේ නියමාවලියක් පුස්තකාලය තුළ පවත්වාගත යුතු වේ.

## තේරීමේ නිර්ණායක

සම්භාරය සඳහා ද්‍රව්‍ය තේරීම ප්‍රමිති හා නිර්ණායක මත සිදු කළ යුතුය. මේ සඳහා භාවිත කළ හැකි නිර්ණායක කිහිපයකි.

### 1. අභිප්‍රාය (Scope)

අභිප්‍රාය යනු තෝරාගන්නා පුස්තකාල ද්‍රව්‍යයවල අඩංගු දැනුම හෙවත් අන්තර්ගතය කුමක්ද යන්න විමසා බැලීමයි. කුමන පාඨකයන් සඳහා කොපමණ දැනුම් පරාසයක් ඉන් ඉදිරිපත් වේ ද? එම අරමුණට අනුව පුස්තකාල ද්‍රව්‍ය තෝරා ගැනීම සිදු කළ යුතුය.

### 2. සාධිකාරිත්වය (Authority)

තෝරාගන්නා පුස්තකාල ද්‍රව්‍යවල මෙන්ම අඩංගු තොරතුරුවල විශ්වසනීයත්වය හා පිළිගැනීම තහවුරු විය යුතුය.

### 3. සංවිධානය (Organization)

තොරතුරු ඉදිරිපත් කිරීම හා සංවිධානය මැනවින් සිදුවී තිබිය යුතුය.

### 4. නිමාව (Finishing)

ඉදිරිපත් කරන තොරතුරුවල අවසන් ප්‍රතිඵලය ඉතා උසස් නිමාවකින් යුක්ත විය යුතුය.

## 5. මිල (Price)

මිල දී ගන්නා පිටපත් ප්‍රමාණය, කෘතියේ වැදගත්කම, අවශ්‍යතාව ආදී කරුණු අනුව තීරණය කළ හැකිය.

## රංගනාදන් ගේ පංචවිධ මූලධර්ම

එකතු සංවර්ධනය පිළිබඳ විවිධ පුද්ගලයන් සහ ආයතන මඟින් දක්වා ඇති අර්ථකථන අතර එස්.ආර්. රංගනාදන්ගේ පොත් තේරීම් මූලධර්ම ඉතා වැදගත්ය.

**i. පොත් භාවිතය සඳහාය**
**(Books are for use)**

**ii. සෑම පාඨකයෙකුට ම පොතක්**
**(Every reader his book)**

**iii. සෑම පොතක් සඳහා ම පාඨකයෙක්**
**(Every book its reader)**

**iv. පාඨකයාගේ කාලය ආරක්ෂා කළ යුතුයි**
**(Save the time of the reader)**

**v. පුස්තකාලය වැඩෙන සංස්ථාවකි**
**(Library is a growing organism)**

(Ranganathan, 1931)

රංගනාදන්ගේ මූලධර්ම අනුව පාඨකයාගේ වත්මන් අනාගත ප්‍රයෝජනය අනුව පාඨක අවශ්‍යතා මත ම පොත් තේරිය යුතු වේ. එසේ ම නියත පාඨකයකුට නියත අවස්ථාවක, නියත අවශ්‍යතා සඳහා නියත පොත එකතුවේ තිබිය යුතු වේ. පාඨක අවශ්‍යතා මූලිකව පොත් තේරීමෙන් අවශ්‍ය පොත පුස්තකාලයේ තබා ගැනීමටත් අනවශ්‍ය පොත් එකතුවෙන් බැහැර කිරීමටත් අවම කාලයකින් පොත සොයා ගැනීමටත්

අවස්ථාව සැලසේ. පුස්තකාලය වැඩෙන සංස්ථාවක් බැවින් එකතුවේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වර්ධනයක් පිළිබඳ අවධානයෙන් පොත් තේරිය යුතු බව රංගනාදන්ගේ පංචවිධ මූලධර්මවලින් අවධාරණය කෙරේ.

එකතු සංවර්ධනයේ දී එකතුවේ මාධ්‍ය විවිධත්වය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම වැදගත් කරුණකි. ඒ අනුව මාධ්‍ය විවිධත්වය, ඒවායේ ස්වභාවය, ගුණාංග, ඒවා සම්බන්ධ වෙනත් මාධ්‍ය යනාදී වශයෙන් පුස්තකාල අරමුණු හා ඉලක්කගත එකතුවක් ගොඩනඟාගත යුතු වේ. නිදසුනක් ලෙස ඉලෙක්ට්‍රොනික මාධ්‍ය තේරීමේ දී ඒවායේ අදාළත්වය පරිපූර්ණත්වය, සාධිකාරිත්වය, සංරක්ෂණය, නඩත්තුව යනාදි සාධක සලකා බැලිය යුතු වේ.

## 2. ප්‍රවර්තන පුස්තකාල එකතුව

ප්‍රවර්තන එකතුව විශ්වවිද්‍යාල පුස්තකාල සඳහා සම්පත් තේරීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණකි. පවත්නා එකතුව විශ්වවිද්‍යාල අරමුණු හා ඉලක්ක මත ස්ථාවරව අඛණ්ඩව වර්ධනය කළ යුතු වේ. මෙහි දී පවතින එකතුවේ ශක්තිය හා දුර්වලතා හඳුනා ගත යුතු වේ. එකතුවට එකතු කරන මාධ්‍යවල ප්‍රමාණාත්මකභාවය සහ ගුණාත්මකභාවය එම සම්පත් උපරිම පාඨක ප්‍රයෝජනය සඳහා යෙදවීමේ දී පදනම් වන කරුණු වේ. මෙහි දී පොදුවේ විශ්වවිද්‍යාල පුස්තකාල ආශ්‍රිතව විද්‍යාමානිත ගැටලුවක් වනුයේ අත්‍යවශ්‍ය පොත්පත්වල පවතින හිඟයයි. ඇතැම් පොත් කෙදිනක හෝ පරිහරණයට ගෙන නැති බව පරිහරණ වාර්තා අනුව පැහැදිලි වේ. එම පොත් ඇතැම් විට වැඩි පිටපත් ප්‍රමාණයකින් සහ අවශ්‍ය පොත පිටපත් අඩු ප්‍රමාණයකින් රාක්කගතව ඇති බව දක්නට ඇත. මෙම තත්ත්වය එකතුවේ ඉඩකඩ කළමනාකරණය පිළිබඳ ගැටලු ඇති වීමට බලපා ඇති බව පෙනේ.

## 3. වෙනත් පුස්තකාල සම්පත්

කාර්යමණ්ඩලය, මූල්‍ය ප්‍රතිපාදන, උපකරණ වෙනත් භෞතික හා යටිතල පහසුකම් එකතු සංවර්ධනයේ දී අවධානය යොමු විය යුතු වෙනත් සාධක වේ. එකතුව සහ පාඨකයන් අතර අන්තර් ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යාමට වැදගත් වනුයේ කාර්ය මණ්ඩලයයි. මේ අනුව කාර්ය මණ්ඩලයේ සාධනීය සහ නිශේධනීය ලක්ෂණ එකතු කළමනාකරණයට සෘජුව බලපා තිබේ.

මිල ඉහළ යාම, මිල උච්චාවචනය, විදේශ විනිමය ගැටලු, පාඨක ගහණය වෙනස් වීම වැනි සාධක මූල්‍ය ප්‍රතිපාදන කළමනාකරණයට බලපානු ලැබේ.

සීමිත මුදල් ප්‍රතිපාදන මත අසීමිත පාඨක ඉල්ලීම් සංතෘප්ත කිරීම දුෂ්කර කාර්යයක් බැවින් ගුණාත්මක පරිපූර්ණ එකතුවක් ගොඩනැගීම දුෂ්කර කාර්යයක් වී තිබේ.

පුස්තකාල එකතුවට සාපේක්ෂව පුස්තකාලයේ තාක්ෂණික කළමනාකරණ හා සේවා ක්‍රියාවලිය සංවිධානය විය යුත්තකි. මෙහි දී එකතු කළමනාකරණය සාමූහික ප්‍රයත්නයක් ලෙස සංවිධානය වීය යුතු වේ. පවත්නා එකතුව ඇගයීම එකතු සංවර්ධනයේ වැදගත් අංශයකි. මෙහි දී ප්‍රමාණාත්මක හා ගුණාත්මක ශිල්ප ක්‍රම භාවිතයෙන් එකතුවේ ප්‍රබලතා හා දුබලතා හඳුනාගත හැකිය. නියමිත පාඨකයාට නියමිත පරිදි නියමිත ප්‍රමාණයෙන් අවශ්‍යතා සාධනය කළ හැකි ද යන්න මින් දැනගත හැකිය.

පුස්තකාල එකතුව විවිධ පාඨක අවශ්‍යතා, තොරතුරු බිහිවීමේ වේගය සහ පරිමාණය, මාධ්‍ය වෙනස්කම්, තේරීම් හා ප්‍රතිග්‍රහණ ගැටලු, ගබඩාකරණ හා තොරතුරු නිරාවරණ විවිධතා, මව් ආයතනයේ පරමාර්ථ හා ඉලක්ක වෙනස්වීම, තොරතුරු තාක්ෂණයේ බලපෑම යනාදී විවිධ හේතු මත

ස්ථාවරව නො පවතී. මේ අනුව එකතු සංවර්ධන වැඩපිළිවෙළ සාපේක්ෂව වෙනස් කිරීම්වලට භාජනය කළ යුතු වේ.

එකතුව සංවර්ධනය, ඉඩකඩ සීමිත වීම, පිරිවැය ඉහළ යාම, ද්විත්වකරණය, තොරතුරු යල් පැන යාම, එකතු කළමනාකරණයේ දී නිරන්තරව පැන නඟින ගැටලු වේ. මෙහි දී එකතුවේ තබා ගත යුතු දේ මොනවා ද, අපහරණය කළ යුතු දේ මොනවා ද, යන්න හඳුනාගැනීමට එකතුව විමර්ශනය කළ යුතු වේ. මේ මඟින් එකතුවට පහසු ප්‍රවේශය සැපයීම, එකතුව පාලනය, ඉඩකඩ කළමනාකරණය වැනි කටයුතු කාර්යක්ෂම කළ හැකි වේ.

විශ්වවිද්‍යාල පුස්තකාල එකතුව සඳහා සම්පත් ආදානය සහ එම ආදාන මාර්ග පිළිබඳ අවබෝධය එකතු කළමානාකරණයේ දී වැදගත් වේ. මේ අනුව වෙළඳපොළෙන් සම්පත් ලබාගත හැකි බව, මුද්‍රණයේ හෝ ප්‍රකාශනයේ ඇති නැති බව, පවත්නා සහ පැරණි දුර්ලභ සම්පත් තේරීම් මූලාශ්‍ර, ග්‍රන්ථ විද්‍යාත්මක මූලාශ්‍ර ආදිය පිළිබඳ පුළුල් අවබෝධයක් තිබිය යුතු වේ.

## එකතුව සඳහා මුදල් කළමනාකරණය

මූල්‍ය සම්පත් කළමනාකරණය එකතු කළමනාකරණයේ වැදගත් අංගයකි. සීමිත මූල්‍ය සම්පත් මඟින් අසීමිත පාඨක අවශ්‍යතා සපුරා ගැනීමට සිදුව ඇති නිසා මූල්‍ය පාලනය අනිවාර්ය අවශ්‍යතාවකි. මේ අනුව ලිඛිත එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් මත අරමුදල් වෙන් කළ යුතුය. එමඟින් මූල්‍ය සැලසුම් සහ ප්‍රමුඛතා පිළිබිඹු කිරීමත් එකිනෙකට ගැළපීමත් කළ හැකි වේ. මෙහි දී විශේෂ එකතු , පවත්නා සම්පත්, විවිධ පුස්තකාල මාධ්‍ය, මාධ්‍ය ස්වරූප, පුළුල් හා නියත විෂය ශාස්ත්‍රීය හා සාධිකාරිත්වය, භාෂාව, රට යනා දි කරුණු පදනම් කරගෙන අරමුදල් වෙන් කළ හැකි වේ.

මූල්‍ය ප්‍රතිපාදන කළමනාකරණයේ දී පහත සඳහන් සාධක පිළිබඳ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

**1. බාහිර හා අභ්‍යන්තර සාධක**

**2. පාඨක ප්‍රජාවේ ස්වභාවය හා ප්‍රමාණය**

මෙහි දී බාහිර සාධක වශයෙන් විවිධ විෂයානුබද්ධ දැනුම, දැනුම ප්‍රකාශ වීමේ වේගය, විවිධත්වය, දැනුම් මාධ්‍ය, ඒවායේ මිල ප්‍රමාණය, සංස්කරණ පිරිවැය, වාරික ප්‍රකාශන, විදේශ විනිමය අනුපාත යනාදී කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.

අභ්‍යන්තර සාධක වශයෙන් පුස්තකාල එකතුවේ ප්‍රමාණාත්මකභාවය, විවිධ විෂය අංශ, භෞතිකව වර්ධනය වන අනුපාතය, පාඨක අවශ්‍යතා, අන්තර් පුස්තකාල පිරුළු, සහයෝගිතා මට්ටම් ආදිය පිළිබඳ සලකා බැලිය යුතු වේ.

එකතු සංවර්ධනයේ දී විශ්වවිද්‍යාල පාඨක ප්‍රජාවේ ස්වරූපය සහ ප්‍රමාණය සලකා බැලිය යුතු වේ. මේ නිසා විශ්වවිද්‍යාල පීඨ හා අධ්‍යයන අංශ සාමාජික සංඛ්‍යාව සහ ශිෂ්‍ය ගහණය, පර්යේෂක සංඛ්‍යාව, පර්යේෂණ ව්‍යාපෘති ප්‍රමාණය, පශ්චාත් උපාධිධාරීන් ප්‍රමාණය, බැහැර දෙන හා විමර්ශන දැනුම් මාධ්‍ය, ඡායාපිටපත්කරණ පහසුකම්, භාවිත විවිධ තොරතුරු මාධ්‍ය හා විවිධ පාඨක සේවා ආදී කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.

තොරතුරු අවශ්‍යතා හා සාපේක්ෂව ප්‍රතිපත්තිමය පදනමක් මත මුදල් වෙන් කිරීමත් මූල්‍ය සැලසුම් ඇගයීමත් පසුවිපරම් කිරීමත් අවැසි වේ. මෙහි දී සංසරණ වාර්තා, අන්තර් පුස්තකාල පිරුළු සේවා, විමර්ශන හා තොරතුරු සේවා, අංශ වාර්තා, පාඨක ඉල්ලීම් හා යෝජනා සපුරාලිය නොහැකි වූ පාඨක අවශ්‍යතා, එකතු සංවර්ධනය සහ කළමනාකරණ ස්වරූප මත පදනම් වූ විමර්ශන ක්‍රියාවලි ආදිය දියත් කළ යුතු වේ.

ප්‍රායෝගික සහ විෂය මූල නිර්ණායක, මුදල් ප්‍රතිපාදන තුළ විශ්වවිද්‍යාල අරමුණු අපේක්ෂා පිළිබිඹු වීම හා උපයෝජිත තොරතුරු මාධ්‍ය ප්‍රමාණය ඒ සඳහා වූ සාමාන්‍ය පිරිවැයට සාපේක්ෂව පාඨක ඉල්ලුමත් ප්‍රතිබිම්බනය විය යුතු ය. මේ අනුව පාඨක අවශ්‍යතා මත පදනම්ව සම්පත් ප්‍රතිග්‍රහණය සිදු වනුයේ නම් ඵලදායී සහ සමතුලිත එකතුවක් ගොඩනැගීම අපහසු නොවනු ඇත .

එකතු සංවර්ධනය වර්තමානය සහ අනාගතය උදෙසා වූ ආයෝජනයකි. එසේ ම එය වේගයෙන් අතීතයට එකතු වන්නකි. එනිසා මූල්‍ය වියදම් සාධාරණීකරණය කළ හැකි පරිදි එකතුව සංවර්ධනය විය යුතුය. මේ අනුව ප්‍රතිපාදන වෙන් කිරීම ක්‍රමිකව සිදු විය යුතුය. ප්‍රථමයෙන් එකතු සංවර්ධන වැඩසටහන්වල තත්‍ය වාර්තා පරීක්ෂා කිරීමත් දෙවනුව පූර්ව වර්ෂය පිළිබඳ විමර්ශනයත් කළ යුතුය. අවශ්‍යතා වෙළෙඳපොළෙන් ලබා ගත හැකි බව, විදේශවලින් ගෙන්වා ගැනීම, වාර සඟරා පාලන විවිධතා, අතිරික්ත පිරිවැය දැරීම පවත්නා වර්ෂයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යනාදියේ දී පැන නැඟෙන ගැටලු හඳුනා ගැනීම සහ එහි ලා විසඳුම් සෙවීම වැදගත් වේ.

පුස්තකාල අය-වැය ශීර්ෂ අධීක්ෂණය එකතු සංවර්ධනය තුළ විය යුත්තකි. මෙ මඟින් සැලසුම්ගත පරිදි නිවැරැදිව ලේඛනගත කිරීම මගින් අරමුදල් වියදම් කර ඇති ප්‍රමාණය සහ වියදම් නො වූ පිරිවැය ප්‍රමාණය තක්සේරු කර ගත හැකි වේ.

එකතු කළමනාකරණය තුළ ප්‍රකාශන කර්මාන්තය, වෙළෙඳුන්, වාර සඟරා දායක ආයතන, දුර්ලභ ග්‍රන්ථ, මිල අධික ප්‍රකාශන යනාදි බාහිර සාධක පිළිබඳ සැලකිලිමත් වීම ද අවශ්‍ය වේ. මෙ මඟින් පුස්තකාල ද්‍රව්‍ය මිල ඉහළ යාම යනාදී පාලනය කළ නොහැකි තත්ත්ව හා සාපේක්ෂව මූල්‍ය පාලනය කළ හැකි වේ. මෙ නිසා එකතුවෙන් ප්‍රශස්ත සේවා සම්පාදනයක් සඳහා එකතුවේ ප්‍රමාණාත්මකභාවය සහ ගුණාත්මකභාවය මැන බැලිය යුතු වේ. එ මඟින් විශ්වවිද්‍යාල පාඨක ප්‍රජාවේ අවශ්‍යතා

සපුරාලිය හැකි එකතුවක් ගොඩනගා ගත හැකි වේ. මේ අනුව එකතුව ඇගයිම බහුවිධ අරමුණු කිහිපයකට රාශිගත කළ හැකිය.

1. එකතුවේ සාධනීයතා නිශේධනීයතා සහ උපයෝගීතා හඳුනා ගැනීමට හැකිවීම.

2. එකතුව හා බැඳුණු නිවැරදි ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාමට හැකිවීම.

3. වැඩිවන ඉල්ලුම සාධාරණීකරණයට සහ එකතුවේ ඵලදායිත්වය වර්ධනයට උපකාරීවීම.

4. විධිමත් සම්පත් පරිහරණය සහ පුස්තකාල කාර්ය මණ්ඩලවල කාර්යක්ෂමතාව වර්ධනයට උපකාරී වීම.

5. එකතුවේ පාඨක උපයෝගීතා සාධන මට්ටම් සහ ඒ සඳහා වූ පුස්තකාල සම්පත්වල ප්‍රතිශත හඳුනා ගැනීමට හැකිවීම.

6. එකතුවේ ප්‍රමාණාත්මකභාවය සහ ගුණාත්මකභාවය තක්සේරු කිරීමට එකතුවේ අදාළ බව, වලංගු බව සහ අපහරණය කළ යුතු දේ හඳුනා ගැනීමට හැකිවීම.

එකතුව ඇගයීමේ දී පවත්නා එකතුව විශ්වවිද්‍යාල පාඨක ප්‍රජාව සහ එකතුවේ අභිප්‍රාය නිර්ණය කර ගත යුතු වේ. මෙහි දී ඇගයීම සඳහා උපයෝගි කර ගත හැකි ක්‍රමවේද දෙකකි.

**1. ප්‍රමාණාත්මක ක්‍රමවේදය**

**2. ගුණාත්මක ක්‍රමවේදය**

### ප්‍රමාණාත්මක ක්‍රමවේදය

විශ්වවිද්‍යාල පුස්තකාල එකතුවේ ප්‍රමාණාත්මකභාවය සහ එහි වර්ධනය මත පදනම්ව සම්භාරය ඇගයීම ප්‍රමාණාත්මක ක්‍රමවේදයෙන් සිදු වේ. මෙහි දී එකතුවේ ප්‍රමාණය, සංසරණ සහ විමර්ශන අංශවල සංඛ්‍යා, පාඨක විමර්ශන වාර්තා ආදිය එකතුවේ භාවිතය පිළිබඳ ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කිරීම මින් අදහස් වේ.

### ගුණාත්මක ක්‍රමවේදය

ගුණාත්මක පදනමක් මත සම්භාරය ඇගයීම මෙහි දී සිදු වේ. මෙහි දී විෂය විශේෂඥයින්ගේ අධීක්ෂණය, පුස්තකාල ද්‍රව්‍ය සඳහා වන නියත පුද්ගල ප්‍රවේශය, ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රමිති මත සම්පත් ප්‍රතිග්‍රහණය, ග්‍රන්ථ විද්‍යාත්මක මූලාශ්‍ර, විවිධ විෂය ක්ෂේත්‍ර වර්ධනය පිළිබඳ තොරතුරු යනාදී සාධක සම්බන්ධ ව විමසා බැලිය යුතුය.

මේ අනුව භාවිත කළ හැකි ගුණාත්මක ක්‍රමවේද කිහිපයකි.

1. **ලැයිස්තු ඇගයීම** : ග්‍රන්ථ විද්‍යාත්මක මූලාශ්‍ර මත පුස්තකාලය සතුව ඇති සම්පත් ප්‍රමාණය මෙහි දී මැන බැලිය හැකිය.

2. **සෘජු නිරීක්ෂණ** : පාඨකයාගේ වත්මන් නියත සහ බහුවිධ විෂය ශික්ෂණ අවශ්‍යතා සෘජු නිරීක්ෂණ ක්‍රියාදාමයක් තුළ හඳුනා ගැනීම මෙහි දී සිදු වේ.

3. **පුද්ගල මූල ප්‍රවේශය** : පාඨකයාගේ වර්තමාන සහ අනාගත අවශ්‍යතා පුද්ගල මූල ප්‍රවේශයන් මත මැන බැලීම මින් අදහස් වේ. එ මඟින් වත්මන් පාඨක අවශ්‍යතා මෙන් ම අනාගත පාඨක අවශ්‍යතා හඳුනාගෙන එකතුවේ සංවර්ධනයට කටයුතු කළ හැකි වේ.

4. **පාඨක සමීක්ෂණය** : පුස්තකාල එකතුව පාඨක අවශ්‍යතා සාධනයට වැදගත් වන ප්‍රමාණය මෙයින් මැන ගත හැකිය.

5. **එකතු සංවර්ධන ප්‍රමිති භාවිතය** : විශ්වවිද්‍යාල පද්ධතිය තුළ එකතු සංවර්ධනය පිළිබඳ මධ්‍යගත ප්‍රමිතියක් ගොඩනගා ගැනීම.

## එකතුව නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම

එකතුව නඩත්තු කිරීම විශ්වවිද්‍යාල පුස්තකාල එකතු සංවර්ධනයේ වැදගත් අංගයකි. ද්‍රව්‍ය ආදේශනය, අපහරණය, ප්‍රතිසංස්කරණය, ප්‍රතිෂ්ඨාපනය කිරීම හා සංරක්ෂණය එකතුව නඩත්තුවේ විවිධ අංශ වේ. එකතුව ඵලදායී ව ක්‍රමවත්ව තබා ගැනීමට අවශ්‍ය සම්පත් පමණක් ආදේශ කළ යුතුය. පරිහරණය කළ නො හැකි දෑ ප්‍රතිසංස්කරණය කළ යුතුය. අනාගත පැවැත්ම සඳහා සංරක්ෂණය කළ යුතුය. මෙහිදී විශ්වවිද්‍යාල අරමුණු, අභිප්‍රාය, වැඩසටහන්, පුස්තකාල ඉඩකඩ, සම්පත් විවිධතා, පාඨක ප්‍රජාව, පරිහරණ ක්‍රම යනාදී සාධක පිළිබඳ අවබෝධයෙන් නඩත්තු කටයුතු සිදු කළ යුතු වේ.

පුස්තකාල සම්පත් පරිහරණය, ප්‍රතිග්‍රහණ වර්ෂය, භාෂාව, ප්‍රකාශිත වර්ෂය, බුද්ධිමය හා කලාත්මක අන්තර්ගතය, ප්‍රමිතිගත බව යනාදී සාධක පදනම් කර ගනිමින් නඩත්තු ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතු වේ. යල් පැන ගිය පාඨක ඉල්ලුමක් නැති සංසරණයට නුසුදුසු අතිරික්ත ඇතැම් පැරණි සංස්කරණ සහිත ද්‍රව්‍ය අපහරණය සඳහා සලකා බැලිය යුතුය. මෙයින් පුස්තකාල එකතුවේ ඉඩකඩ කළමනාකරණය පහසු වනු ඇත .

පුස්තකාල එකතු සංවර්ධන ක්‍රියාවලිය පුස්තකාල සහයෝගීතා වැඩසටහන ආශ්‍රිතව විධිමත්ව සංවිධානය කිරීමේ හැකියාව තිබේ. ඒ අනුව විශ්වවිද්‍යාල පුස්තකාල පද්ධතියක්

ලෙස සාමුහිකව එකතු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගැනීම මඟින් කාර්යක්ෂම පුස්තකාල සේවා සම්පාදනයකට මඟ පාදා ගත හැකිය.

අවිචාරවත් මිල දී ගැනීම්, ඇණවුම් කිරීම් මත පුස්තකාල එකතුවේ සිදුවන අවිධිමත් වර්ධනයන් පිළිබඳ පුස්තකාලයාධිකාරිත්වය අවබෝධයෙන් සිටීම ද එකතු සංවර්ධනයේ වැදගත් පියවරකි.

## සමාලෝචනය

විශ්වවිද්‍යාල පුස්තකාල එකතු සංවර්ධනයට අදාළ උක්ත තොරතුරු සංයුක්තව ගෙන බලන විට පැහැදිලි වනුයේ පාඨක අවශ්‍යතා සාධනය වන පරිදි සම්පත් එකතුව හැසිරවීම පිළිබඳ විශ්වවිද්‍යාල පුස්තකාල ආශ්‍රිතව ගැටලු පැනනැඟී ඇති බවයි. එනම් විශ්වවිද්‍යාල පුස්තකාල සම්භාරය ප්‍රමාණාත්මකව කොතෙක් විශාල වුව ද පාඨක අවශ්‍යතා සම්පාදනයේ දී ප්‍රයෝජ්‍යතාව, උපයෝගිතාව, කාර්යක්ෂමතාව, ඵලදායීතාව සම්බන්ධව විවිධ ගැටලු මීට හේතුපාදක ව ඇති බව පෙනේ.

මේ අනුව කාර්යක්ෂම ඵලදායි පුස්තකාල සේවා සම්පාදනයක් සඳහා පුස්තකාල සම්භාර සංවර්ධනයට පොදු මධ්‍යගත ප්‍රතිපත්තියක අවශ්‍යතාව විශද වේ. එහි දී විශ්වවිද්‍යාල අරමුණු හා ඉලක්ක, පාඨක අවශ්‍යතා, මූල්‍ය හා මානව සම්පත් යනාදි සාධක නිසි පරිදි අගයමින් එකතු කළමනාකරණයේ න්‍යායික හා ප්‍රායෝගික තත්ත්ව අනුගතව ප්‍රතිපත්තිමය එකඟතාවකට පැමිණිය යුතු වේ. ඒ අනුව ලිඛිත එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් මත එකතු සංවර්ධන ක්‍රියාවලියේ මූලිකාංග වන සම්පත් තේරීම, ප්‍රතිග්‍රහණය, මූල්‍ය කළමනාකරණය, එකතුව නඩත්තුව, සංරක්ෂණය, අපහරණය එකතුව ඇගයීමට අදාළ කටයුතු ද සිදු කළ යුතු වේ. එසේ ම එකතු සංවර්ධන ප්‍රතිපත්තිය කාලීනව අඛණ්ඩව යාවත්කාලීන කළ යුතු වේ.

මෙ මඟින් අවශ්‍ය පාඨකයාට අවශ්‍ය අවස්ථාවේ දී අවශ්‍ය පරිදි පුස්තකාල සම්පත් පරිහරණයට කාර්යක්ෂම ඵලදායී එකතුවක් ගොඩනැගිය හැකිය. එය සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියේම ප්‍රශස්ත සේවා සම්පාදනයකට හේතු වනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


Bryson, J. O. (1996), **Effective library and information centre management**, Jaico, Bombay.

Clave, J. & Mary, M. eds. (1996), **Collection management in academic libraries**, Jaico Publishing, Bombey.

Mahapatra, P. K. (1999) **Collection Management in Libraries**, Ess Ess Publications, New Delhi.

Ranganathan, S. R. (1988), **The Five Laws of Library Science**, 2nd. Ed., Sarada, Bangalore.

Sharma, S. R. (1997), **Evaluation and administration in library science**, Motit, New Delhi.



## ඩබ්ලිව්. එම්. ජේ. කේ. විජේකෝන්



පුස්තකාල හා විඥාපන විද්‍යා විශේෂවේදී උපාධිය කැලණිය විශ්වවිද්‍යාලය, සමාජයීය විද්‍යාපති, කැලණිය විශ්වවිද්‍යාලය, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

# பேரிடர்களில் (பேரழிவுகளில்) இருந்து பாதுகாத்துக்கொள்ள நூலகங்களில் இருக்கவேண்டிய திட்டம் : கவனத்தில் கொள்ளப்படாத விடயம்



சுருக்கக் குறிப்பு :


நூலகம் ஒன்றின் பேணற் செயற்பாடுகளில் பேரிடர்த் திட்டமிடுதலும் ஒரு பகுதி என்பது ஏற்றுக்கொள்ளப்பட்டதொரு விடயமாக உள்ளது."பேரிடர்த் திட்டமிடல்" என்பது பேரிடர்களின் தாக்கத்தைக் குறைக்கும் அல்லது மட்டுப்படுத்தும் ஒரு தொகை ஒத்திகைச் செயற்பாடுகளேயாகும். அத்துடன் இது இயலுமான அளவு குறுகிய காலத்தினுள் நூலகத்தையும் அதன் சேகரிப்பையும் பாவனைக்குகந்த நிலைக்கு மறுசீரமைக்க உதவும். "பேரிடர் (பேரழிவு) " என்னும் பதம் சிறு நிகழ்வுகளில் இருந்து பாரிய அளவிலான அவசரகால நிலை வரை பரந்த நிகழ்வுகளை உள்ளடக்குகிறது. பேரழிவானது நூலகங்களில் அடிக்கடி நடைபெறும் ஒரு விடயமாகும்.

***மூலச் சொற்கள்: பேரிடர், பேரழிவுத்த திட்டமிடல், ஆவணப் பேணல், நூலகங்கள் நூலகப் பேரிடர்கள் பற்றிய சரித்திரம்***

**நூலகங்களுக்கு ஏற்பட்ட அழிவுகளின் சரித்திரம்**

கி.மு.3ம் நூற்றாண்டில் புகழ்பெற்ற அலெக்ஸாண்டிரிய நூலகமானது தீயினால் அழிக்கப்பட்டது. ஆய்வுகளில் இருந்து அது எரியூட்டப்பட்டுள்ளது என்பது தெரிய வந்துள்ளது. ஆச்சரியப்படும் விதத்தில் நூலக அழிவு ஒன்று 1966ம் ஆண்டு இத்தாலியில் உள்ள புளோரன்ஸ்சில் ஏற்பட்டது. ஆபெஸ்ஸாரியன் நூலகத்தை ஆர்னோ ஆறு அழித்துள்ளது. இவ் வெள்ளமானது பேரழிவு திட்டமிடல் அபிவிருத்திக்கு உத்வேகத்தைத் தந்துள்ளது. பல வெள்ளப்பெருக்குகள், தீ மற்றும் தீயிடப்பட்டமை போன்றன நடைபெற்ற நாடுகளுள் ஐக்கிய அமெரிக்கா, ரஷ்யார், சுவிற்சலாந்து போன்றன சிலவாகும். 1981 ஜுலை 1ம் திகதி யாழ் நூலகம் தீயினால் அழிக்கப்பட்டது. பேரழிவு முகாமைத்துவத்திற்கு ஒரு பெரிய பாடமாகும்.





**லோஸ் ஏஞ்சல் நூலகத்தின் பிரதான நூலகத்தை 1986ம் ஆண்டு தீ நாசமாக்கியது**

"பேணல்" அல்லது வரமுன்காத்தலுக்கு பேரழிவுத்த திட்டமொன்று மிக முக்கியமானதாகும். அழிவுக்கு எதிரான மிகச் சிறந்த பாதுகாப்பு எதுவெனில் அது நடைபெறுவதற்கான சந்தர்ப்பத்தை குறைப்பதேயாகும். அப்படிப்பட்டதொரு ஒழுங்கான பராமரிப்பு முறை பேரழிவுத் திட்டமிடலில் அவசியமாகின்றது. அதாவது நூலகக் கட்டிடங்கள் தகுந்த முறையில் கட்டப்பட்டுத், தளபாடமிடப்பட்டு ஒழுங்காக பராமரிக்கப்படுவதுடன், நூலக ஊழியர்களுக்கும் நன்கு பயிற்சி அளிக்கப்படவேண்டியது அவசியமாகின்றது. பேரழிவுக்கு தயார்படுவதானால் அதன் முதற்படியாக எழுத்து மூலமானதொரு திட்டம் ஒன்று அவசியமாகும்.

## பேரழிவுத் திட்டமொன்றை கட்டியெழுப்புதல் (உருவாக்குதல்)

பேரழிவுத் திட்டமொன்றிற்கான பிரதான விடயம் தடுத்தல் - திட்டமிடுதலின் மூலம் பேரழிவைத் தடுத்தல், ஆபத்துக்களைக் குறைத்தல், பேரழிவிற்கு முகம் கொடுக்கவும் அதை எதிர்த்துப் போரிடவும் தேவையானன விதிமுறைகளை உருவாக்குதல், உருவாக்கப்பட்டு பல தடவைகள் பயிற்சிசெய்யப்பட்ட விதிமுறைகளை நடைமுறைப்படுத்துவதன் மூலம் பேரிடருக்கு முகம் கொடுத்தல்.

பேரழிவுத் திட்டமொன்றை கட்டியெழுப்புவதற்கான வழிகாட்டிகளாக திட்டமிடுதலுக்கான பொறுப்பை ஏற்றுக் கொள்தல், முன்கூட்டியே திட்மிடுதல், பொது அறிவை உபயோகப்படுத்தல், பேரழிவுத் திட்டமிடல் பற்றி உங்களையும் ஏனையோரையும் அறிவூட்டல், உள்ளூர் நிலைமைகளுக்கேற்ற ஆலோசனைகளைப் பின்பற்றுதல், திட்டத்திற்கு அமைவாக பேரழிவிற்கு எதிராக உடனடியாக நடவடிக்கை எடுத்தல் போன்றவற்றைக் கொள்ளலாம். அந்தத் திட்டத்தை இயலுமாயின் நூலக ஊழியர்கள் எல்லோருடனும் இணைந்து உருவாக்க வேண்டும். இப்படிச் செய்வதால் மேலதிக பலனாக முழு நூலக ஊழியர்களும் பேணற் செயற்பாட்டில் அதிகளவில் ஈடுபடுவார்கள்.

## தடுப்புச் செயற்பாடு? இதன் கருத்தென்ன?

அனுமதி பெறாதவர்களின் அணுகுதல்களால் ஏற்படும் பாதிப்பை குறைத்தல், தீ, வெள்ளம், பேரழிவு ஏற்படுத்தும் அபாயத்தைக் குறைத்தல், என்பன தடுப்புச் செயற்பாடுகளாகும். கருவிகளுக்கும் சாதனங்களுக்கும் சரியான களஞ்சியப்படுத்தலை உபயோகித்தல், சாதனங்களுக்கு விசேட பாதுகாப்பு, முக்கியமான சாதனங்களில் பாதுகாப்புப் பிரதிகளை எடுத்தல், அத்துடன்

கட்டுமானங்கள் மற்றும் கண் காட்சிகள் போன்ற அசாதாரண சந்தர்ப்பங்களில் நூலகத்தினதும் நூலக சேகரிப்பினதும் பாதுகாப்பை நிச்சயப்படுத்திக் கொள்வதற்கான நடவடிக்கைகளை மேற்கொள்ளல். மின்சாரம், கூரை, யன்னல்கள், தீயணைப்புக் கருவிகள் போன்றன தொழில் விற்பன்னர்களினால் பரிசீலனை செய்யப்பட வேண்டும்.

வீட்டுப்பராமரிப்பு மற்றும் கட்டிடப் பராமரிப்பு என்பன நூலக பேரழிவைத் தடுப்பதில் முக்கிய பங்கு வகிக்கின்றன. தீப்பாதுகாப்பு வழிமுறைகளுடன் இணைந்து தீயணைப்புக் கருவிகளின் ஒழுங்கான பரிசோதனை தொடர்பாக ஊழியர்களுக்கு அறிவுறுத்துவதன் மூலம் தீ ஏற்படுவதற்கான சாத்தியத்தை குறைக்கமுடியும்.

**பொறுப்புக்கள்: 2ம் மட்டம்**

பொறுப்புக்கள் மட்டமானது பேரழிவுத் திட்டத்தை உருவாக்கி ஆவணப்படுத்துவதுடன் அதைத் தொடர்ந்து காலத்திற்கேற்றவாறு மாற்றியமைப்பதாகும்.

முதலாவது படியாக அவசர நேரங்களில் அதன் அங்கத்தவர்கள் முன்வந்து உதவக் கூடிய விதத்தில் பேரழிவுப் பொறுப்புக் குழு ஒன்றை உருவாக்கி, இவர்களுக்கு பயிற்சிகள் வழங்குவதுடன், ஆபத்து ஏற்படும் போது அவர்களுக்கு உடனடியாக அறிவித்து ஒன்று கூட்டுவதற்கான சட்டதிட்டங்களையும் உருவாக்கவேண்டும். அழிவிலிருந்து காப்பதற்கான சாதனங்களை முன்னுரிமை அடிப்படையில் இனங்கண்டு குறிப்பிடப்பட வேண்டும். தேவையான ஆவணங்கள் ஒன்று திரட்டப்பட வேண்டும். கட்டிடத்தின் தரைப்படம் மற்றும் மக்களின் முகவரியுடனும் தொலைபேசி இலக்கத்துடனும் கூடிய அவர்களின் பெயர்கள், தேவையான உபகரணங்கள் மற்றும் அவசரகால நிலையின்போது

தேவைப்படும் தோண்டிகள், மின்பிறப்பாக்கிகள், போன்ற சாதனங்களைப் பெற்றுக்கொள்வதற்காக வழங்குநர் பட்டியல், பேணல் அலுவல்களுடனான தொடர்பும், பிராந்தியத்தில் உள்ள அவசரகாலத்தில் உதவக் கூடியவர்கள் பற்றிய விபரங்களும் பேணப்பட வேண்டும். பேரழிவின் போது தேவைப்படும் உபகரணங்கள் ஒன்று திரட்டப்பட்டு பாதுகாக்கப்பட வேண்டும். உறை நிலையில்( மாறாத) (Freezer capacity) அடைவதற்கும், கொடுப்பனவு செய்வதற்கான ஒழுங்குகளும் செய்யப் பட்டிருக்க வேண்டும். பேரழிவு முகம்கொடுக்கும் திட்டமானது செவ்வை பார்க்கப்பட்டு ஒழுங்கு முறையில் திருத்தியமைக்கப்பட வேண்டும்.

**ஏதிர்த்தாக்கம் : கட்டம் 3**

கட்டம் 3 ஆனது பேராபத்து ஏற்படும் போது பின்பற்றவேண்டிய நியதிகள் தொடர்பானதாகும். ஆரம்பக் கட்டமானது அலாரத்தை அடிக்கவைத்து அலுவலர்களை ஒன்று திரட்டுவதாகும். அடுத்த கட்டமாக பேராபத்து நடந்த இடம் மனிதர்கள் பிரவேசிப்பதற்கு உகந்ததா என்பதை திட்டப் படுத்திக்கொள்ளல். ஒருதடவை பேரபாய பொறுப்புக் குழுவின் தலைவரினால் ஏற்பட்டுள்ள பாதிப்புப் பற்றிய ஆரம்ப மதிப்பீடு ஒன்று எடுக்கப்பட வேண்டும். பாதிப்பின் அளவு மற்றும் தேவைப்படும் கருவிகள் மற்றும் வழங்கல் தொடர்பாக மதிப்பீடு செய்தல் மிக முக்கியமாகும்.

பாதிப்பு மதிப்பீடு செய்யப்பட்டதும் பாதிப்புக்குள்ளான பொருட்கள் அகற்றப்பட வேண்டும். எடுத்துச் செல்வதற்காக அவற்றை பாதுகாப்பானதொரு இடத்தில் அடுக்கி வைப்பதுடன் பின்பு அவை பட்டியற்படுத்தப்படவேண்டும். அவற்றைத் திருத்தியமைப்பதற்கான இடம் ஒன்று அழிவு ஏற்பட்ட இடத்திற்கு அண்மையில் ஒழுங்கு செய்யப்படவேண்டும்.

காய வைப்பதற்கான சாதனங்கள் இருக்குமேயானால் ஈரமடைந்த சாதனங்களை காயவைக்க முடியும்.

## இயல்பான நிலைக்கு வருதல் - இறுதிக் கட்டம்

பேரழிவு நடந்த இடத்தையும், பாதிப்புக்குள்ளான சாதனங்களையும் திடமான, உபயோகப் படுத்தக்கூடிய நிலைக்கு மீளமைப்பதற்கான திட்டம் ஒன்றை உருவாக்கி அதை நடைமுறைப் படுத்திச் செல்வதே இறுதிக் கட்டமாகும். இது பாதிப்படைந்து ஆவணங்களைப் பேணிப் பாதுகாப்பதற்கான நிகழ்ச்சித் திட்டமொன்றை உருவாக்குவதையும் உள்ளடக்கும். முதலில் எந்த ஆவணங்கள் மீண்டும் உபயோகப்படுத்தத்கூடிய விதத்தில் திருத்தி அமைக்கப்பட வேண்டும் என்பதை தீர்மானிக்கவேண்டும். அத்துடன் அவற்றைத் திருத்தியமைப்பதற்கான திறமான நுட்பங்கள் என்ன? என்பதற்கு, பேணுபவர்கள் மற்றும் புதுப்பித்தமைப்பவர்களின் ஆலோசனை தேவை.


## அழிவிலிருந்து காக்கும் நுட்பங்கள்

நூலக ஆவணங்கள் நீரினால் சேதமடைந்திருந்தால் பீற்றர் உவாற்றினால் அறிமுகப்படுத்தப் பட்ட ‘‘உறைய வைத்துக் காயவைக்கும் ‘‘ நுட்பம் 1972 ஆம் ஆண்டில் இருந்து பாவனையில் உள்ளது. இந் நுட்பத்தில் ‘‘பதங்கமாதல் (sublimation) நுட்பத்தின் மூலம் நூல்களும் பேப்பர்களும் வர்த்தக ரீதியிலான உறையவைக்கும் இயந்திரங்களின் மூலம் - 21பாகை சென்றிகிறேட் அல்லது அதற்குக் குறைந்த வெப்பநிலையில் உறைய வைக்கப்படும். அவற்றைக் காயவைப்பதற்கான வளங்கள் கிடைக்கும்வரை இவற்றை நீண்ட நாட்களுக்கு இந்த உறையவைக்கும் இயந்திரங்களில் வைத்திருக்கலாம். ஊறைய வைக்கப்பட்ட

நூல்களை வெற்றிட பெட்டகம் (vacuum chamber) ஒன்றினுள் வைப்பதன் மூலம் காயவைக்கப்படும். இப்பெட்டகத்தினுள் குறைந்த அழுத்தமானது நீரின் கொதிநிலையை குறைப்பதன் மூலம் ஐஸ் கட்டிகள் உருகி நீராக மாறாமல் ஆவியாக்கப்படுகின்றது.

நீரினால் பாதிக்கப்பட்ட நூல்களிலும் ஆவணங்களிலும் பூஞ்சனம் பிடிப்பது கண்டுபிடிக்கப் பட்டுள்ளது. பூஞ்சனங்களை ஆரம்ப கட்டத்தில் அழித்து விடலாம். வெற்றிடப் பெட்டகத்தினுள் C2 (காபன்டை ஒக்சைட்) வாயுவை நிரப்பி வைப்பதன் மூலம் இது அப்பெட்டியினுள் உள்ள பூஞ்சனம் வளர்வதற்குத் தேரவயான பிராணவாயுவை இல்லாமற் செய்து அவற்றை அழித்துவிடும்.

“கம்மா” கதிர் வீச்சுக்களும் பூஞ்சணத்தை அழிக்க உபயோகப்படுத்தப்படும். தைமோல் புகையூட்டலும் சிபார்சுசெய்யப்படுகிறது.



**ஸ்ராம்போட் நூலகத்தில் உள்ள நீரினால் பாதிப்படைந்த நூல்கள் - 1976**

தீயினால் ஏற்படும் பாதிப்பு திருத்தியமைக்க முடியாததொன்றாகும். இந்த அழிவு கணக்கிட முடியாததும், அழிவடைந்த சாதனங்களை மீட்டெடுப்பதும் கடினம். தேசிய நூலகமானது சாதகமான பேரிடர் திட்டங்களை முன்வைக்க வேண்டும். அத்துடன் ஏனைய நூலகங்களுக்கு பேணல், எதிர்வினை(response), எதிர்செயற்பாடு, மற்றும் பாதிக்கப்பட்ட சாதனங்களை மீட்டெடுப்பது தொடர்பாக ஆலோசனைகளை வழங்கி மேற்பார்வை செய்ய வேண்டும்.

நெருப்பு, பூமி அதிர்ச்சி, சூறாவளி போன்றவற்றினால் ஏற்படும் பாதிப்பு திருத்தி யமைக்க முடியாதவையாகும். இந்த அழிவுகள் கணக்கிட முடியாதவையும் ,அழிவடைந்த சாதனங்களை மீட்டெடுப்பதும் கடினமாகும். தேசிய நூலகமானது சாதகமான பேரிடர் திட்டங்களை முன்வைக்கவேண்டும். அத்துடன் ஏனைய நூலகங்களுக்கு பேணல், எதிர்வினை(response), எதிர்செயற்பாடு, மற்றும் பாதிக்கப்பட்ட சாதனங்களை மீட்டெடுப்பது தொடர்பாக ஆலோசனைகளை வழங்கி மேற்பார்வை செய்ய வேண்டும்.

விசேடமாக எமது புலமைசார் பாரம்பரிய உரிமைகளை எமது எதிர்காலச் சந்ததியினருக்காக பாதுகாக்கும் நூலகங்கள் எதிர்கொள்:ளும் பேரழிவுகளுக்கு முகம் கொடுப்பதற்கு தேவையான நிதி உதவிகளை அரசாங்கம் வழங்கவேண்டும்.

**மேலதிக வாசிப்பிற்கு**


Buchanan, Sally A. (1988), **Disaster planning, preparedness and recovery for libraries and achieves – A Ramp Study with Guidelines**, UNESCO, Paris

Fortson, Judith (1991), **Disaster planning and recovery,** Neal – Schuman, New York

Bellardo, Lewis. J. (1993), **Disaster prevention, preparedness and recovery,** paper presented at the Shanghi International Symposium, China, (1993), p. 167 -189.



## கே.டீ.ஜீ. விமலரத்ன
## (K. D. G. Wimalaratne )

மொழிபெயப்ப்பு: கே. கமலாம்பிகை
பகுதி நேர விரிவுரையாளர், இலங்கை நூலக சங்கம்

# NATIONAL LIBRARY REVIEW

## Guidelines for Contributors

The Journal of National Library Review invites contributers from participating Librarians, Information Scientists, Educatore, Administrators, Publishers, Advanced Students and other interested person from all over the world to provide suitable articles from the above journal.

**Type of Contributions**

The journal includes original articles on all aspects of library information science. In adition, contributions to the section on Book Reviews, Conference reports are also welcome.

**Format**

Articles should preferably be 2000 – 4000 words in lenth. All articles must be word processed and printed double spaced throughout (including notes and references) on A4 white paper using one side only. A 1 ½ margin should be left on all sides. Authors are encouraged to submit articles using at least Microsoft word. Authors may also submit their articles on CD or as an attached file with your e-mail. The font type required is Calibri for English, FMAbhaya is for Sinhala articles and Kalaham for Tamil articles, with 12pt. The first page of the article should contain the following information:

Title of the article
Name (s) and affiliation of author (s)
Complete address, including telephone and fax numbers, and e-mail address with passport size photograph

The second page of the article should contain only the title of the article and an abstract of about 150 – 200 words. The text of the article should begin with the title, and must not contain the author's name (s). This is to ensure anonymity during the review process.

**Accuracy of Material**

It is the responsibility of the author to check the accuracy of all data, statements and references.

**Copyright**

It is a condition of publication that articles submitted for the journal have not been published, accepted for publication elsewhere. By submitting an article, the author(s) agree that copyright for the article is transferred to the publisher, if and when the article is accepted for publication.

**Style**

The style of the article should follow the ***Harvard Referencing System.***

**Tables, Figures and Illustrations**

Tables, figures and illustrations should abe provided on separate sheets, and their position noted in the text,

**Address**

Manuscripts, requests for further information and other correspondence should be sent to:

The Editor,
National Library Review
National Library and Documentation Services Board,
No. 14, Independence Avenue,
Colombo 07.
Sri Lanka

Tel. (94) – 0112698847 or 0113056388
Fax. (94) – 0112685201

Email : research@mail.natlib.lk

ISSN 2357-2973

9772357297006

200/=

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/23

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.P.R.Gamage

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..........

Date : 2017/10/23

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*